ගරු කථානායකතුමනි, අද සටන ඒකයි. ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවංක හැඟීම අනුව නම් රාජ්‍ය භාෂාවක් විය යුත්තේ වාර්තා ගත කිරීම සඳහා පාවිච්චි කරන භාෂාවයි. රාජ්‍ය භාෂාවය කියන්නේ රටක වාර්තා ගත කරන භාෂාවටයි. ඒ තත්ත්වයට නම් නැවතත් අප පරිවර්තනය වී තිබෙන බවයි පෙනෙන්නේ. අපේ වාර්තා සියල්ලක්ම පාහේ සිංහලෙන්ලු. කෙරුවාව ඉංගිරිසියෙන්, සමහරවිට දෙමළෙන්. විරුද්ධ නැහැ. එහෙත් අර මූලික ප්‍රතිපත්තිය වෙනස් කරනවාය කියා ඊට පසු එසේ කරතොත් කමක් නැහැ.

මට අද පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නට තිබෙනවා. මේ කාරණයට එය අදාළ නැතත්, එය පුත්තලම් දිස්ත්‍රික්කයට සම්බන්ධ වූවක් නිසා මටත්, ඒ වාගේම තමුන්නාන්සේටත්, සම්බන්ධයි. උප්පැන්න සහතික ගැනයි පැමිණිල්ල. සිංහල භාෂාවෙන් ලියැවිය යුතු උප්පැන්න ලියැවී තිබෙන්නේ දෙමළ භාෂාවෙනුයි. සිංහල, දෙමළ භාෂාවලින් ඉගෙන ගන්නා අයට



ඒ භාෂාවලින් පර්යේෂණ කර, ලිපි ලේඛන සකස් කර, ඒ භාෂාවලින් පාඩම් මාලා ආදියත් සකස් කර, පොත්පත් ලියා ඒවායින් දැනුම උසස් කර ගැනීමට උනන්දුව දැක්වීම පිණිස ගෙන තිබෙන ක්‍රියා මාර්ගය කුමක්ද? ඒ භාෂාවලින් පොත්පත් ලියන අයට තමතමන්ගේ දැනීම තව තවත් උසස් කර ගැනීමට උනන්දු කිරීමක් වශයෙන්, මේ උසස්වීම් දීමේදී ඇති කර තිබෙන ක්‍රියා මාර්ගය මොකක්ද? ඒ අය අපට වුවමනා කරන ඉතාමත් වැදගත් පිරිසක්. එහෙත් ඒ අයගේ ස්වභාෂා දැනුම අනුව ඒ අයට කිසියම් විශේෂ සැලකිල්ලක් ලැබෙන කිසිවක් මේ නියෝගවල සඳහන් වී නැහැ. යම් කථිකාචාර්යවරයකු මහාචාර්ය තත්ත්වයට උසස් වීමේදී හෝ මහාචාර්යවරයකු ප්‍රාචාර්ය තත්ත්වයට උසස් වීමේදී හෝ ඒ අයගේ ස්වභාෂා දැනුමට මේ නියෝගවලින් විශේෂත්වයක් දී තිබෙන්නේ කොහේද? සිංහල භාෂාව හෝ වේවා, දෙමළ භාෂාව හෝ වේවා, දන්නා අය තම තමන්ගේ දක්ෂතා අනුව කරනු ලබන පර්යේෂණවල ප්‍රතිඵල අනුව තම තත්ත්වයන් උසස් කර ගැනීමට මේ නියෝගවලින් දී තිබෙන විශේෂත්වය කුමක්ද? ඇමතිතුමා මේ කරුණ ගැන සැලකිල්ලක් නොදක්වන්නේ ඇයි? ස්වභාෂා දන්නා අයට විශේෂ සැලකිල්ලක් දක්වන්නට ඕනෑ යි ඇමතිතුමා කියනවා. එහෙත් මේ නියෝගවල එය සඳහන් වී නැහැ. ඒ නිසා ඇමතිතුමාගේ ඒ අදහස ක්‍රියාවේ යෙදෙන්නේ නැහැ. ඇමතිතුමාට පුළුවනෑ හැම එකකටම ඇඟිලි ගහන්න. මෙහි තිබෙන තත්ත්වය අනුව, යම් මහාචාර්යවරයකු උසස් වුණොත්, එක්කෝ ඇමතිතුමාට පෙත්සම් එයි, එහෙම නැත්නම් පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න අහයි. යම් අසාධාරණයක් සිදු වූ විට එය හරිගස්සන්නට ගියාමත් නොයෙක් විධියේ හිත් වේදනා යම් යම් අයට ඇති වෙනවා. මේ විධියේ ප්‍රශ්නවලට මුහුණ පාන්නට ආණ්ඩුවට සිදු වෙනවා. එම නිසා, මේ නියෝගවලින් ඇමතිතුමා බලාපොරොත්තු වන පරමාර්ථයන් ඉෂ්ට කර ගන්නට අදහස් කරනවා නම් මෙම නියෝගවල තිබෙන මේ අඩුපාඩුකම් සම්පූර්ණ නොකරන්නේ ඇයි යන ප්‍රශ්නයයි අප අහන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊළඟට විශේෂ අංශයක පත්වීම් ගැන මෙහි සඳහන් වෙනවා. එනම් ශාස්ත්‍රාචාර්ය නොවන තනතුරුයි. විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රාචාර්ය නොවන පත්වීම් දෙස අප විශේෂ ඇසකින් බැලිය යුතුයි. පාලනය කරන නිලධාරීන් හෙවත් අධිකාරීන් "වෝඩ්න්" වරුන් ගැන එදා මා කරුණු කිව්වා. අද මා පුස්තකාලය ගැන කතා කරන්නට බලාපොරොත්තු වෙනවා. පුස්තකාල පිළිබඳව නිඩ්හම් වාර්තාවේ 209 වැනි පිටුවෙහි සඳහන් වෙනවා. පුස්තකාල කාර්යාල කාර්ය සහායකයන් ගැන එහි මෙසේ දක්වා තිබෙනවා:

"Regarding the work of the Library Peons, we are in agreement with the statement made by the Librarian in his memorandum to us. It was said:

'The duties of the Peons in the Library differ from those that are generally associated with this class of officer. A peon is more or less a messenger engaged in carrying papers from officer to officer or from Department to Department. In the Library their duties are to see that all library books are shelved in the correct order in the stacks, to examine the books returned by students for any marks or other damage, to replace all books that are borrowed and returned, to help students and teachers in their search for particular books, to file all periodicals that arrive in their appropriate places in the racks, &c. After a period of service, these officers acquire a familiarity with the contents of the library that is of immense value to the rest of the library staff as much as to the users of the library.'"

පුස්තකාලවල පොත් තැන්පත් කරන සහායකයින්ට කොයිතරම් විශේෂ අංශයක් පැවරී තිබෙනවාද යන වග මෙයින් පෙනෙනවා. නිඩ්හම් මහත්මයා කියන හැටියට ඒ වැඩවල වෙනත් කාර්යාල කාර්ය සහායකයකුගේ වැඩට වඩා විශේෂයක් තිබෙනවා. ඔබතුමාට සභාය දෙමින් මෙම සභා ගර්භය තුළ සේවය කරන සභායක මහතුන් දෙස බලන විට, ඒ අයට පැවරී තිබෙන්නේ මොන විධියේ වැඩ කොටසක්ද යන්න අපට පෙනෙනවා. එහා පැත්තේ කාර්යාලයේ ඒ අතින් තිබෙන්නේ මේ සභා ගර්භය තුළ තිබෙන තත්ත්වය නොවෙයි. පුස්තකාලයේ ඊටත් වඩා වෙනස් තත්ත්වයක් තිබෙනවා. විශ්ව විද්‍යාල පුස්තකාලයක තිබෙන්නේ ඊටත් වඩා වෙනස් තත්ත්වයක්. විශ්ව විද්‍යාල පුස්තකාල සහායකයෙකුට පොත්පත් සඟරා ආදිය පිළිබඳව විශේෂ දැනුමක් වුවමනා කරනව. එම නිසා මේ උදවිය බඳවා ගැනීමේදී අපි පරීක්ෂාකාරී වුණේ නැත්නම් බලාපොරොත්තු වන කාරිය ඉෂ්ට වෙනවාද කියන එකයි ප්‍රශ්නය. නිඩ්හම් මහත්මයා කියන්නෙත් විශ්ව විද්‍යාලවල යම් යම් තනතුරු සඳහා පුද්ගලයින් බඳවා ගැනීම අමුතු තත්ත්වයක් අනුව කළයුතු බවයි. විශ්ව විද්‍යාලවලට ඇතුළත් වන ශිෂ්‍ය ශිෂ්‍යාවනට පහසුකම් සැලසීම සාර්ථක ලෙස කරන්ට ඕනෑ. ඒ වගේම මේ විශ්ව විද්‍යාල පියවලින් ජාතිය බලාපොරොත්තු වන පරමාර්ථයන් හරියාකාර සාර්ථක ලෙස ජාතියට ලබා දෙන්ට ඕනෑ. එහෙම ලබා දෙන්ට නම් මේ සෑම කාරණයක් ම අපි ඉතා පරීක්ෂාකාරීව කළ යුතුයි. නැත හොත් අසාර්ථක වෙනවාට සැකයක් නැහැ. අද වෙලා තියෙන්නෙ ඒකයි. අද මේ සියල්ලක්ම අසාර්ථක වෙලා තිබෙන්නෙ මූලික වෙනස්කම් හරියාකාර ඇති නොවුණු නිසයි.

සමහර විට මේ කාරණා සඳහන් කරන්නට කාලය ගැනීම ගැන ගරු ඇමතිතුමා අමනාප වෙන්ට පුළුවන්. එහෙත් මේ ප්‍රශ්නයේ වැදගත්කම පෙන්නුම් කර දීමයි, අපට වුවමනා කරන්නෙ. මම මේ සඳහන් කළේ අධ්‍යාපන නියෝගවල 4 වෙනි කොටසේ සඳහන් වන විශ්ව විද්‍යාලවල ශාස්ත්‍රීය නොවන තනතුරු ගැනයි. තවත් කාරණයක් තිබෙනව. නීඩ්හම් වාර්තාවේ 218 වෙනි පිටුවේ 575 වෙනි ඡේදයේ සුළු සේවකයන් සම්බන්ධයෙන් නීඩ්හම් මහත්මයා මෙහෙම කියනව:

"The Union of Minor Employees urged that any employee should be given the right to conduct his correspondence with the University Authorities in Sinhalese or Tamil and that all correspondence should be replied to in the language in which the original letter was written. We are in entire agreement with this principle and we recommend that it be established forthwith. However, we are unable to agree to recommend the payment of a Bonus (as in Government Service), for passing a proficiency test in Sinhalese."

ගරු කථානායකතුමනි, මෙතැන තිබෙන්නෙ සුළු සේවකයන් සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ආරක්ෂා කිරීමේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

තත්ත්වයයි. විශ්ව විද්‍යාලයක සේවය කරන සුළු සේවක මහත්මයෙකුගෙන් අපි ඇහුවොත් "තමුන්නාන්සේ මහාචාර්යවරයෙකුට ලියුමක් යැව්වොත් ඊට පිළිතුරු ලැබෙන්නේ මොන භාෂාවෙන් ද" කියා, ඔහු එකවරම කියයි, "ඉංග්‍රීසියෙන්" කියා. තමන් ඉල්ලීම කරන භාෂාවෙන් පිළිතුරු ලැබෙනවද? මෙවැනි පුංචි කාරණා එකතු වීමෙන් තමයි පර්වත වගේ විශාල ප්‍රශ්න ඇතිවෙලා ඇමතිතුමාට අද මුහුණ දෙන්ට සිදුවෙලා තිබෙන අන්දමේ අවුල් අශෝභන පිළිකුල් තත්ත්වයන් උද්ගත වෙන්නෙ. ඒ සියල්ලක්ම අපි වගකියයුත්තා හැටියට සිටින ගරු ඇමතිතුමාට අද මතක් කරනව. එතුමා තමයි අපේ අධ්‍යාපනයේ මහා භාරකාරයා. අපේ කුලියාපිටියේ ගරු මන්ත්‍රීතුමා තමයි, අධ්‍යාපනයේ මහා භාරකාරතුමා. එතුමා මේ ඇමති ධුරයට පත් වෙද්දී කලින් තිබුණු අඩුපාඩු සියල්ලත් එතුමාගේ කරට අරගෙනයි, ඒ තනතුරට පත් වුණේ. සෑම ප්‍රශ්නයකටම අද මුහුණ දෙන්ට සිදු වෙන්නෙ එතුමාටයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා තව කොයිතරම් වෙලා කථා කරන්න බලාපොරොත්තු වෙනවද?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

තව ස්වල්ප වෙලාවක්, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

අපි දැන් තුන් දවසක් මේ ගැන සාකච්ඡා කරල තිබෙනව.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

එසේය, ගරු කථානායකතුමනි. විශ්ව විද්‍යාල අපේ රටේ තිබෙන ඉතා උසස්ම අධ්‍යාපන පීඨයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

විශ්ව විද්‍යාලවල සෑම කටයුත්තක්ම මේ නියෝගවලට ඇතුළත් වෙලා නැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

විශ්ව විද්‍යාලයේ වැදගත්ම කොටසක් මේක. විශ්ව විද්‍යාලයක මීට වඩා උසස් දෙයක් තිබෙනවාද කියා මා තමුන්නාන්සේගෙන් දැන ගන්ට කැමතියි. මේ නියෝගවල මේ විධියට සඳහන් වී තිබෙනව:

> "විශ්ව විද්‍යාලයක මහාචාර්ය තනතුර ඇතුළුව එහෙත් ප්‍රාචාර්ය තනතුර හැර ගුරුවරයකුගේ තනතුරක් සඳහා වූ සෑම පුරප්පාඩුවක් ම මහාධිකාරී මණ්ඩලය විසින්......"

විශ්ව විද්‍යාලයක ඊට වඩා වැදගත් තවත් මොකක්ද තිබෙන්නෙ? එම නිසා කාලය ගත වුණාට කරන්නට දෙයක් නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ඒ සම්බන්ධව සෑම දෙනාම එකම දේ කියන්නට ඕනෑද?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

එකම දේ නොවෙයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

තමුන්නාන්සේ කියන දේවල් අනිත් මන්ත්‍රීතුමන්ලාත් කියා තිබෙනවා.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

මා කාලය ගැනීමේ බලාපොරොත්තුවෙන් නොවෙයි කථා කරන්නෙ. අවශ්‍යයෙන්ම කිවයුතු කාරණයක් මේක.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊළඟට, විශ්ව විද්‍යාලවල මහාචාර්යවරුන්ගේ යුතුකම් ගැනත් ඒවා කොයි තරම් දුරට සාර්ථක වී තිබෙනවාද යන්න ගැනත් සඳහන් කරන්නට තිබෙනවා. එක්දහස් නවසිය තිස් ගණන්වල සිට අපේ විශ්ව විද්‍යාලවල මහාචාර්යවරුන් කටයුතු කර තිබෙනවා. නමුත් ජාතික බලාපොරොත්තු ඉෂ්ට වී නැහැ. ඊට හේතුව කුමක්ද කියාත් අප මේ අවස්ථාවේදී සොයා බැලිය යුතුයි. අපේ මහාචාර්යවරුන් කොයි තරම් දුරට පර්යේෂණ පිළිබඳව කටයුතු කරනවාද යන්න ගැන අප ටිකක් විමසිලිමත් විය යුතුයි. මේ කාරණය ගැන මා ටිකක් සොයා බලන විට ලැබුණු වාර්තාවකින් කොටසක් උපුටා දැක්වීම ප්‍රයෝජනවත් වේවියයි මා කල්පනා කරනවා. මා දිගින් දිගට කියවන්නේ නැහැ. කාරණය ඔප්පු කිරීම පිණිස අවශ්‍ය කොටස් පමණක් කියවනවා. ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය පිළිබඳව පත් කළ කොමිෂන් සභාවක වාර්තාවක් මේක. මහාචාර්යවරුන් ගැන මේ වාර්තාවේ සඳහන් කර තිබෙනවා. මේ විධියට අපේ මහාචාර්යවරුන්ගෙනුත් බලාපොරොත්තු වන දේවල් ඉෂ්ට වන අන්දමට වැඩ කටයුතු කෙරී තිබෙනවාද නැද්ද යන කාරණයයි අප අධ්‍යාපන ඇමතිතුමාගේ මනසට යොමු කරවන්නෙ.

Report of the Commission of Inquiry, University of Oxford, Volume II, page 247.

"*Professors*

390. Appointments to statutory professorships are made by special electoral boards. Professors normally hold office until retiring age. Their duties include original work "——

ප්‍රධාන තැන "original work" නැත්නම් අළුත් නිෂ්පාදනවලට දී තිබෙනවා. එක්දහස් නවසිය තිස් ගණන්වල සිට අද වන තෙක් අපේ මහාචාර්යවරුන් අළුත් නිෂ්පාදන පිළිබඳව කොයි තරම් දුරට කටයුතු කර ත්බෙනවාද යන්න ගැන ඇමතිතුමාගේ සැලකිල්ල යොමු විය යුතුයි. ජාතිය බලාපොරොත්තුවූ අන්දමට ජාතියට ගැලපෙන නිෂ්පාදනයක් විශ්ව විද්‍යාලවලින් ලැබී නැහැ. එම නිසයි අපට මේ කාරණය ගැන ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට සිද්ධ වී තිබෙන්නෙ.

——"and the general supervision of research and advanced work in the particular subject of their chair; residence within 10 miles of Carfax for a certain part of the year; (for arts professors generally) the giving of at least 36 lectures or classes a year (of which not less than 28 must be lectures); (for science professors generally) the giving of 28 lectures or classes a year, and (in appropriate cases) responsibility for departments assigned to them."

ගරු කථානායකතුමනි, මේ රටේ විශ්ව විද්‍යාලවලින් තමුන්නාන්සේත් බලාපොරොත්තු වන්නේ විශාල නිෂ්පාදනයකුයි. අපිත් ඒකයි බලාපොරොත්තු වෙන්නෙ. ඇමතිතුමා බලාපොරොත්තු වන්නේත් ඒකයි. නමුත් ඒ විධියට නිෂ්පාදනයක් නොලැබෙන නිසයි අපට මේවා කියන්නට සිද්ධ වී තිබෙන්නෙ. තවත් කාරණයක් තිබෙනවා. [බාධා කිරීමක්] ඇමතිතුමා සිතනවා නම් එතුමාගේ කාලය ගැනීම සඳහා මා කථා කරනවාය කියා ඒක වැරදියි. මා කවදාවත් එහෙම කථා කරන කෙනෙකු නොවෙයි. නමුත් කිවයුතු දේ කියන්නට ඕනෑ.

**ගරු මොන්ටේගු ජයවික්‍රම (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමති)**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம—அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர்)*
(The Hon. Montague Jayewickreme—Minister of Public Works, Posts and Telecommunications)

දැන් දවස් දහයක් තිස්සේ මේවා ගැන කථා කළා.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

දවස් දහයක් තිස්සේ නොවෙයි අවුරුද්දක් තිස්සේ වුවත් අවශ්‍ය නම් අපට කථා කරන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

Report of the Committee appointed by the Prime Minister under the Chairmanship of Lord Robbins 1961-63.

"385. In countries such as the Netherlands, Switzerland and Sweden, which owe much of their prosperity to skills and the wise use of limited resources . . ."

අපේ අමු ද්‍රව්‍ය, මේ රටේ ස්වාභාවික සම්පත්, ජන දියුණුව සඳහා, මහජන සුභසිද්ධිය සඳහා මේ රටේ විශේෂඥයන් විසින් කොයි තරම් දුරට ප්‍රයෝජනයට ගෙන තිබෙනවාද යන්නයි ප්‍රශ්නය.

"In countries such as the Netherlands, Switzerland and Sweden, which owe much of their prosperity to skills and the wise use of limited resources, there is at least one special institution of this kind to about six or seven million of the population. On this basis we might argue that this country should have seven or eight."

ඔය විධියට තිබෙනවා. මේවා කියවනවාට තමුන්නාන්සේ තරහ වෙයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

මා තරහ වන්නේ නැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

නොයෙකුත් නිෂ්පාදනයන් සඳහා උපයෝගි කර ගන්නට පුළුවන් අමු ද්‍රව්‍ය විශෙෂයෙන් වියළි කලාපයේ කොයි තරම් තිබෙනවාද ? ජාතික සුභ සිද්ධිය සඳහා අපේ විශේෂඥයන් ඒවා පාවිච්චි කර තිබෙනවා කෝ ?

මේ මෑතකදී ගරු කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමා විශෙෂඥයන්ගේ රැස්වීමකදී වැදගත් කියමනක් කියා තිබීම ගැන මා සන්තෝෂ වෙනවා. විශේෂඥයන්ගේ නිෂ්පාදන අනුව අපේ ජීවය රඳා පවතින බව එතුමා කියා තිබෙනවා. ඒ වාගේම, විශේෂයෙන් වියළි කලාපයේ තිබෙන දේවල් ගැන පර්යේෂණ කර ඒවා මහජන සුභ සිද්ධිය සඳහා උපයෝගි කර ගැනීම උඩයි, අපේ දියුණුව රඳා පවතින්නේ. මා උපුටා දක්වන, මේ මහාචාර්යවරුන්ගේ අදහස් වලින් ඒවා කොයි තරම් දුරට සනාථ වී තිබෙනවාද ?

මම එකක් කියන්නම්: වියළි කලාපයේ කැලෑවල තිබෙන රට එඩරු— Castor—කියන වර්ගයෙන් තෙල් ලබා ගෙන ප්‍රයෝජනයට ගන්නට පුළුවනි. අඩු තරමින් ඒ සම්බන්ධයෙන් පර්යේෂණ කර ඒවා ප්‍රයෝජනයට ගන්නට පුළුවන්ද බැරිද කියන එකවත් හෙව්වාද ? රට එඩරු ඕනෑ තරම් තිබෙනවා, කැලෑවල. වියළි කලාපයට ලැබෙන වර්ෂාපතනය අනුව ඒවා ඉබේ වැවෙනවා. එහෙත් ඒවායින් නියම ප්‍රයෝජනය ගැනීමට අපේ මහාචාර්යවරුන්, විශේෂඥයන් කට යුතු කරන්නේ නැහැ.

මා තව එක දෙයක් ගැන පමණයි කියන්නේ. ඉන්පසු මගේ කථාව අවසාන කරනවා. විනය පිළිබඳව කටයුතු කරන්නට ඕනෑ බව ගරු ඇමතිතුමා පිළිගන්නවා ඇති.

**ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)**
*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாசார விவகார அமைச்சர்)*
(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

එය කරනවා.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය ගැන වූ පරීක්ෂණ වාර්තාවේ ඒ ගැන හොඳට කරුණු දක්වා තිබෙනවා. අද මුහුණ පා තිබෙන ප්‍රශ්නයට, එය හුඟාක් අදාළයි.

"University of Oxford—Report of Commission of Inquiry, Volume I."

". . . . the Proctors should continue to administer justice . . ."

එය කොයි තරම් දුරට සාර්ථකදැයි මා දන්නේ නැහැ. විනයාරක්ෂක නිලධාරීන් සම්බන්ධ මේ කාරණය වැදගත්.

"638. At present no one can be elected a Proctor unless he has completed the fourth, but not reached the seventeenth, year from his taking the M.A. degree.—"

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බලන්න, කොයි තරම් විශේෂයක් කර තිබෙනවාද කියා.

"—Our recommendation in the preceding paragraph will lengthen the proctorial cycle to seventeen years so that a widening of this range might be thought necessary. However, we consider that a rule based on standing is out-dated: it was based on the assumptions that every candidate for the proctorship would have taken his first degree at Oxford and that he would have proceeded to his M.A. as soon as he was qualified to do so. Today, war service or work in other occupations often means that the M.A. is taken late; and frequently non-Oxford graduates are appointed to posts in Oxford and so receive an Oxford M.A. only on taking up their appointment. We think that the intention of the rule can now be better achieved by a rule based on age. We therefore recommend that candidates for the proctorship should have exceeded the age of 29 but not have exceeded the age of 46 on the day on which they would take up office."

ඊළඟට මේ කාරණය කියන්නට කැමතියි. විනය පාලනය කරන මහතුන් තෝරා ගැනීමේදී ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය අනුගමනය කරන්නේ කොතරම් ප්‍රවේශම්කාරී වැඩ පිළිවෙළක්දැයි ගරු ඇමතිතුමා සලකා බලනවා නම් හොඳයි. විශ්ව විද්‍යාලවල විනය ආරක්ෂා කර ගැනීම සඳහා වගකිව යුතු පුද්ගලයන් පත් නොකරතොත් විශ්ව විද්‍යාලවල කටයුතු අවුල් ජාලාවක් බවට පත් වෙනවා. "අන්තො ජටා බහි ජටා" ඇති වෙනවා.

මෙන්න විනයාරක්ෂ නිලධාරීන්ගේ යුතුකමක් :

"They would refer points to the appropriate university bodies and act as spokesmen to the students to give a reply from such bodies. They should take care, however, not to destroy the established system by which any college governing body keeps in close touch with the members of its Junior Common Room and Middle Common Room."

විනය ආරක්ෂා කර ගැනීම සඳහා ඒ ඇත්තන් කොතරම් සුපරීක්ෂාකාරීව ක්‍රියා කරනවාද යන්නයි, මා ගරු ඇමතිතුමාට පෙන්වා දෙන්නට අදහස් කෙළේ. අප විවේචනයෙහි යෙදෙන්නේ කාලය ගත කිරීමේ අදහස ඇතිව නොවෙයි. කාලය ගත්තා නම් එසේ ගත්තේත් [illegible] තත්ත්වය ගරු ඇමතිතුමාට පෙන්වා දීමටයි. අනවශ්‍ය පරිදි කාලය ගත්තා යයි හැඟීමක් ඇති වුණා නම් ඒ ගැන කනගාටු වෙනවා. එහෙම හැඟීමක් තිබෙනවා නම් ක්ෂමාව භජනය කරන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 3.5

**ටී. බී. එම්. හේරත් මයා. (වලපනේ)**
*(திரு. ரி. பி. எம். ஹேரத்—வலப்பனே)*
(Mr. T. B. M. Herath—Walapane)

ගරු කථානායකතුමනි, විශ්ව විද්‍යාලවලට මහාචාර්යවරුන්, ප්‍රාචාර්යවරුන් කථිකාචාර්යවරුන් හා වෙනත් සේවකයන් බඳවා ගැනීම පිළිබඳව උසස් අධ්‍යාපන පනත යටතේ කිසියම් ක්‍රියාත්මක වැඩ පිළිවෙළක් නැති අවස්ථාවකදී ඒ අඩුපාඩුව සපුරාලීම සඳහා රෙගුලාසි ඉදිරිපත කර තිබීම ගැන ගරු අධ්‍යාපන ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ රෙගුලාසි ඉදිරිපත් කරන අවස්ථාවේදී විශ්ව විද්‍යාලවල පැරණි තත්ත්වයත්, නොයෙකුත් විධියේ දුර්වලකම් සහිතව පැවතුණු හා පවතින තත්ත්වයත් ගැන මනා අවබෝධයක් ගරු ඇමතිතුමාට තිබිය යුතුයි. ඒ කියන ලද කරුණු ගැන මැනැවින් කල්පනා කර බලා මෙම රෙගුලාසි ඉදිරිපත් කර තිබෙනවාදැයි අප විසින් කල්පනා කර බැලිය යුතුයි.

ගරු කථානායකතුමනි, මා විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ කෝට් සභාවේ සාමාජිකයකු හැටියට සිටි හෙයින් ඒ විශ්ව විද්‍යාලයට මහාචාර්යවරුන්, ප්‍රාචාර්යවරුන් හා කථිකාචාර්යවරුන් පත් කිරීමේදී සිදු වුණු අයුතු අසාධාරණකම් ගැන මට නොයෙක් විට පෙනී ගිය අතර ඒ අවස්ථාවලදී ඒ පිළිබඳව කෝට් සභාවේදී විවේචනය කරන්නටත් මට සිදු වුණා. යම් යම් පුද්ගලයන්ට විශේෂ වාසි සිදු වන අන්දමට ක්‍රියා කළ අවස්ථා රාශියක් තිබුණු බව අපට පෙනී ගියා. විශ්ව විද්‍යාලයක්, ආණ්ඩු කරන පක්ෂයේ පමණක් නොව පොදුවේ මුළු රටේම වස්තුවක් බව අප කල්පනා කර බලන්නට ඕනෑ. ධනවතාගේ පටන් දිළින්දා දක්වාත්, කුලවතාගේ පටන් කුල හීන යයි කියන නැනැත්තා දක්වාත් සිටින හැම කෙනෙකුටම විශ්ව විද්‍යාලය සාධාරණ ස්ථාන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඊ. බී. එම්. හේරත් මයා.]

යක්; පොදු ස්ථානයක්. එහෙම නම් විශ්ව විද්‍යාලවල කටයුතු පිළිබඳ වගකීම පැවරී තිබෙන අධ්‍යාපන ඇමතිතුමාට නීති රීතිවලින් කොතරම් බලතල පැවරී තිබුණත් විශ්ව විද්‍යාලවල ගරුත්වය ආරක්ෂා වන්නේ ඒවායේ සිටින මහාචාර්යවරුන්ගේ, ප්‍රාචාර්යවරුන්ගේ, කථිකාචාර්යවරුන්ගේ හා අනෙක් සේවක මණ්ඩලවල තත්ත්වය අනුවයි. එසේ හෙයින් ඒ සම්බන්ධයෙන් නීතිරීති සකස් කළ යුත්තේ සැහෙන වගකීමක් ඇතිවයි. ඒ නිසා මේ පනවන්නට යන රෙගුලාසිවලින් අවශ්‍ය කටයුතු නිසියාකාර ලෙස කෙරෙනවාද, කරන්නට පුළුවන්ද යනු සොයා බැලීම යුතුකමක්.

මෙම රෙගුලාසිවලින් අප සිතන අන්දමේ උසස් පරමාර්ථ ඉටු වන්නේ නැති බව ගරු ඇමතිතුමාට පෙනී යනවා නම් ඒවා ඉල්ලා අස් කර ගෙන නැවත වරක් නිවැරදි කර සාර්ථක ආකාරයෙන් මෙම සභාවට ඉදිරිපත් කිරීම එතුමාගේ යුතුකමයි. එය අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් කරනු ලබන යුතුකමක් පමණක් නොවෙයි, මුළු රට වෙනුවෙන්ම කරනු ලබන යුතුකමක් වෙනවා. 1963දී විශ්ව විද්‍යාල කොමිෂන් සභාවක් පත් කළ බව තමුන්නාන්සේ දන්නවා. එම කොමිෂන් සභා වාර්තාවෙහි විශෙෂයෙන් මෙම කරුණ ගැන සඳහන් කර තිබෙනවා. විශ්ව විද්‍යාලවල මහාචාර්ය, ප්‍රමුඛාචාර්ය සහ කථිකාචාර්යවරුන් පත් කිරීම පිළිබඳව දැනට පවත්නා ක්‍රමයෙහි පවතින හරි වැරදි භාවය පිළිබඳව එහි විස්තර කර දී තිබෙනවා. එම නිසා පැනනැගී ඇති තත්ත්වය කුමක්ද යන්න එයින් පැහැදිලි වෙනවා. මෙම සභාවට මේ රෙගුලාසි ඉදිරිපත් කරන්නට පෙර ගරු ඇමතිතුමා ඒ පිළිබඳව හරියාකාර කල්පනා කර තිබෙනවාද යන්න සැක සහිතයි. එම කොමිෂන් සභා වාර්තාවෙන් පෙන්වනු ලබන වැරදි තේරීම් කාරක සභා ක්‍රමය තමයි, මේ ගරු ඇමතිතුමා නැවත වරක් මෙම සභාවට ඉදිරිපත් කර තිබෙන්නේ. එදා විශාල වියදමක් දරා කොමිෂන් සභාවක් පත් කොට අවුරුදු ගණනක් කාලය ගෙවා සාක්ෂි විභාග කර බලා ඒ අනුව සකස් කරන ලද වාර්තාව ඇමතිතුමා වෙත ඉදිරිපත් කළා. ගරු ඇමතිතුමා උසස් අධ්‍යාපන පනත පිළිබඳව සාකච්ඡා කරද්දී ප්‍රකාශ කළා, මේවා ගෙනෙන්නේ විශ්ව විද්‍යාල කොමිෂන් සභා නිර්දේශ ගැන හොඳින් කල්පනා කර බැලීමෙන් පසුව බව. එහෙත් මේ තේරීම් කාරක සභාව පත් කරන විට එම විශ්ව විද්‍යාල කොමිෂන් සභා වාර්තාව අමතක කළ බව පෙනී යනවා.

1963 අංක 16 දරන ලංකා සැසි වාර්තාවේ 99 වන පිටුවේ 243 වන ඡේදයේ සඳහන් වන කොටසක් මා දැන් කියවන්නට කැමතියි. [බාධාකිරීමක්] එය ගුණවර්ධන කොමිෂන් සභාව. එම කොටස මෙසේයි:

"දැනට මහාචාර්යවරුන් ප්‍රමුඛාචාර්යවරුන් හා කථිකාචාර්යවරුන්ගේ තනතුරු පුරවනු ලබන්නේ විශ්ව විද්‍යාල ආඥා පනතේ 34 වෙනි වගන්තිය අනුව පාලක සභාව මගිනි. මේ පාලක සභාව ඒ පත්වීම් කරන්නේ උප කුලපති තනතුර හිමි පීඨයේ පීඨාධිපති පාලක සභාවෙන් පත් කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙකු සනාතන සභාවේ සාමාජිකයන් අතරින් විෂය පිළිබඳව දැනුම ඇති දෙදෙනෙකු හා උත්තර පාලක සභාව විසින් පත් කරන විශ්ව විද්‍යාලීය නිලධාරියකු හෝ ආචාර්ය මණ්ඩලයට අයත් වූවකු හෝ නොවන දෙදෙනෙකුගෙන්ද සමන්විත වූ තේරීම් මණ්ඩලයක නිර්දේශ අනුවය."

මෙම වාර්තාවෙන් පැහැදිලිව පෙන්වා දී තිබෙනවා, ඒ ක්‍රමය සාර්ථක නැති බව. එම නිසා හරියාකාර කථිකාචාර්යවරුන් මහාචාර්යවරුන් තේරීම සාර්ථක වී නැත යන්න නිදර්ශන සහිතව විශාල වශයෙන් විස්තර කර තිබෙනවා. ඒ සියලුම කරුණු මෙහිලා සඳහන් කරන්නට මට කාලය නැහැ. එම කොමිෂන් සභාව මගින් යෝජනා කර තිබෙනවා, මීට වඩා වැදගත් ක්‍රමයක්. තමුන්නාන්සේට පෙන්වා දෙන්නට කැමතියි, එම වාර්තාවේ 100 වන පිටුවේ 246 වන නිර්දේශය. එමගින් පැහැදිලිව පෙන්වා දී තිබෙනවා, තේරීම් කාරක සභා දෙකක් තිබිය යුතු බව. එකක්, විශෙෂ තේරීම් කාරක සභාව. ඒ කියන්නේ එක් එක් තනතුර ඇමතිතුමා විසින් ප්‍රසිද්ධ කළායින් පසු එම තනතුරට සුදුස්සන් තෝරන්න තේරීම් කාරක සභාවක් පත් කරනවා. එම තේරීම් කාරක සභාව මගින් තෝරා ගන්නා පුද්ගලයන් තවත් පොදු තේරීම් කාරක සභාවක් ඉදිරියට පැමිණිය යුතු බව කියවෙනවා. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියන්නේ හැමදාම තිබෙන පොදු තේරීම් කාරක සභාවකටයි. එම පොදු තේරීම් කාරක සභාව මගින් තවදුරටත් පරීක්ෂා කර බලා අවශ්‍ය නම් නැවත සම්මුඛ පරීක්ෂණ යනාදියද පවත්වා නිර්දේශ කළ යුතුයි, පාලක සභාවට නැති නම් මහාධිකාරි මණ්ඩලයට. මේ පොදු තේරීම් කාරක සභාව මගින් කරනු ලබන නිර්දේශ යන් උඩයි, පාලක සභාව මගින් පුද්ගල යන් තෝරාගත යුත්තේ. ඒ අනුව බලන විට යටත් පිරිසෙයින් මේ අය දෙතුන් සැරයක් තේරෙනවා. පළමුවෙන් විශෙෂ මණ්ඩලයෙන් තෝරනවා. ඉන් පසුව පොදු මණ්ඩලයෙන් තේරෙනවා. ඊළඟට මහාධිකාරී මණ්ඩලයෙන් තේරෙනවා. එසේ හෙයින් යම් විධියකින් විශ්ව විද්‍යා ලීය කථිකාචාර්යවරුන් තෝරා ගැනීමේදී අවශ්‍ය සුදුසුකම් සියල්ල සහිතව වඩාත් සුදුසු පුද්ගලයන් තෝරා ගැනීමට අවසථා ව සැලසෙනවා. එහෙත්, ගරු ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙන මේ තේරීම් කාරක සභා ක්‍රමයේ පරණ තිබුණු වරද ඒ විධියට ම තිබෙනවා. ඒකයි අප තමුන්නාන්සේට කරන චෝදනාව.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ඇයි මහාධිකාරී මණ්ඩලය ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
මහාධිකාරී මණ්ඩලයට කරන්නට දෙයක් නැහැ. තුන් දෙනකු නිර්දේශ කළාම එයින් කෙනකු පත් කරන්නට සිදු වෙනවා. සිය දහස් ගණනක් අපේක් ෂකයන් පරීක්ෂා කරන්නට මහාධිකාරී මණ්ඩලයට පුළුවන්කමක් නැහැ. නිර්දේශ කළ දෙතුන් දෙනා අරගෙන ඔවුන් අතර යම් යම් සසඳා බැලීම් සමාන කිරීම් යුක්තිසහගතද කියා සොයා බැලීම්, ආදිය නම් කරන්නට පුළුවන්. විශ්ව විද්‍යාල කොමිෂන් සභාව වාර්තා කර ඇති අන්දමට තේරීම් කාරක සභා දෙකක් තිබෙනවා නම් එහි ඇති ප්‍රයෝජනය මම පෙන්වා දෙන්නම්. අපේක්ෂකයාගේ විෂයය, අධ්‍යාපනේන්ද්‍රිය නත්නම් උගත් වන විෂයයන් පිළිබඳව තොරතුරු සොයා බලන්නට විශේෂ තේරීම් කාරක සභාවට පුළුවන්. ඒ අතරම පොදු කරුණු ගැන සොයා බැලීමට පොදු තේරීම් කාරක සභාවකුත් තිබෙනවා නම් ඒ පුද්ගලයාගේ හැම අංශයක් ගැනම පරීක්ෂා කර බලන්නට පුළුවන් වෙනවා. විශ්ව විද්‍යාල වල ඇතුළේ තිබෙන කණ්ඩායමුදායක තත්ත්වයට සමහර ආචාර්ය වරුනුත් සැහෙන තරමකින් වගකියන්නට ඕනෑ යයි මා කියනවා. ගරු ඇමතිතුමා එය පිළිගන්නවාද නැද්ද මා දන්නේ නැහැ. අහවල් පක්ෂයේ උදවියයි කියා මා කියන්නේ නැහැ. සමහරවිට ඇමතිතුමාට පොඩි පන්දමක් අල්ලා උසස් වන්නට හදන අය හොඳයි කියා මා කියන්නේ නැහැ. එමෙන්ම ඇමතිතුමා කරන හොඳ නරක හැම දෙයක්ම විවේචනය කරන අය හොඳයි කියලත් මා කියන්නේ නැහැ. විශ්ව විද්‍යාලවලට අවශ්‍ය වන්නේ මධ්‍යසථ යුක්තිසහගත අදහස් දරන අයයි. යම්කිසි විධියකින් ගරු අධ්‍යාපන ඇමති තුමා හිතනවා නම් එතුමා කල්පනා කරන විධියට විශ්ව විද්‍යාලවල සිටින හැම කෙනෙක්මත් කල්පනා කරන්නට ඕනෑ ය කියා එය අනුමත කරන්නට අපි ලෑහැස්ති නැහැ. ඒ අය ස්වාධීනව සිතා විෂයයන් පිළිබඳව ශිෂ්‍යයන්ගේ දැනුම කාලයටත් රටටත් ඔබින අන්දමට, අනාගත පරම්පරාවට සේවයක් වන ආකාරයට, ලෝකය ඉදිරියට යන ප්‍රමාණය ටම ඉදිරියට ගෙන යන්නට පුළුවන් මහා චාර්යවරුන් හා කථිකාචාර්යවරුන් විශ්ව විද්‍යාලවලට තේරෙන්නට ඕනෑ. විද්‍යා ලංකාර විශ්ව විද්‍යාලයෙන් නිදර්ශනයක් පෙන්වන්නම්. කිසිම දැන්වීමක් ප්‍රසිද්ධ නොකර තනතුරු කීපයක්ම පිරිනමා සිසි එක්තරා කාන්තාවක් නිසා සැහෙන අවුලක් ඇති වී තිබෙන බව ගරු ඇමති තුමා දන්නවා නේද ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
එයා දැන් ගිහින්.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ඒක වෙනම ප්‍රශ්නයක්. එයා ගියේ අවුල හදලා ඉවරවෙලයි. හොඳයි ආවේ කොහොමද ? ගත්තේ කවුද ? ගත්තේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. බී. එම්. හේරත් මයා.]

මොන විධියටද? තනතුරු කීපයක් ලැබුණේ කොහොමද? මෙවැනි රෙගුලාසි පනවන විට එවැනි වැරදිවලට පියවරක් ගැනීමටත් ඉඩකඩ තිබෙන්නට ඕනෑ. යම්කිසි විධියකින් තේරීම් කාරක සභාව වැරදි විධියකට කළා නම් එවැනි අවස්ථාවල මෙන්න මේ දෙය කරනවාය කියන වගන්තියක් මෙයට ඇතුළත් කරන්නට තමුන්නාන්සේට පුළුවන්කම තිබුණා. පාඩම් ඉගෙන ගත්තාට පසුව මෙයට වගන්තියක් ඇතුළත් කරන්නට නොහැකි වුණේ ඇයි? වැරදි විධියකට කළා නම් එයට කරන පිළියම මේකයි කියා නීතියේ සඳහන් කිරීමට යුතුකමක් තිබුණා නේද?

ගරු කථානායකතුමනි, තේරීම් කාරක සභාවේ තීරණය අවසාන තීරණයක්. ඊට උඩින් කථා කරන්නට බැහැ. තේරීම් කාරක සභාව තුන් දෙනකු නිර්දේශ කළ විට මහාධිකාරී මණ්ඩලය එයින් අයකු තෝරා ගන්නවා. මේ ව්‍යවස්ථාව අනුව ඊට ඉහළින් යන්නට ගරු ඇමතිතුමාටවත් පුළුවන්කමක් නැහැ. වැරදි සිදු වෙනවා දැක දැකත් තව තවත් වැරදි සිදු වීමට ඉඩ තබා පනවන මේ ව්‍යවස්ථාවලින් ඇති ප්‍රයෝජනය කුමක්ද? මේ ගැන කෑගැසීමෙන් හෝ කාලය ගත කිරීමෙන් තේරුමක් ඇති වන්නේ නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමාට කරුණක් මතක් කරන්න කැමතියි. විශ්ව විද්‍යාල කොමිෂන් සභාවේ මේ නිර්දේශය වැදගත් එකක්. යම්කිසි පුද්ගලයකු තෝරා ගැනීමට විශේෂ තේරීම් කාරක සභාවක් තිබිය යුතු අතර එම විශේෂ තේරීම් කාරක සභාවේ තේරීම්වලින් පසුව පුද්ගලයා ගැන පරීක්ෂා කර බලන්නට පොදු තේරීම් කාරක සභාවකුත් තිබෙන්නට ඕනෑ. වෙන එකක් තබා යම්කිසි උපාධිධරයකු කථිකාචාර්යවරයකු හැටියට තෝරා ගැනීමේදී ඔහු ලත් උපාධිය ලංකාවේ එකක් නම් ඔහු විශ්ව විද්‍යාලයේ ඉගෙන ගත් කාලයේ ලබාගත් ලකුණු පිළිබඳ විස්තරත් කල්පනාවට ගන්නය කියා කෙලින්ම කියනවා. ඇත්ත වශයෙන්ම උසස්ම පරමාර්ථය විය යුත්තේ ඉතාම දක්ෂ ඉතාම සුදුසු පුද්ගලයා තෝරා ගැනීමයි. විශ්ව විද්‍යාලයකට අවශ්‍යව තිබෙන්නේ එයයි. එසේ නැතිව විශ්ව විද්‍යාල තුළ සෙල්ලම් කිරීමට ඉඩ දී තිබීමෙන් එක පැත්තකින් අපේ දරුවන් අනාථ වෙනවා; එක පැත්තකින් අපේ අධ්‍යාපනය නවතිනවා; එක අතකින් අපේ ජාතියේ අනාගත බලාපොරොත්තු නවතිනවා. මේ සියල්ලම සිදු වන්නට ඉඩ තබා, තමුන්නාන්සේලාට ආණ්ඩු බලය තිබෙන නිසා ඒ බලය පාවිච්චි කර තමුන්නාන්සේලා ව්‍යවස්ථා සම්මත කරනවා. අපට ආණ්ඩු බලය තිබෙන කාලයේදී අපත් එහෙම කළා. එහෙත් එයින් ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. එයින් සිදු වන්නේ ප්‍රශ්න තව තවත් බරපතළ වීමයි. ඒ නිසයි, අප කියා සිටින්නේ මේ විධියේ කටයුතු කරන විට විශේෂඥයන්ගේ අදහස් සැලකිල්ලට ගත යුතු බව. 1966 දෙසැම්බර් මාසයේදී ඉදිරිපත් කළ ව්‍යවස්ථාව අනුව, මහාධිකාරී මණ්ඩලය යම් කිසි තීරණයක් ගත්තොත් ඒ තීරණය වෙනස් කරන්නට බලයක් නැති බව ගරු ඇමතිතුමාටම දැන් තේරී තිබෙන නිසා, මහාධිකාරී මණ්ඩලය කළ දේ අවලංගු කිරීමට ජාතික උසස් අධ්‍යාපන සභාවට බලය දීම සඳහා තවත් නියෝගයක් ගරු ඇමතිතුමා 1967 දී ඉදිරිපත් කර තිබෙනවා. ඒ නියෝගයත් අද න්‍යාය පත්‍රයේ තිබෙනවා. ගරු ඇමතිතුමා ඒ දෙකම එකවර කල්පනා කර නැහැ.

ගරු අධ්‍යාපන අමතිතුමා බොහොම කාර්ය බහුල ඇමති ධුරයක් දරණ කෙනකු බව අප දන්නවා. ඒ නිසා එතුමාට නීති උපදෙස් දෙනය අය ගැන එතුමා බොහොම පරිස්සමින් කටයුතු කළ යුතුයි. ඒ අය අතර බොරු වලවල් කපන උදවිය බොහොම ඉන්නවා; බොහොම හිටියා. සමහර උදවිය ඔවුන් බලාපොරොත්තු වූ තැන් ඔවුන්ට නොලැබුණු නිසා රටෙනුත් පිට වෙලා ගියා. එසේ පිට වී යන්නට පෙර බොරු වලවල් කපා තබා ගන්නට බැරි නැහැ. අධ්‍යාපන ඇමති ධුරය දරණ ඕනෑම පුද්ගලයකු රටේ විවේචනයට ලක් වෙනවා. ඒක වළක්වන්නට කාටවත් බැහැ. ඒ ඇයි? අධ්‍යාපනය කියන දේ 1,20,00,000ක් වූ රටේ සෑම කෙනකුටම බලපාන දෙයක්. ඒ සෑම කෙනකුම බලාපොරොත්තු වන විධියට—සෑම කෙනකුම සන්තෝෂ වන විධියට—අධ්‍යාපන ක්‍රමයක් ඇති කරන්නට දක්ෂයෙක් නැහැ. ඒ ඒ අයගේ අදහස් ගැන සෑහෙන තරම් දුරට කල්පනා කර බලා ක්‍රියා කරන්නට ඇමතිතුමාට සිදු වී තිබෙනවා. මේ ව්‍යවස්ථාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉදිරිපත් කරන විට පමණක් නොව වෙනත් අධ්‍යාපන ව්‍යවස්ථා ඉදිරිපත් කරන විටත් ගරු ඇමතිතුමාට නොයෙකුත් විවේචන එල්ල වෙනවා. ඉතාම වැදගත් පනතක් වූ සාමාන්‍ය හා කාර්මික අධ්‍යාපන පනත මේ ගරු සභාවේ න්‍යාය පත්‍රයේ තිබෙනවා. පිටතින් වගේම ඇතුළතිනුත් විවේචන පිට විවේචන එල්ල වීම නිසා ඒ ශීර්ෂය න්‍යාය පත්‍රයේ පහළට දමන්නට තමුන්නාන්සේට සිදු වී තිබෙනවා. ඒ විවේචන ඇති වීම වළක්වන්නට බැහැ. අධ්‍යාපනය වැනි ප්‍රශ්නයකදී විවේචනය නොවෙනවා නම් ඒ ගැනයි, අප කණගාටු වන්නට ඕනෑ. අධ්‍යාපනය පිළිබඳ ව්‍යවස්ථාවක් විවේචනය කරලා නියම විධියට සකස් කර දෙන්නට ඕනෑ. දැන් ජීවත් වන හයක් හතරක් නොදන්නා පොඩි ළමයින්ටත් එසේම තවම නූපන්, අනාගතයේදී උපදින්නට සිටින දරුවන්ටත් බලපාන්නටයි අධ්‍යාපනය සම්බන්ධයෙන් ව්‍යවස්ථා සකස් කරන්නේ. ඒ නිසා දේශපාලන වශයෙන්, කුල වශයෙන්, පන්ති වශයෙන් කල්පනා කර අධ්‍යාපනය පිළිබඳ නීති රීති සකස් කරනවා නම් ඒක ජාතික අපරාධයක්. තමුන්නාන්සේ කොයි විධියේ නීති ගෙනාවත් අපට ඒවා විවේචනය කරන්නට සිදු වේවි. ඒ විවේචනය කිරීම කාලය කා දැමීමට කරන වැඩක් හැටියට තමුන්නාන්සේලා කල්පනා කරනවා නම් ඒක වැරදියි. මේ වගේ දේවල් ගැන පුළුවන් තරම් විවේචනය කර වැරදි හරිගස්සා නියම විධියට සකස් කර ගැනීමයි, අප විසින් කළ යුත්තේ.

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගේ ව්‍යවස්ථාවේ හැටියට තේරීම් කාරක සභා පත් කරන්නේ මහාචාර්යවරුන් සහ ප්‍රාචාර්යවරුන් හැර අනික් ආචාර්යවරුන් පත් කිරීමටයි. මහාචාර්යවරුන් සහ ප්‍රාචාර්යවරුන් පත් කිරීම සඳහා මේ වගේ තේරීම් කාරක සභා පත් නොකරන්නේ ඇයි? ජ්‍යෙෂ්ඨත්වය අනුව දිය යුතුයයි කෙනකුට සමහර විට තර්ක කරන්නට පුළුවනි. එහෙත් ගරු ඇමතිතුමාගේ අධ්‍යාපන ප්‍රතිපත්තියේ නොයෙක් අංශවල ජ්‍යෙෂ්ඨත්වය පමණක් සලකා බැලීමේ ප්‍රතිපත්තිය අත්හැර තිබෙනවා. දක්ෂකමත්, ජ්‍යෙෂ්ඨත්වයත්, සහතික පත්‍රත් ගැන පමණක් නොව වෙනත් නොයෙක් දේවල් ගැන සලකා බලන බව ගරු ඇමතිතුමා මේ ගරු සභාවේදීත් ඉන් පිටස්තර ස්ථානවලදීත් කියා තිබෙනවා. එහෙම නම් ඇයි මේ මහාචාර්යවරුන් සහ ප්‍රාචාර්යවරුන් පත් කිරීමේදී පමණක් ජ්‍යෙෂ්ඨත්වයට මුල් තැන දෙන්නට කල්පනා කර තිබෙන්නේ? මොකක්ද එසේ කරන්නට හේතුව? කණිෂ්ඨ අය අතර දක්ෂ කෙනකු ඉන්නට බැරිද? වඩා හොඳ අත්දැකීම් තිබෙන, විශාරද දැනුමක් තිබෙන, බහුශ්‍රැත දැනුමක් තිබෙන අය කණිෂ්ඨ අය අතර ඉන්නට බැරිද? එවැන්නන්ගෙන් අර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්ගෙන් ලැබෙනවාට වඩා උසස් සේවයක් වෙනවා නම් ඊට ඉඩ ලැබෙනවාට විරුද්ධ වන්නේ ඇයි? මොන හේතුවක් නිසාද විරුද්ධ වන්නේ? ඒ නිසා එවැන්නන්ගේ සේවය ලබා ගත හැකි වන අයුරින් වැඩ පිළිවෙළක් ඇති කිරීම උචිත බව ගරු ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි. කොමිෂන් සභා වාර්තාව කෙලින්ම මේ ගැන සඳහන් කරනවා. 247 වැනි ඡේදය බැලුවොත් එය පැහැදිලි ලෙස පෙනී යනවා ඇති. ඒ අනුව මේ සම්බන්ධයෙන් කෙලින්ම ප්‍රතිපත්තියක් නිර්දේශ කර තිබෙනවා. එතකොට කෙලින්ම ඒ ප්‍රතිපත්තිය නොපිළිගෙන ක්‍රියා කිරීමේ තේරුම කුමක්ද?

කොමිෂන් සභාව දුන් පැහැදිලි ප්‍රතිපත්ති දෙකක් තිබෙනවා. එයින් එකක් ගැන මුලින්ම සඳහන් කළා. ඒ ගැනත් මේ රෙගුලාසිවල සඳහන් කර නැහැ. ඒ දෙකම මෙහිදී අමතක කර දමා තිබෙනවා. පැරණි වැරදි ක්‍රමය නැවත වරක් ඉදිරියට ගෙනැවිත් තිබෙන බවයි එයින් පෙනෙන්නේ. කලිනුත් වැරදි සිදු වී තිබෙන බව ගරු ඇමතිතුමාම කියා සිටියා. ඒ විධියේ වැරදි නැවත සිදු නොවන පිණිස විධිමත් වැඩ පිළිවෙළක් දැන්වත් ගන්නේ නැහැ. තව දුරටත් ඒ වැරදි ක්‍රමයම ක්‍රියාත්මක කරන්නට මේ විධියේ රෙගුලාසි මේ ගරු සභාවට ගෙන එන්නේ ඇයි? ඒ නිසා මීට වඩා කල්පනාකාරී ලෙස ගරු ඇමතිතුමා කටයුතු කළ යුතුව තිබුණා.

මේ රෙගුලාසි අනුව සෑම පුරප්පාඩුවක්ම මහාධිකාරි මණ්ඩලය තීරණය කරන ආකාරයට දැන්වීම් මගින් ප්‍රසිද්ධ කළ


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. බී. එම්. හේරත් මයා.]

යුතුව තිබෙනවා. දන්වීම් මගින් පුරප්පාඩු ප්‍රසිද්ධ කිරීමේ සම්පූර්ණ බලය දී තිබෙන්නේ මහාධිකාරි මණ්ඩලයටයි. මා නීතිඥයකු නොවෙතත් මෙහි තිබෙන පරස්පර විරෝධි තැනක් ගැන සඳහන් කරන්නට කැමතියි. නීතිඥයකු නොවන කෙනකුට වුවත් භාෂාව ගැන සෑහෙන තේරුමක් ඇත්නම් එය තේරුම් ගත හැකියි.

> "............ සෑම පුරප්පාඩුවක්ම මහාධිකාරි මණ්ඩලය විසින් තීරණය කළ හැකි යම් ආකාරයකට දන්වීම් මගින් ප්‍රසිද්ධ කළ යුතුය. තවද, ඒ ප්‍රසිද්ධ දන්වීමේ සඳහන් සුදුසුකම් සහ වෙනත් නියමයන් හා කොන්දේසි සඳහා මහාධිකාරි මණ්ඩලයේ පූර්ව අනුමතිය ලැබ තිබිය යුතුය ............"

තීරණය කරන්නේ මහාධිකරණ මණ්ඩලයයි. දන්වීම් ප්‍රසිද්ධ කරන්නේ මහාධිකරණ මණ්ඩලයයි. තේරීම් කාරක සභාව පත් කරන්නේත් මහාධිකරණ මණ්ඩලයයි. අන්තිමේදී තේරීම් කාරක සභාවෙන් ලැබෙන නිර්දේශ අනුව පත්වීම් දෙන්නේත් මහාධිකරණ මණ්ඩලයයි. එහෙම නම් මහාධිකරණ මණ්ඩලයට විශ්ව විද්‍යාලයයේ පත්වීම් පිළිබඳව—මහාචාර්ය සහ ප්‍රාචාර්ය තනතුරු හැර—හැම බලතලයක්ම ලැබී තිබෙනවා. එහෙත් ගරු ඇමතිතුමා මේ ආකාරයට සඳහන් කරනවා :

> "එසේ වුවද යම් නිශ්චිත තනතුරක් හා සම්බන්ධ විශේෂ අවසථාවලදී මහාධිකාරී මණ්ඩලය විසින්, ජාතික උසස් අධ්‍යාපන සභාවේ පූර්ව අනුමතිය ලබා ගැනීමෙන් පසු ප්‍රසිද්ධ දන්වීමක් නොමැතිව තනතුරක් පිරවිය හැකිය."

දන්වීම් ප්‍රසිද්ධ නොකර පත් කර ගන්නට බලාපොරොත්තු වන්නේ මොන විධියේ අයද යනුවෙන් ප්‍රශ්නයක් මේ ගරු සභාවේදී යාපනේ ගරු මන්ත්‍රීතුමා (ජී. ජී. පොන්නම්බලම් මයා.) ගරු ඇමතිතුමාගෙන් ඇහුවා. පිටරටවලින් විශේෂඥයන් ගෙන්වා ගැනීම වැනි අවස්ථාවලදී එසේ කටයුතු කරන බව ගරු ඇමතිතුමා ඊට පිළිතුරු වශයෙන් කිව්වා. මේ සම්බන්ධව එක් ප්‍රශ්නයක් ගරු ඇමතිතුමාගෙන් මා අහනවා. පිටරටකින් විශේෂඥයකු ගෙන්වා ගැනීමේදී වුණත් දන්වීම් ප්‍රසිද්ධ කොට ඉල්ලුම් පත්‍ර කැඳවීමේ ඇති වරද කුමක්ද? දන්වීම් ප්‍රසිද්ධ කිරීම නිසා, පිටරටක සිට ඉල්ලුම් කරන කෙනකුට පත්වීමක් දීමේ අමාරුකමක් තිබෙනවාද ? යම් යම් වැඩ සඳහා පිටරටවලින් මෙහි ආ විශේෂඥයන් මේ රටේ සාමාන්‍ය මිනිසුන්ට පරාජය වී ආපසු ගිය අවස්ථා තිබෙන බව ගරු ඇමතිතුමා මතක් නොකරන්නේ ඇයි ? පිටරටවලින් පැමිණි විශේෂඥ ඉංජිනේරු මහත්වරුන්ට මේ රටේ යම් යම් වැඩ කරන්නට බැරිව ඒ අය ඒවා අතහැර දමා ගිය අවස්ථා තිබෙනවා නේද ? ඒවා එකක් පාසා විස්තර කිරීම මේ අවස්ථාවේදී අවශ්‍ය නැහැ. මේ විධියට සිදුරක් තබා නීතියක් හැදීම ගැන ගරු ඇමතිතුමා වෙත අපගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. දන්වීම් ප්‍රසිද්ධ කිරීමෙන්ම සෑම කෙනකුම තෝරා ගත යුතුය යි නීතියක් හදා ඊට පසුව, "එහෙම වුණත් මෙහෙමත් කරන්නට පුළුවන්" කියා ඒ නීතියේ සිදුරකුත් හැදුවා.

විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ තනතුරකට කිසියම් පුද්ගලයකු පත් කිරීම ගැන, ඊට ඇඟිලි ගැසීමක් ගැන, ගරු ඇමතිතුමාට මෙම ගරු සභාවේදී ඊයේ පෙරේසිදා චෝදනාවක් එල්ල වුණු බව මට මතකයි. කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (වී. බී. ඉලංගරත්න මයා.) ඒ සම්බන්ධව ප්‍රශ්නයකුත් ඇහුවා. එවැනි පත්වීමක් කරන අවස්ථාවකදී, ඇමතිතුමා සන්තෝස කිරීම පිණිස දන්වීමක් පළ නොකර සිටින්නට මහාධිකාරි මණ්ඩලයට හෝ ජාතික උසස් අධ්‍යාපන සභාවට හෝ හිතුණොත් මොකක්ද සිදු වන්නේ ? සමහරවිට ඇමතිතුමා මෙවැනි නීති ඇතුළත් කරන්නේ හොඳ හිතින් අවංක අධ්‍යාශයෙන් වන්නට පුළුවනි. එහෙත් එයින් ඇති විය හැකි භයානක ප්‍රතිඵල ගැනත් අප කල්පනා කළ යුතුයි. එම නිසා, දැන්වීම් ප්‍රසිද්ධ නොකර කිසිම විශ්ව විද්‍යාලයක කිසිම පුරප්පාඩුවක් පිරවීමට ඉඩ නොදිය යුතුයි. විශ්ව විද්‍යාලය පොදු ආයතනයක්. එහි තනතුරුවලට එන අයට ඉස්සරහ දොරෙන් පමණක් එන්නට අවසථාව සැලසිය යුතුයි. පස්සා දොරෙන් ඒමට තිබෙන සියලුම මාර්ග වසා දැමිය යුතුයි.

තේරීම් කාරක සභාව පිළිබඳව මා කලින් අවස්ථාවක කරුණු පැහැදිලි කළ නිසා දැන් ඒ ගැන කථා කරන්නට අදහස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්නේ නැහැ. එහෙත්, අවසාන වගන්තිය ගැන එක් කරුණක් කියන්නට ඕනෑ. ඒ වගන්තිය අනුව, විශ්ව විද්‍යාලයක කිසියම් තනතුරක් ඇති කොට ඒ සඳහා කෙනකු පත් කරන්නේ අවුරුද්දක් තාවකාලිකවයි. ඒ අවුරුද්ද ගත වුණායින් පසු, මහාධිකාරි මණ්ඩලය කැමති නම් පත්වීම ස්ථිර කරනවා, නැත්නම් පත්වීම ලැබූ තැනැත්තා ආපසු යවනවා. විශ්ව විද්‍යාල පිළිබඳ අලුත් පනත ඉදිරිපත් කරන අවස්ථාවේදීත් ගරු ඇමතිතුමා එවැනි තත්ත්වයක් ඇති කළා. ඒ විධියේ වගන්තියක් ඊට ඇතුළත් කළා. එවැනි වගන්තියක් ඒ පනතට ඇතුළත් කරන්නේ කුමන කරුණක් නිසාද යනුවෙන් ප්‍රශ්නයකුත් ගරු ඇමතිතුමාගෙන් අහන්නට යෙදුණා. ඊට පිළිතුරු වශයෙන් එතුමා කිව්වේ, නුසුදුසු කථිකාචාර්යවරුන් සිටිනවා නම් ඔවුන් ඉවත් කිරීමේ ක්‍රියා මාර්ගයක් වශයෙන් එසේ කරන බවයි. එවැනි පිළිතුරක් දුන් බවයි මට මතක.

එහෙත්, ඇත්ත වශයෙන්ම එය එසේම දැයි දැන ගැනීමට අපි නිදර්ශනයක් ගෙන බලමු. සලකා බැලීමේ කාල සීමාව වන අවුරුද්දෙන් පස්සේ, මහාධිකාරී මණ්ඩලය නොව ජාතික උසස් අධ්‍යාපන සභාව ක්‍රියා කළ ආකාරය ගැන අපට සතුටට පත් වන්නට පුළුවන්ද? අසුවල් අසුවල් අය විශ්ව විද්‍යාලයෙන් අස් කළාය යනුවෙන් ගරු ඇමතිතුමා ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් කියා සිටි බව තමුන්නාන්සේට මතක ඇති. එසේ අස් කරන ලද අය අතර, විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ දෙවැණි ශ්‍රේණියේ කථිකාචාර්ය ධුරයක් දරූ—හිටපු සෙනේට් මන්ත්‍රී—කරන්නාගොඩ මහත්මයාත් කෙනෙක්. නුසුදුස්සකු වශයෙන් එතුමා අයින් කළා. එතුමා නුසුදුසු නම් අයින් කිරීම ගැන මගේ කිසිම විරුද්ධත්වයක් නැහැ. මා මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා. කරන්නාගොඩ මහත්මයාට ලන්ඩන් විශ්ව විද්‍යාලයේ පාලි පිළිබඳ දෙවැනි ශ්‍රේණියේ බී. ඒ. උපාධියකුත් ලංකා විශ්ව විද්‍යාලයේ සිංහල භාෂාව පිළිබඳ දෙවැනි පන්තියේ බී. ඒ. උපාධියකුත් තිබෙනවා. උපාධි දෙකක් ලබා තිබෙන ඒ කථිකාචාර්යතුමා තමුන්නාන්සේගේ ජාතික උසස් අධ්‍යාපන සභාව මඟින් නුසුදුස්සකු හැටියට ඉවත් කළා. දැන් මම අහන ප්‍රශ්නය මේකයි. එහෙම නම් තනිකර ප්‍රාචීන පණ්ඩිත උපාධිය පමණක් තිබෙන උදවිය කථිකාචාර්ය තනතුරුවල රඳවා ගන්නෙ කොහොමද? පෞද්ගලිකව පොත පත පාඩම් කරල ලබා ගන්න ප්‍රාචීන පණ්ඩිත උපාධිය බී. ඒ. උපාධිය තරම් උසස් නැත කියන පිළිගැනීමක් කාලයක් මේ රටේ තිබුණා. ඒ තත්ත්වය නැති කළේ හිටපු අධ්‍යාපන ඇමතිවරයෙකු වන වර්තමාන ස්වදේශ කටයුතු ඇමති ආචාර්ය විජයානන්ද දහනායක මැතිතුමායි. ඒ ගැන මම එතුමාට ස්තුති කරනව. එදා ප්‍රාචීන පණ්ඩිත උපාධිධාරීන්ට බී. ඒ. උපාධිධාරියකුගේ වැටුපෙන් භාගයක් තරමවත් ලැබුණෙ නැහැ. එහෙත් තමුන්නාන්සේගේ ජාතික උසස් අධ්‍යාපන සභාව කියන්නෙ මොකක්ද? ප්‍රාචීන පණ්ඩිත උපාධිය තිබෙන වයස 58 වුණු උදවියත් තවම කථිකාචාර්යවරුන් වශයෙන් නවත්වාගෙන තිබෙනව. නිදර්ශනයක් : ගරු මොරවක සිද්ධත්ත ස්වාමීන් වහන්සේ ; වයස අවුරුදු 58 යි. ගරු කොස්ගොඩ ධම්මවංශ ස්වාමීන් වහන්සේ, ගරු දෙගම්මැද සුමනජෝති ස්වාමීන් වහන්සේ, ගරු බලගල්ලේ විමලබුද්ධි ස්වාමීන් වහන්සේ. මේ මා සඳහන් කළේ නම් කීපයක් පමණයි. වුවමනා නම් තව ඕනෑ තරම් නම් ඉදිරිපත් කරන්ට පුළුවන්. ප්‍රාචීන පණ්ඩිත උපාධිය පමණක් තිබෙන මේ ස්වාමීන් වහන්සේලා ඒ විශ්ව විද්‍යාලවල කථිකාචාර්යවරුන් හැටියට කටයුතු කරගෙන යන අතර ලන්ඩන් විශ්ව විද්‍යාලයේ බී. ඒ. උපාධියත් ලංකා විශ්ව විද්‍යාලයේ බී. ඒ. උපාධියත් දෙකම ලබා තිබෙන කරන්නාගොඩ මහත්මයා එළියට යවන්න ජාතික උසස් අධ්‍යාපන සභාව කළ තීරණය කෙලින්ම නින්දා සහගත දේශපාලන පළිගැනීමක් යයි මම චෝදනා කරනව.

මේ තේරීම් කාරක සභා හෝ මොන විධියේ කාරක සභා පත් කළත් විශ්ව විද්‍යාලවගේ තැන්වල යුක්තිය ඉෂ්ට වෙන්ට ඕනෑ. ඔහු විරුද්ධ පාර්ශ්වයේ දේශපාලන පක්ෂයක ලේකම්වරයකු නිසා ඔහුට එළියට යන්ට සිදු වුණා. ඔහුට වඩා අඩු සුදුසුකම් තිබෙන උදවිය සේවය කරනව. ගරු ඇමතිතුමා පසුගියදා මේ ගරු සභාවේදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. එම්. හේරත් මයා.]

කියා සිටිය, "ඔව්, කරුණු ඉදිරිපත් කළොත් මම විභාගයක් පවත්වනවා" කියා. මෙන්න කරුණු. එදා ගරු ඇමතිතුමා මේ ගරු සභාවට දුන්න පොරොන්දුව අනුව මේ ගැන සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වා දේශපාලන බලපෑම් උඩ අස් කළ කථිකාචාර්යවරුන් නැවත වරක් බඳවා ගැනීමට කටයුතු කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව. ගරු ඇමතිතුමා එසේ නොකළොත් විශ්ව විද්‍යාල තුළ දේශපාලන බලපෑම් උඩ ක්‍රියාත්මක වන කටයුතු ගැන සොයා බලා වාර්තා කිරීමට, රටට ඇත්ත ඇති හැටියට පහදා දීමට මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් අතරින් තේරීම් කාරක සභාවක් පත් කරන ලෙස ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටින්න අපට සිද්ධ වෙනව. තත්ත්වය මේක නම් මොන කාරක සභාව පත් කළත් වැඩක් නැහැ. දැන් ටික වෙලාවකට කලින් ගරු ඇමතිතුමා කිව්ව, විද්‍යාලංකාරයේ එක්තරා කාන්තාවක් සම්බන්ධයෙන්. දැන් ඇය නැති බව කිව්ව. ඒ පත්වීම වැරදියට කර තිබෙන බව ඇමතිතුමා පිළිගත්ත. ඒහෙම නම් ඇයි මේක පිළිගන්ට බැරි?

ප්‍රාචීන පණ්ඩිත උපාධිධාරීන් බී. ඒ. උපාධිධාරීන්ට වඩා උසස්ය කියා තමුන්නාන්සේ කියනවද? විශ්ව විද්‍යාල එහෙම පිළිගන්නවද? එහෙම නම් ඒ පිළිගැනීම උඩ වැටුප් ක්‍රම සකස් නොකරන්නෙ ඇයි? පණ්ඩිත උපාධිධාරීන්ට වඩා උසස් වැටුප් ක්‍රම සකස් කර නොදෙන්නෙ ඇයි? අපේ විරුද්ධත්වයක් නැහැ. මොකක් හෝ ප්‍රතිපත්තියක් තිබෙන්ට ඕනෑ. මෙන්න මේ උපාධිය අංක 1, මේක අංක 2, මේක අංක 3 ආදි වශයෙන් උපාධි වර්ග කරන්ට ඕනෑ. ඒ අන්දමට ප්‍රතිපත්ති සහගත වැඩ පිළිවෙලක් යොදන්න ඕනෑ. මේ තේරීම් කාරක සභාව පත් කිරීමෙන් ඇති ප්‍රයෝජනය මොකක්ද, ඒගොල්ලන්ට ප්‍රතිපත්ති සහගත වැඩ පිළිවෙලක් නැත්නම්?

අධ්‍යාපන ඇමතිතුමාට මා මතක් කරන්නට සතුටුයි අද රටේ තිබෙන චෝදනාව. මොකක්ද ඒ චෝදනාව? විශ්ව විද්‍යාලයක කථිකාචාර්යවරයකු පත් කරන්නට ගියත් නොයෙක් විධියේ ඇඟිලිගැසීම් අනුවයි ඒ පත්වීම කරන්නෙ. ගැසට් නිවේදනයක්, ප්‍රවෘත්ති පත්‍ර දැන්වීමක් පළ කරන්නෙ පළමුවෙන් තමන්ට ඕනෑ කරන මිනිසාගේ සුදුසුකම් මොනවාද කියා බලා ඒ අනුවය කියා මහජනතාව අතර ප්‍රචාරයක් තිබෙනවා. "මෙන්න මෙයා තමයි අපි තෝරා ගන්නට ඕනෑ, මොනවාද එයාට තිබෙන සුදුසුකම්?" ඒ සුදුසුකම් ලියා ගන්නවා. ලියාගෙන ඒ අනුව දැන්වීම පළ කරනවා. තමන්ට ඕනෑ කරන මිනිසාට තිබෙන සුදුසුකම් අනුව තමයි පත්‍රයේ දැන්වීම පළ කරන්නෙ. ඊළඟට ඉල්ලුම් පත්‍ර කැඳවා තමන්ට ඕනෑ කරන මිනිසාව තෝරා ගන්නවා. ඒක තමයි දැන් රටේ තිබෙන චෝදනාව.

මහජනතාවගෙන් බලය ඉල්ලා ගෙන ආණ්ඩුවක් පිහිටුවූවාය කියමු. ආණ්ඩුව පිහිටුවූවාට පසු අප රක්ෂාවල් සපයන්නේ අපේ ගැත්තන්ට පමණයි, අපේ පක්ෂයේ උදවියට පමණයි, කියා ඒ ආණ්ඩුව කෙළින්ම කියනවා නම්, ප්‍රතිපත්තියක් හැටියට එය අනුගමනය කරනවා නම්, අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් සභා රැස්වීම්වල දීත් රටේ සෑම තැනකදීත් තමුන්නාන්සේලා කියන්නේ, අපි ප්‍රජාතන්ත්‍රවාදීයි, අපි යුක්තිසහගත ආකාරයට දසරාජ ධර්මයෙන් කටයුතු කරනවාය යන්නයි. ප්‍රජාතන්ත්‍රවාදයට අබමල් රේණුවක තරම්වත් හානියක් නොවන ආකාරයට අපි වැඩ කර ගෙන යනවාය කියා තමුන්නාන්සේලා බෙරිහන් දෙනවා. නමුත් කරන්නට ගියාම කරන්නේ අනික් විධියටයි.

ඇයි මේ විධියට රට රවටන්නෙ? අධ්‍යාපන ඇමතිතුමාට හෝ වෙනත් ඇමතිතුමකුට හෝ ආණ්ඩුවකට හෝ සදාකාලිකව එක තැන සිටින්නට පුළුවන් වේවිය කියා මා සිතන්නේ නැහැ. මිනිසුන්ට සදාකාලිකව ජීවත් වෙන්නට බැහැ. තේරීම් කාරක සභාව නිර්දේශ කරන්නේ කුමන ප්‍රතිපත්ති යටතේද කියා මෙහි ව්‍යවස්ථා තිබිය යුතුය කියා අප කියන්නේ එම නිසයි. දැන් මේ ශිෂ්‍ය ගුරුවරුන් පත් කරන ආකාරය පිළිබඳව එක්තරා ප්‍රවෘත්තියක් මා දුටුවා. 1967 විභාගයට පෙනී සිටි අයගෙන් විභාග කොමසාරිස්තුමාගේ ලකුණු අනුව පමණක් ශිෂ්‍ය ගුරුවරුන් බඳවා ගන්නවාය කියා තමුන්නාන්සේ කියනවා. අන්න ප්‍රතිපත්තිය. නමුත් මේකෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙන ප්‍රතිපත්තිය මොකක්ද? තේරීම් කාරක සභාවට බලය දෙනවාලු. තේරීම් කාරක සභාවේ පොළඟුන් සිටිනවා නම් ඒ අය පොළඟකු තෝරාවි. තේරීම් කාරක සභාවේ නයි සිටිනවා නම් ඒ අය නයකු තෝරාවි. ගැරඬි සිටිනවා නම් ගැරඬියකු තෝරාවි. තමන්ගේ වර්ගයේ කෙනෙකු තෝරාවි. ඒකයි වෙන්නෙ. එම නිසයි යම් වැඩ පිළිවෙළක්, යම් ප්‍රතිපත්තියක්, තිබිය යුතුය කියා අප කියන්නෙ. එහෙම නොකළොත් විශ්ව විද්‍යාලවල ඔය අද ඇති වී තිබෙන අර්බුද තව තවත් වැඩි වෙනවා මිස අඩු කර ගන්නට පුළුවන් වෙන්නේ නැහැ.

මේ යෝජනාව යටතේ එක් ගරු මන්ත්‍රීවරයකු කථා කරන විට, තමුන්නාන්සේලා තමයි මේවා ඇති කළේ, කියා එදා තමුන්නාන්සේ කිව්වා. නමුත් තමුන්නාන්සේට මට එහෙම කියන්නට බැහැ. අප එවැනි චෝදනා ලබමින් කටයුතු කරන මන්ත්‍රීවරුන් නොවෙයි. සමහර විට තමුන්නාන්සේ නැගූ චෝදනාව බොරුවක් වෙන්නට පුළුවනි. කවුරුවත් කී දෙයක් තමුන්නාන්සේ පිළිඅරගෙන ඒ චෝදනාව නැගුවා වෙන්නට පුළුවනි. ඒක වෙනම ප්‍රශ්නයක්. නමුත් විශ්ව විද්‍යාල ප්‍රශ්නය කාගේවත් පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. මේක පොදු ප්‍රශ්නයක්. යම් මහාචාර්යවරයකු නැත්නම් උප කුලපතිවරයකු පන්තිවලට ආවෙ නැත්නම් අස් කරනවාය කියා නියෝගයක් කර දරදඬු විධියට ශිෂ්‍යයන් එළියට දමා කටයුතු කරන්නට මහන්සි ගන්නවා නම් අපට පුළුවන්කමක් නැහැ—

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ඔය කරුණු මේ යෝජනාවට අදාළද? දැන් තුන් දවසක් තිස්සේ මේ ගැන කථා කර තිබෙනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඒක ඇත්ත. මන්ත්‍රීවරු හතර දෙනෙකු තුන් දවසක් තිස්සේ කථා කළා. ඒකට මා වැරදිකාරයකු නොවෙයි. මගේ පක්ෂයෙන් කථා කරන පළමුවන කථිකයා මමයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

එම නිසා තමයි මා මෙපමණ වේලාවක් තුළ ඉඩ දුන්නෙ. කරුණා කර අදාළව කථා කරන්න.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

එහෙම නම් අපේ කථා නවත්වන්නටය කියා ඇමතිතුමාට යෝජනාවක් ගෙනෙන්නට කියන්න. මා වාඩි වෙන්නම්.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

මා කිව්වෙ නැහැ කථාව නවත්වන්නය කියා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මහාචාර්යවරුන්ගේ, කථිකාචාර්යවරුන්ගේ ක්‍රියා මාර්ග ගැනයි මා සඳහන් කළේ. සමහර විට ඔය මහාචාර්යවරුන්ට, කථිකාචාර්යවරුන්ට, උප කුලපතිවරුන්ට වැඩිය ඥානවන්ත ළමයින් විශ්ව විද්‍යාලවල සිටිනවා. 15 වැනිදාට පෙර එන්නටය කියා නියෝගයක් කළා. ළමයි 15 වැනිදා ගියා. අත්සන් කළා. නැවතත් එළියට ආවා. ඒ අවස්ථාවේදී කොයි තරම් ඥානවන්තව ඒ ළමයි ක්‍රියා කළාද? සමහර උදවිය මේ මහාචාර්ය පදවිවලට, කථිකාචාර්ය පදවිවලට නැත්නම් උප කුලපති පදවිවලට පත් වුණාම මොලේ පාවිච්චි කරන්නේ නැහැ. අප කියන්නේ මොලේ පාවිච්චි කරන උදවිය, ඥානවන්තව ක්‍රියා කරන උදවිය, මේ තනතුරුවලට තේරිය යුතුය කියායි. ළමයකුගේ පොඩි ප්‍රශ්නයක් විසඳන්නට බැරි, යුක්තිසහගත අන්දමට කල්පනා කර බලා සුදුසු ක්‍රියා මාර්ගයක් ගන්නට ශක්තියක් නැති, පුද්ගලයින් මෙවැනි තනතුරුවලට තේරීම වැරදිය කියා අපට කියන්නට සිද්ධ වී තිබෙනවා.

විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ දැනට වැඩ කරන ලේඛකාධිකාරීතුමා පත් කළේ වර්තමාන අධ්‍යාපන ඇමතිතුමායි. ඒ ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. බී. එම්. හේරත් මයා.]

එතුමා වගකියන්නට ඕනෑ. මා එසේ කියන්නේ, කාන්තාවන් සම්බන්ධ සිද්ධි යටත්, විශ්ව විද්‍යාලය ඇතුළේ තිබෙන අනෙක් සිද්ධිවලටත් වගකිව යුත්තේ ඒ පුද්ගලයා නිසයි. විශ්ව විද්‍යාලවල තනතුරු වලට පත් කළ යුත්තේ මුහුණ බලා නොවෙයි. ඒවාට පත් කළ යුත්තේ දක්ෂ, එමෙන්ම මධ්‍යස්ථ උදවියයි. කථානායක තුමා ඊට හොඳ ආදර්ශයක්. එතුමා කලින් දේශපාලන පක්ෂයක සාමාජිකයෙක්. කථානායකතුමා වශයෙන් දැන් එතුමා පක්ෂග්‍රාහීව කටයුතු කරන්නේ නැහැ. ඒ බව මා ගෞරවයෙන් සඳහන් කරනවා. එතුමා පක්ෂග්‍රාහීව කටයුතු කළොත් අප ඒ බවත් කියනවා. එසේ මධ්‍යස්ථව කට යුතු කරන්නට පුළුවන් දක්ෂ උදවියයි විශ්ව විද්‍යාලවලට පත් කළ යුත්තේ.

එහෙත් යම් යම් පුද්ගලයන් සමහර විට නොයෙක් ඒවා කියා ඇමතිතුමාගේ විශ්වාසය දිනාගෙන විශ්ව විද්‍යාලවල තනතුරුවලට පත් වෙනවා. ඊට පස්සේ ඒ අයගේ ගති ගුණ වෙනස් වෙනවා. ඊට පස්සේ ඔවුන් බලාපොරොත්තු වන්නේ කොහොම හරි තමන්ගේ බලාපොරොත්තු ඉෂ්ට කර ගන්නටයි. මම එක රහසක් කියන්නම්. අද වර්තමාන අධ්‍යාපන ඇමති තුමා වටා ඉන්න නිලධාරීන්ම තමයි, එදා හිටපු ඇමතිවරයා වටකරගෙන හිටියේ. ඒ කාලයේදී ඔවුන් හිටපු ඇමතිවරයාට බොහොම විශ්වාසවන්ත විධියට හිටියා. සමහර විට ඔවුන් කියන හැම දෙයක්ම ඒ ඇමතිතුමා කළා. ඒ නිසා හිටපු ඇමති තුමා අපෙන් බැණුම් පවා ඇසුවා. [බාධා කිරීම්] ආණ්ඩුවේ නිලධාරීන් තමයි. එහෙත් එක මොහොතකින් ඔවුන් වෙනස් කරන්නට බැහැ. එක්කෝ තමුන්නාන් සේට ඔවුන් දක්වන ආදරය බොරු එකක්. එහෙම නැත්නම් ඒ කාලයේ හිටපු ඇමතිතුමාට දැක්වූයේ ව්‍යාජ හිතවත් කමක්. දෙදෙනාගෙන් කාට හෝ දක්වා තිබෙන්නේ බොරු ආදරයක්. එක්කෝ අරයට, නැත්නම් මෙයාට. "දෙදෙනකුට එක වර ආලය කළ නොහැකිය" කියා කියමනක් තිබෙනවා නොවැ? ඒ කියන් නේ ශෘංගාර පැත්තෙන්. අනෙක් පැත්තෙන් කියනවා නම් "දේශපාලන මත දෙකක් එක වර එක පුද්ගලයකුට වැළඳ ගන්නට බැහැ". ධනවාදය එක කෙළවරක්. සමාජවාදය අනෙක් කෙළවර. ඒ කෙළවර දෙක එකට අරගෙන ජීවත් වන්නේ කොහොමද?

තමුන්නාන්සේලා ආණ්ඩු කරන විට අර මන්ත්‍රීවරයාගේ මාර්ගයෙන් හෝ මේ මන්ත්‍රීවරයාගේ මාර්ගයෙන් හෝ මොන මාර්ගයකින් හෝ ඇතැම් අය විශ්ව විද්‍යාල තනතුරුවලට රිංගා ගන්නවා. ඊට පස්සේ කරන්නේ මොනවාදැයි දන්නේ නැහැ. එම නිසා, විශ්ව විද්‍යාලවල කථිකාචාර්ය, මහාචාර්ය, ප්‍රමුඛාචාර්ය ආදි තනතුරුවලට තේරීමේදී ප්‍රතිපත්තිසහගත වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑ. ඒ වැඩ පිළිවෙළ මොකක්දැයි මේ ව්‍යවස්ථාවල සඳහන් විය යුතු බවයි, මා පෙන්වා දෙන්නට උත්සාහ කරන්නේ. මේ ව්‍යවස්ථාවල එවැනි වැඩ පිළිවෙළක් ගැන සඳහන් වී නැත්නම් මහාධිකාරි මණ්ඩල යට පත් වන අයට හිතුවක්කාර විධියට කටයුතු කරන්නට පුළුවන්කම ලැබෙන වා. ඒ, බී, සී, ඩී, ඊ, එෆ් යන පස් හය දෙනා එකතු වී කථිකාචාර්ය, මහාචාර්ය ආදි තනතුරුවලට පුද්ගලයන් තෝරන වා. එහෙත් ඒ තනතුරුවලට අවශ්‍ය සුදුසු කම් මොනවාදැයි පැහැදිලි නැහැ. මොන විෂයයන් පිළිබඳවද උපාධි ලබා ගෙන තිබෙන්නේ, ඒ ගැන ලියා තිබෙන පොත් මොනවාද, කියා පැහැදිලි විස්තරයක් තිබෙන්නට ඕනෑ. උපාධිධරයකු වුණු පළිය ටම ඒ තනතුරු දෙන්නට බැහැ. ඔහු උපාධිය ලබා ගත්තාට පසු කර තිබෙන පර්යේෂණ මොනවාද, ඒවායින් රටටත් ඔහුටත් ලැබී ඇති ප්‍රයෝජනය මොකක් ද? ඒ විධියට සොයා බලන්නට ඕනෑ. ඒවා ගැන කිසි කථාවක් නැහැ. තමා කැමැති පුද්ගලයාට ලකුණු දෙනවා. එය පුද්ගල බද්ධයි නේ?

අධ්‍යාපන ඇමතිතුමා තේරීම් කාරක සභාවේ ලකුණු දෙන ප්‍රධානයා නම් ඒ සභාව ඉදිරියට හබරාදූවේ ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.), වලපනේ මන්ත්‍රීතුමා (වී. බී. එම්. හේරත් මයා.) ගියොත් ලකුණු අඩුවෙන් වැටෙනවා. එය ඒකාධිපතිකයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

මෙයාට 1 යි ; අරයට බිංදුවයි.

**පී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මට එකලු, අරයට බිංදුවලු ! මගේ කිය මන එයින්ම ඔප්පු වෙනවා.

පුද්ගල බද්ධ ක්‍රමය ඉතාමත්ම අහිත කරයි. පාට, උස, මහත ප්‍රමාණය ආදිය අනුව ලකුණු දෙනවා නම් එය අයත් වන්නේ විෂය බද්ධයටයි. විෂය බද්ධය අනුව ලකුණු දීමේදී හිතුවක්කාරකම් කරන්නට පුළුවන්කමක් නැහැ. හබරාදූව ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) අඩි පහ කුත් අඟල් හයක් උස නම් ඒ අනුව ලකුණු ප්‍රමාණයක් දෙන්නට සිදු වෙනවා. දිය යුතුව ඇත්තේ ලකුණු පහ නම් ඒ ගණන දිය යුතුයි. සමහර විට දෙන්නට කැමැති වන්නේ බිංදුව විය හැකි වුවත් ඒ කැමැත්ත අනුව ක්‍රියා කරන්නට පුළුවන් වන්නේ නැහැ. ලකුණු පහක්ම දෙන්නට සිදු වෙනවා. පුද්ගල බද්ධයෙන් අයුක්තිය අසාධාරණය සිදු වන අතර විෂය බද්ධයෙන් එවැන්නක් සිදු වන්නේ නැහැ.

විශේෂයෙන්ම ශිෂ්‍යයන්ගේ බුද්ධිය මැනීමේදී, මානසික ශක්තිය මැනීමේදී, මොලය මැනීමේ පර්යේෂණවලදී පුද්ගල බද්ධය අනුව ප්‍රශ්න නොඇසිය යුතු යයි කියා තිබෙනවා. එසේ ප්‍රශ්න ඇසීමේදී පරීක්ෂකයන්ගේ කැමැත්ත අනුව එක එක්කෙනාට ලකුණු ලැබෙනවා. මේ ක්‍රම යෙන් "එහෙයියන්" පිරිසක් බෝවීම සිදු තයි. ඒ විධියට ගියාම යුක්තිසහගතව ක්‍රියා කරන්නාවූත්, වැඩට දක්ෂවූත් මිනිසුන් බෝ වන්නේ නැහැ. එක ආණ්ඩුව කට බලය තිබෙන විට ඒ ආණ්ඩුවට හිත වත් "එහෙයියන්" පිරිසකුත්, තවත් ආණ්ඩුවකට බලය තිබෙන විට ඊට හිතවත් "එහෙයියන්" පිරිසකුත් පත් කර ගැනීමෙන් නියම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට බැහැ. ජාතිය සංවර්ධනය කරන්නට ඕනෑ නම්, නඟා සිටුවීමට ඕනෑ නම් මේ ක්‍රමය ඉවත් කළ යුතුයි. නිත්‍යානුකූල වූ නිත්‍ය වැඩ පිළිවෙළක් නැත්නම්, සැලැස්මක් මත සකස්වූ යුක්තිසහගත ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් නැත්නම් රට දියුණු කරන්නේ කොහොමද ? මේ තේරීම් කාරක සභා ක්‍රමය ගැන නොව එහි ආකාරය ගැන දැන් බැරි නම් වෙන වේලාවකදීවත් ව්‍යවස්ථා පංක්තියක් මෙම ගරු සභාවට ඉදිරිපත් කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඉදිරිපත් කරනවා. එතකොට ඡන්දය දෙන්නට ඕනෑ.

**පී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

යුක්තිසහගත නම් ඡන්දය දෙන්නම්. ඉතින් ව්‍යවස්ථා පංක්තියක් ඉදිරිපත් කරනවාද ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒ ගැන හිත හිතා ඉන්නවා.

**පී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

හිත හිතා ඉන්නට වයසක් නැති බව ඇමතිතුමා දෙස බැලූ විට පෙනී යනවා. දැන් තියෙන්නේ හිත හිතා ඉන්න නොවෙයි, ක්‍රියා කරන්නටයි. තමුන්නාන්සේයි, අධ්‍යාපන ඇමතිතුමා. වැරද්දක් තිබෙන බව තමුන්නාන්සේට පේනවා. ඒ නිසා වැරද්ද පිළිගෙන තමන් එය නිවැරදි කිරීමට සූදානම් බව අපට කිය නවා නම් විවාදය ඉවරයි. [බාධා කිරීමක්] ව්‍යවස්ථා පංක්තියක් ගෙන ඒම ගැන පොරොන්දුවක් දෙන්නට ඇමතිතුමා නොකැමැතියි. මේ ඇමතිතුමා ව්‍යවස්ථා පංක්තියක් නොගෙනාවත් කවදා හෝ එවැන්නක් ගෙනෙන්නට සිදු වේවි. එසේ නැත්නම් පුද්ගල බද්ධ ක්‍රමය අනුව තම තමන්ට වුවමනා කරන "එහෙයියන්" පත් කර ගැනීමට හැකි වීම නිසා තව තවත් පක්ෂ භජනය වැඩි වෙනවා. පක්ෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උසස් අධ්‍යාපන පනත: නියෝග

[ටී. බී. එම්. හේරත් මයා.]

හජනය වැඩි වන්නට වැඩි වන්නට විශ්ව විද්‍යාලයේ දියුණුව ඇණ හිටිනවා. ඔය විධියට නම් ඔය කියන අවුල් ජාලය ලිහන්නට කවදාවත්ම බැහැ. දැනට ඉගෙන ගන්නා ළමයින් උපාධි ලබාගෙන හෝ නැතිව හෝ පිට වී යාවි. එහෙත් අලුත් අය ආවාමත් ඔය ප්‍රශ්න නැවතත් මතු වේවි. විශ්ව විද්‍යාලයට එන්නන් අතපය විතරක් ගෙන එන නිකමුන් හැටියට සමහරුන් කල්පනා කරනවා. "මේ ළමයින්ට මොනවද තේරෙන්නේ?" යනුවෙන් සමහරුන් කියනවා. එහෙත් ඒ නිගමනය සම්පූර්ණයෙන්ම වැරදියි. මේ රටේ තිබෙන්නා වූ ඉතාමත්ම හොඳ මොල ටිකයි, විශ්ව විද්‍යාලයට එන්නේ. හැම පැත්තෙන්ම තෝරා ගනු ලැබූ අයයි, විශ්ව විද්‍යාලයට එන්නේ. ඒ වාගේම මේ රට අනාගතයේදී පාලනය කරන්නෙත් ඒ අයයි. මේ රට ගමන් කර විය යුත්තේ මොන ආකාරයටදැයි තීරණය කිරීමට ඔවුන්ට අයිතියක් තිබෙනවා. ඒ අයිතිය තිබෙන්නේ ඇමතිතුමාට හෝ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට හෝ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ට හෝ නොව මේ තරුණ පරම්පරාවටයි.

සමහරුන් ඇමෙරිකාව දෙසට මේ රට අදින්නට පුළුවනි. තවත් සමහරුන් තව තවත් දෙසකට අදින්නට පුළුවනි. කවුරුන් කොහාට ඇද්දත් ඒ උගත් තරුණයන්ට වුවමනා පැත්තටයි මේ රට ගෙනයන්නට පුළුවන් වන්නේ. ඒ නිසා විශ්ව විද්‍යාලවල තනතුරු පිරවීමේදී යම් යම් පුද්ගලයන් සතුටු කරන්නට යෑමෙන් භයානක ප්‍රතිඵල ඇති වන බව කල්පනා කර බලන ලෙස මා ඉල්ලා සිටිනවා.

විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රීය නොවන තනතුරු.

"විශ්ව විද්‍යාලයක ශාස්ත්‍රීය නොවන තනතුරක් සඳහා වූ සෑම පුරප්පාඩුවක්ම ඒ විශ්ව විද්‍යාලයේ මහාධිකාරී මණ්ඩලය විසින් තීරණය කළ හැකි යම් ආකාරයකට දැන්වීම් මගින් ප්‍රසිද්ධ කළ යුතුය. ප්‍රසිද්ධ දැන්වීමෙහි සඳහන් සුදුසුකම් සහ නියමයන් හා කොන්දේසි සඳහා මහාධිකාරී මණ්ඩලයේ පූර්ව අනුමතිය ලබා තිබිය යුතුය."

මහාධිකාරී මණ්ඩලයේ පූර්ව අනුමැතිය අරගෙන මහාධිකාරී මණ්ඩලය දැන්වීමක් ප්‍රසිද්ධ කරනවා. මේ ව්‍යවස්ථාවෙන් පැහැදිලි වී තිබෙන්නේ එයයි. දැන් මා ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා. මහාධිකාරී මණ්ඩලය වැරදි විධියක තීරණයක් අරගෙන වැරදි විධියක දැන්වීමක් ප්‍රවෘත්ති පත්‍රවල ප්‍රසිද්ධ කළොත් ඒ වරද හරිගස්සන්නට ගරු ඇමතිතුමා කර ඇති යෝජනාව කුමක්ද? මේ ව්‍යවස්ථාවෙන් එය පෙන්වා දෙන්න. විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරී වරදක් කළාය, වැරදි විධියට වැරදි කෙනෙක් බඳවා ගත්තාය කියා ගරු ඇමතිතුමාත් කිව්වා. ගරු ඇමතිතුමා බලතල පාවිච්චි කර පසුව එයා ආපසු යැව්වා. එහෙත් මේ ව්‍යවස්ථාව යටතේ මේ මහාධිකාරී මණ්ඩලය විසින් සුදුසුකම් මෙන්න මේවාය කියා දැන්වීමක් ප්‍රසිද්ධ කර ඉල්ලුම් පත්‍ර කැඳවා යමෙක් තෝරාගෙන පත් කළොත්, එසේ පත් කරනු ලැබුවේ වැරදි කෙනෙක් නම්, ඒ ගැන ගරු ඇමතිතුමාට කරන්නට පුළුවන්කම තිබෙන්නේ මොකක්ද? එය අවලංගු කරන්නට බලයක් එතුමාට නැහැ. එවැනි බලයක් ජාතික උසස් අධ්‍යාපන සභාවටත් නැහැ. මේ ව්‍යවස්ථාව අනුව වැරදි විධියකට පත්වීමක් කළොත් එය හරිගස්සන්නට බලයක් ගරු ඇමතිතුමාට නැහැ. ප්‍රවෘත්ති පත්‍රවල පළ කළ යුතුයි කියා ඊළඟට කියනවා පළ නොකර වුණත් පුළුවන්ය කියා. එතනින් ඉඩක් දුන්නා. එහෙත් වැරදි ආකාරයකට කළොත් මෙන්න මේ දේ කරනවාය කියා කිසිවක් මෙහි නැහැ. ඒ නිසා මේ ව්‍යවස්ථාවෙන් කර තිබෙන්නේ වැරදි කරන අයට තව තවත් අනුබල දීමයි. සමහර විට කාට හෝ පත්වීමක් දෙන්නය කියා ගරු ඇමතිතුමා කිව්වොත් ඒ පත්වීම කරාවි. මේ ඇමතිතුමා නම් එහෙම කරනවාද නැද්ද කියා මා දන්නේ නැහැ. හැබැයි ඇමතිතුමා එක් කෙනෙක් ඇතුළු කරන විට මහාධිකාරී මණ්ඩලය හත් අට දෙනෙක් ගනීවි. ඇමතිතුමාටත් ඒ ගැන යමක් කියන්නට බැහැනේ. කොහොමද ගත්තේ කියා ඇසුවොත් කියාවි "ඇමතිතුමා කී නිසා අරයා ගත්තා; මගේ වුවමනාවට මෙයා ගත්තා" කියා. ඉන් එහාට කථා කරන්න ඇමතිතුමාටත් පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඇමතිතුමාගේ ආරක්ෂාවටවත්, වැරදි විධියට කළොත් මෙන්න මේක කරනවාය කියා මෙයට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වගන්තියක් ඇතුළත් කර ගන්නට තිබුණා. අන්න ඒකයි අපි කියන්නේ මේ ව්‍යවස්ථා මාලාව අසම්පූර්ණ එකක් ය කියා. කරුණාකර මෙය ඉල්ලා අස් කර ගෙන විශ්ව විද්‍යාල කොමිෂන් සභාවේ වාර්තාව ගැනත් සලකා බලා හොඳින් කල්පනා කරන්නට පුළුවන් අය ලවා නැවත වරක් කාටත් පිළිගන්නට පුළුවන් ව්‍යවස්ථා මාලාවක් සකස් කරවා ඉදිරිපත් කරන්නය කියා අපි නැවත නැවතත් කියන්නේ ඒ නිසයි. ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ ඇතැම් රෙගුලාසි තත්පර ගණනකදී සම්මත වී තිබෙනවා. කවුරුවත් කථා කළේ නැහැ. සුදුසු ඒවා ඒ විධියට සම්මත කරනවා. නුසුදුසු ඒවාත් ඒ අන්දමට සම්මත කරන්නය කියා ගරු ඇමතිතුමා අපට බල කරනවා නම් ඒක හරි නැහැ. ඒ නිසා ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. ගරු ඇමතිතුමාගේ අදහස හොඳ වෙන්න පුළුවන්. එහෙත් ඒ අනුව මේ රෙගුලාසි සකස් වී නැහැ. ඒ නිසා මේවා ගැන නැවතත් කල්පනා කර බලා මේ කටයුත්ත හරියට කරන්නට පුළුවන් අන්දමේ ව්‍යවස්ථා මාලාවක් මේ ගරු සභාවට ඉදිරිපත් කිරීමට මහන්සි ගන්නය කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

I do not propose to reply.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

**කථානායකතුමා..**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! The Sitting is suspended till 4.30 P.M.

On resumption the Hon. Deputy Speaker will preside.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 4.30 ට [ශ්‍රීමත් රසීක් ෆරීඩ්, ඕ. බී. ඊ.] නියෝජ්‍ය කථානායකතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

அதன்படி அமர்வு இடை நிறுத்தப்பட்டு, மீண்டும் பி. ப. 4.30 மணிக்கு ஆரம்பமாயிற்று. உப சபாநாயகர் [ஸ்ரீமான் ரசிக் பரீத், ஓ.பி.ஈ.] அவர்கள் தலைமை தாங்கினார்கள்.

*Sitting accordingly suspended till 4.30* P.M. *and then resumed,* MR. DEPUTY SPEAKER [SIR RAZIK FAREED, O.B.E.] *in the Chair.*

## උසස් අධ්‍යාපන පනත: නියෝගය

**உயர் கல்விச் சட்டம்: பிரமாணம்**

## HIGHER EDUCATION ACT: REGULATION

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"1966 අංක 20 දරණ උසස් අධ්‍යාපන පනතේ 33, 63 හා 64 වන වගන්ති යටතේ ජාතික උසස් අධ්‍යාපන සභාව විසින් සම්පාදිතව, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති වන මා විසින් පූර්වෝක්ත පනතේ 33 (3) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අනුමත කරන ලදුව, 1967 සැප්තැම්බර් මස 13 වැනි දින අංක 14,765/9 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 1967 ඔක්තෝබර් මස 21 වැනි දින ඉදිරිපත් කරනලද නියෝගය අනුමත කළ යුතු ය."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව ගැන විස්තර කරන්නට කියන්නට තිබෙන්නේ මෙපමණයි:

"1966 අංක 20 දරන උසස් අධ්‍යාපන පනත යටතේ සම්පාදිතව, 1966 දෙසැම්බර් 21 වන දිනය හා අංක 14,726/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නියෝගවල 3 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අතුරු විධානය යෙදී මෙන් ඒ නියෝගය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

එසේ වුවද විශේෂ කරුණු අනුව, එක්තරා අවස්ථාවක, ඉහත සඳහන් කරනු ලැබූ සාමාජිකයන්ගෙන් සමන්විත තේරීම් කාරක සභාවක් පත් කළ නොහැකි බව ජාතික උසස් අධ්‍යාපන සභාවට ඒත්තු ගිය කල්හි ජාතික උසස් අධ්‍යාපන සභාව විසින්, යෝජනාවක් මගින් තේරීම් කාරක සභාවේ සංයුතිය වෙනස් කළ හැකිය."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

පොඩි සංශෝධනයක් කරන්නට තිබෙන්නේ. දකුණු කොළඹ සම මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) එදත් මේ ගැන සඳහන් කළා. අද ඒ ගැන වැඩි දුර යමක් කියන්නට නැතැයි මා කල්පනා කරනවා.

**ලෙස්ලි ගුණවර්ධන මයා.** (පානදුර)

*(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை)*

(Mr. Leslie Goonewardene—Panadura)

කරන්නට බැරි දෙයක්ද දැන් සම්මත කරගෙන තිබෙන්නෙ ?

**ගරු ඊරියගොල්ල**

*(கௌரவ ஈரியகொல்ல)*

(The Hon. Iriyagolle)

අපේ දේශපාලනඥයන් මොන මොන අදහස් ඉදිරිපත් කරයිද දන්නෙ නැහැ නොවැ. ඒ කියන විධියට සකස් කරන්නට බැරි වුණු අවස්ථාවකදී ඊට ගැළපෙන පරිද්දෙන් කටයුතු කිරීමට මහාධිකාරි මණ්ඩලයට බලතල දීමයි, මෙයින් බලාපොරොත්තු වන්නේ.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

*வினா எடுத்தியம்பப் பெற்றது.*

***Question proposed.***

අ. භා. 4.37

**බර්නාඩ් සොයිසා මයා.** (දකුණු කොළඹ)

*(திரு. பேர்னட் சொய்ஸா—கொழும்புத் தெற்கு)*

(Mr. Bernard Soysa—Colombo South)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඉදිරිපත් කරන සෑම රෙගුලාසියක්ම මතක තබාගෙන යම්කිසි රෙගුලාසියක් ගැන අප විස්තර ඉල්ලූ විට ඒ විස්තරය කිරීමට නොහැකි වීම ගැන ගරු ඇමතිතුමාට දොස් කියන්නට අපට පුළුවන්කමක් නැහැ. ඉදිරිපත් කර තිබෙන මේ රෙගුලාසිවල අවුල් වියවුල් තිබෙන බව ඔප්පු කිරීමට තව දුරටත් සාක්ෂි වුවමනා කරනවා නම් ඒ සඳහා ගරු ඇමතිතුමා රෙගුලාසි මාලාව ඉදිරිපත් කරද්දී කිසිම විස්තරයක් ඒ ගැන කරන්නට අපොහොසත් වීමම ඊට සෑහෙතැයි කියන්නට පුළුවනි. ඒ කොයි හැටි වෙතත් ඒ ගැන ගරු අධ්‍යාපන ඇමතිතුමාට මා දොස් කියන්නේ නැහැ.

**ගරු ඊරියගොල්ල**

*(கௌரவ ஈரியகொல்ல)*

(The Hon. Iriyagolle)

ඉතින් එහෙම නම් ඔය තරම් දිගින් දිගට කථා කරන්නේ මොකද ?

**බර්නාඩ් සොයිසා මයා.**

*(திரு. பேர்னட் சொய்ஸா)*

(Mr. Bernard Soysa)

ගරු අධ්‍යාපන ඇමතිතුමාට මෙවැනි රෙගුලාසි ඉදිරිපත් කිරීම ගැන බැණුම් අහන්නට සිදු වෙතත් ඒ ගැන සම්පූර්ණ වැරදිකාරයා නම් එතුමා පමණක් නොවෙයි. ගරු අධ්‍යාපන ඇමතිතුමා නීතිඥ වෘත්තියට අයත් කෙනකු නොවෙයි. මාත් නීතිඥයකු නොවෙයි. වෙනත් ස්ථානයක සකස් කළ රෙගුලාසි පිළිබඳව වගකීම භාර ගන්නට අපටත් සිදු වෙනවා. ඒ වගකීම ඇතිවයි ගරු ඇමතිතුමා මේවා මෙතැන ඉදිරිපත් කරන්නේ. යම්කිසි විධියක "බැණීමක්" කරන්නට අපට සිදු වන්නේ ඒ තත්ත්වය උඩයි. ඒ කොයි හැටි වෙතත් මේවායේ වැරද්ද තිබෙන්නේ මෙතැන නොවන බවත් අප දන්නවා. මෙය සකස් කළ පුද්ගලයන් අත තමයි වරද තිබෙන්නේ.

**ගරු ඊරියගොල්ල**

*(கௌரவ ஈரியகொல்ல)*

(The Hon. Iriyagolle)

ගරු මන්ත්‍රීතුමා කලිනුත් එය කිව්වා. මාත් එය පිළිගන්නවා.

**බර්නාඩ් සොයිසා මයා.**

*(திரு. பேர்னட் சொய்ஸா)*

(Mr. Bernard Soysa)

එහෙත් මෙය මතක් කළ යුතුම දෙයක්. ඒ නිසා මතක් කළ යුතුමයි. සම්පූර්ණ හිස් කථාවක් නොවෙයි. මේ ප්‍රශ්නයටත් අදාළ කරුණු ඉදිරිපත් කර විටින්විට දෙතුන් වරක් කථාකර තිබෙනවා. මේ ගරු සභාවේදී පසුගිය අවස්ථාවේ පැය එක හමාරක් පමණ වේලාවක් කථා කළා. විශේෂ උත්සාහයක් ඇතිව විශේෂ කරුණු රාශියක් ඉදිරිපත් කළා. වෙනස් කථාත් ඇති වුණා. එහෙත් ගරු ඇමතිතුමා ඒ කරුණුවලට වචනයකින්වත් පිළිතුරු දුන්නේ නැහැ. මා ඉදිරිපත් කළ තර්කය එසේ නොවෙයි නම් කෙසේදැයි පෙන්වා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දීමටවත් එතුමා පිළිතුරු කථාවක් කළේ නැහැ. මා ඉදිරිපත් කළ කරුණුවල යම් හරයක් තිබෙන බවක් කියන්නටවත්, එසේත් නැත්නම් මා පෙන්නුම් කළ තත්ත්වය හරිගස්සන්නට මේ මේ දේ කරන්නට බලාපොරොත්තු වෙනවාය කියන්නටවත් එතුමා යමක් කිව්වේ නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

මේ කියන කාරණය සම්පූර්ණයෙන්ම විමසා බලා යම් යම් අඩුපාඩුකම් තිබෙනවා නම් ඒ හැම දෙයක්ම සකස් කරන්නට බලාපොරොත්තු වෙනවා. ඒ අවස්ථාවේදී ගරු මන්ත්‍රීතුමා සමගත් සාකච්ඡා කරන්නට බලාපොරොත්තු වෙනවා. එය ඒ තරම් බරපතළ කාරණයක් නොවෙයි නොවැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු ඇමතිතුමා යම් ඉල්ලීමක් කරනවා. ඊට බැහැයි කියන්නට මා අකැමැතියි. ඒ කෙසේ වෙතත් මගේ කනගාටුව ප්‍රකාශ කරන්නට සිදු වී තිබෙන්නේ මා පැය එක හමාරක් පමණ කළ විවේචනවලට පිළිතුරක් නොලැබීම ගැනයි. අද රෙගුලාසිවලින් තමයි රට පාලනය කරන්නේ. පාර්ලිමේන්තුව රැස්වෙනවා. පනත් සම්මත කරනවා. ගරු ඇමතිතුමාට බලය දෙනවා. ඊට පස්සේ සිදු වන්නේ කුමක්ද? ඊට පස්සේ ඕනෑම දෙයක් කරන්නට පනත යටතේ රෙගුලාසි පනවනවා. රෙගුලාසි මගින් බලය ලබා ගන්නවා. ඔය විධියට රෙගුලාසි මගින් පාලනය කරන්නට නම් අපේ බලයක් අවශ්‍ය නැහැ. අපෙන් අවසරයක් වුවමනා කරන්නේ නැහැ. රෙගුලාසි පනවා ඒ අනුව වැඩ කටයුතුත් එක්තරා ප්‍රමාණයකට කළායින් පසු තමයි සාකච්ඡා කරන්නේ. අද සම්මත කර ගත් රෙගුලාසි මාලාව ගැන සිතා බලන්න. ඒවා සාකච්ඡාවට භාජන කරන ලද්දේ ගැසට් නිවේදනයකින් ප්‍රසිද්ධ කර අවුරුද්දකටත් පසුවයි.



**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අවුරුද්දකටත් වැඩියි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගිය අවුරුද්දේ දෙසැම්බර් මාසයේ සිටයි ක්‍රියාත්මක වුණේ. සංශෝධනයක් කර, සංශෝධනය පවා ක්‍රියාත්මක කර තිබෙනවා. ගරු ඇමතිතුමා ගිය වතාවේදී පාපෝච්චාරණයකුත් කළා, මා දන්නේ නැහැ කියා. ඒ නොදැකපු නීතිත් දැන් සංශෝධනය වී ක්‍රියාත්මක වී තිබෙනවා. එහෙත් අද මේ ගරු සභාව රැස් වී මෙම රෙගුලාසිවලට අපේ එකඟත්වය ඉල්ලනවා. මේක විහිළුවක්; මේ ගරු සභාවට කරන අගෞරවයක්; අපේ කාලය වුවමනා නැතිව ගත කිරීමක්. මේ විධියට රට පාලනය කරනන්ට ආණ්ඩුව අදහස් කරනවා නම් අප වුවමනා නැහැ. ඉදිරියට එන පනතක් ගැන කතා කරන්නට පිළිවෙළක් නැතැයි ගරු රාජ්‍ය ඇමතිතුමා—දකුණු කොළඹ මගේ සහකාර ගරු මන්ත්‍රීතුමා—කිව්වා. ඒ පණතේත් මේ දෝෂයම—රෙගුලාසි හා නියෝග මගින් පාලනය කිරීමේ දෝෂයම—තිබෙන බව පමණයි මා කිව්වේ. රටේ පාලනය දැන් සම්පූර්ණයෙන්ම වාගේ කෙරෙන්නේ රෙගුලාසි හා නියෝගයන් මගිනුයි. එහෙම නම් මේ සභාව වුවමනා නැහැ. සෙනෙට් සභාව නම් කොහොමත් වුවමනා නැති බව අපි පිළිගන්නවා. මේ මන්ත්‍රී මණ්ඩලයත් වුවමනා නොවන තැනටයි දැන් එන්නේ.

ගරු අධ්‍යාපන ඇමතිතුමා රටේ අධ්‍යාපනය පිළිබඳව පණතක් මේ ගරු සභාවට ගෙනාවා. එලිසබෙත් මහ රැජිනයි අරවයි මේවයි ඇතුළු මුල් වගන්ති කීපය කියවූවාට පසු එම පණතෙහි තිබෙන්නේ, රටේ අධ්‍යාපනය සකස් කිරීම සඳහා රෙගුලාසි සෑදීමට ගරු අධ්‍යාපන ඇමතිතුමාට බලය දී තිබෙන බවයි. සංචාරක වැඩ කටයුතු සංවර්ධනය කිරීම සඳහා මණ්ඩලයක් පත් කොට එහි වැඩ කටයුතු කිරීමේ සම්පූර්ණ බලය රෙගුලාසි මගින් ගරු රාජ්‍ය ඇමතිතුමාට දෙනවා. මේ විධියට රෙගුලාසියත් නියෝගත් අනුව වැඩ කරගන යනවා නම් මේ ගරු සභාවවත් අපවත් වුවමනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]
නැහැ. ඒ තත්ත්වයටයි අද ක්‍රමක්‍රමයෙන් ඇවිත් තිබෙන්නේ. මේ කරුණු මතු කර මින් උදාහරණ රාශියක් අප ගරු ඇමති තුමාට පෙන්වා දුන්නා. මෙහි දුර්වලකම් සියල්ලම පෙන්වා දුන්නා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
රෙගුලාසි ගැන දැන් පැය 5 ක් තිස්සේ කථා කර තිබෙනව.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
මා කථා කළේ පැය එකහමාරයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
මන්ත්‍රීවරුන් කීප දෙනකුම කථා කළා. ඒ එක් එක් කථාවෙන් අනෙක් අනෙක් කරුණු කියවුණා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) 3.58ට එතුමාගේ කථාව අව සාන කළා. ඒ අවස්ථාවේදී ගරු ඇමතිතුමා නැගිට, "පිළිතුරු දෙන්නට වුවමනා නෑ, ඡන්දය විමසමු"යි කිව්වා. මා මෙපමණ මහන්සි වී——

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
මේවා හදන්න අප කොච්චර මහන්සි වුණාද ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
—හොයාගෙන ගරු ඇමතිතුමාට ඉදිරි පත් කරන ලද කරුණු ගැන එක වචන මාත්‍රයක්වත් එතුමා කිව්වේ නැහැ. වෙනත් ඇමතිවරුන් නම් "අවධානය යොමු කර නවා" යන ටිකවත් කියනවා. මෙතුමා ඒකවත් කිව්වේ නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
සාකච්ඡාව පැවැත්වෙද්දීම, ඉදිරිපත් වුණු යම් යම් ප්‍රශ්නවලට පිළිතුරු දුන්නානේ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
ඔහොම වරින් වර නැගිට දෙන පිළිතුරු වලින් සෑහීමට පත් වන්නට අපට බැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
තදින්ම අවධානය යොමු කරනවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
හරස් කතා නම් ඕනෑ තරම් හැන්සාඩ් වාර්තාවල තිබෙනවා. මා ගරු ඇමතිතුමා ගෙන් ඉල්ලීමක් කරන්නට අදහස් කොට ඒ සඳහා මුල පුරමින් කීවේ, එතුමාත් කිසියම් කාලයක තරුණයකු වශයෙන් සිටින්නට ඇති බව මා විශ්වාස කරන වගයි. ගරු ඇමතිතුමා ඊට "ඔව්" කිව්වා. "එතුමා කවදාවත් එහෙම හිටියේ නැහැ'යි ඊළඟට මැද කොළඹ තුන්වැනි ගරු මන්ත්‍රී තුමා (පී. ජී. බී. කෙනමන් මයා.) කිව්වා. "මා තරුණයකු වශයෙන් සිටි බව මට මත කය" යි ඒ අවස්ථාවේදී ගරු ඇමතිතුමා කියා සිටියා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
යන්තම් හීනෙන් වාගේ මතකයි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
ඒ හීනය දැන් විශ්ව විද්‍යාල ශිෂ්‍ය යින්ට "නරක හීනයක්" වී තිබෙනවා, කොසොල් රජ්ජුරුවන්ගේ ස්වප්න වාගේ.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රෙගුලාසි ක්‍රියාත්මක කරන්නේ කොහොමද? තව අවුරුද්දක් දෙකක් යන විට මේවා තේරුම් ගන්නට අටුවා ටීකා ලියන්නට සිදු වෙනවා. මෙහි 3 වැනි රෙගුලාසියෙන් කියැවෙන්නේ, මහාචාර්ය නිලය හැර අනෙක් නිලයකට—ගුරු නිලයකට—යම් කෙනකු පත් කිරීමේදී තේරීම් කාරක සභාවක් තිබිය යුතු බවයි. මේ තේරීම් කාරක සභාව පත් කරන්නේ පාලක සභාවයි. පාලක සභාව විසින් සකස් කරන තේරීම් මණ්ඩලය ඉල්ලුම්පත් පරීක්ෂා කර බලා තෝරා ගනු ලබන අය අතුරෙන් කෙනකු පත් කරනවා. ඒකයි පිළිවෙළ.

දැන් ඇමතිතුමා ගෙනා සංශෝධනයෙන් කියන්නෙ මොකක්ද?

“එසේ වුව ද විශේෂ කරුණු අනුව, එක්තරා අවස්ථාවක, ඉහත සඳහන් කරනු ලැබූ සාමාජිකයන්ගෙන් සමන්විත තේරීමේ කාරක සභාවක් පත් කළ නො හැකි බව ජාතික උසස් අධ්‍යාපන සභාවට ඒත්තු ගිය කල්හි ජාතික උසස් අධ්‍යාපන සභාව විසින්, යෝජනාවක් මගින් තේරීම් කාරක සභාවේ සංයුතිය වෙනස් කළ හැකිය.”

පත් කිරීමේ බලය දී තිබෙන්නේ පාලක මණ්ඩලයටයි. කවුද බලය දෙන්නෙ? ජාතික උසස් අධ්‍යාපන සභාවයි. උසස් අධ්‍යාපන සභාව සකස් කළ මේ රෙගුලාසිය මගින් පාලක මණ්ඩලයට බලය දෙනව, ගුරුවරුන් පත් කරන්න. ඒ ගුරුවරුන් පත් කිරීමේදී පාලක මණ්ඩලය තේරීමේ කාරක සභාවක් පත් කරනව. තේරීම් කාරක සභාවේ තීරණයන් අනුව තමයි, පාලක සභාව පත් කිරීම් සිදු කරන්නෙ. එහෙත් යම් හෙයකින් මේ සඳහන් කර තිබෙන අන්දමට තේරීමේ කාරක සභාවට උප කුලපති, පීඨාධිපති, පාලක සභාවේ සාමාජිකයන් දෙදෙනෙක් හා සෙනෙට් සභාව විසින් තෝරා පත් කරන ලද විෂය පිළිබඳව විශේෂ දැනීමක් ඇති තිදෙනෙකු පත් කර ගන්ට බැරි වුණොත් ඊළඟට තේරීමේ කාරක සභාව පත් කරන්නෙ උසස් අධ්‍යාපන සභාවයි. ඇයි ඒ බලය පාලක මණ්ඩලයට දෙන්ට බැරි? යම් යම් කරුණු නිසා තේරීමේ කාරක සභාව පත් කරන්ට පාලක මණ්ඩලයට යම් අවස්ථාවකදී බැරි වුණොත් තේරීමේ කාරක සභාව පත් කරන්නෙ ජාතික උසස් අධ්‍යාපන සභාවයි. මේ බල තල නොයෙක් මණ්ඩල වලට පවරා දී තිබෙන ආකාරය ගැන බලන විට පෙනී යන්නේ විශ්ව විද්‍යාල පාලනය පිළිබඳ වගකීම භාර ගන්ට අද කවුරුවත් ලෑහැස්ති නැති බවයි, ගරු ඇමතිතුමනි.

එක රෙගුලාසියකින් යම්කිසි කරුණක් සම්බන්ධයෙන් පාලක මණ්ඩලයට බලය දෙනව. පසුව ඒකට උප වගන්තියක් එකතු කරල කියනව. යම් හෙයකින් මේ විධියේ අංග සම්පූර්ණ තත්ත්වයක් නොතිබුණොත් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම තවත් මණ්ඩලයකට පවරනවා එතැනත් සුළු පළුද්දක් තිබුණොත් ඉන් එහා මණ්ඩලයක් පත් කරනව. සෙනෙට් සභාවෙන් පාලක මණ්ඩලයට යනව. පාලක මණ්ඩලයෙන් උසස් අධ්‍යාපන සභාවට යනව. උසස් අධ්‍යාපන සභාවෙන් ගරු ඇමතිතුමාට එනව. මේ විසිරී තිබෙන අන්දම අනුව සිදුවී තිබෙන්නෙ මේ පාලනය භාර වී තිබෙන එකම මණ්ඩලයක්වත් වගකීම් භාර ගැනීමට සූදානම් නැති තත්ත්වයක තිබීමයි. වගකීම් භාර ගැනීමට අකැමැත්තක් තිබෙනව. අප කෙරෙහි විශ්වාසයක් නැහැ කියන හැඟීම ඒ උදවිය තුළ තිබෙනව. ඔවුන් යම් දෙයක් කරන්ට යන විට “මේක කරන්ට තමුසෙලට බලයක් නැහැ” කියා උප වගන්තියක් පෙන්වන්ට පුළුවන් යයි ඔවුන් හිතනව. [බාධා කිරීමක්].

ඇමතිතුමා දැන් වාඩිවෙලා ඉඳගෙන මට පිළිතුරක් දුන්නනෙ. මේ කාරණය කිව්වාම ඇමතිතුමා ගත්තෙ නැහැ කිව්ව. මම නිදර්ශනයක් දෙන්නද? කොළඹ විශ්ව විද්‍යාලය පටන් ගැනීමේදී එහි පාලක මණ්ඩලය පත් කළේ කවුද? පනතේ හැටියට පත් කරන්ට බලය තිබෙන්නෙ ජාතික උසස් අධ්‍යාපන සභාවටයි. එහෙත්, මම වැරදියි කියනව ගරු ඇමතිතුමා හරියි කියනව. ඒ ප්‍රශ්නය ගැන දැන් මම මෙතැන කථා කරන්ට යන්නෙ නැහැ. පනතේ වෙන වගන්තියක් පෙන්නල, සංක්‍රමණීය තත්ත්වයට ගැළපෙන වගන්තිය යටතේ ගරු ඇමතිතුමාට බලය පැවරී තිබෙනවා යයි හිතාගෙන පාලක මණ්ඩලය පත් කළා. තමුන්නාන්සේගේ මුල් පනතේ සිට අන්තිම රෙගුලාසිය දක්වා තත්ත්වය මේකයි. එක රෙගුලාසියකින් සෙනෙට් සභාවට යම් කරුණක් ගැන බලය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

දෙනව. තවත් රෙගුලාසියකින් කියනව, මේ විධියේ විශේෂ කරුණු අනුව සෙනෙට් සභාවට ඒ සම්බන්ධයෙන් ක්‍රියාකරන්ට බලය නැහැ, බලය තිබෙන්නෙ පාලක මණ්ඩලයටයි කියා. තවත් විශේෂ කරුණු වගයක් තිබෙනව, ඒ අනුව බලය පැවරෙන්නෙ ජාතික උසස් අධ්‍යාපන සභාවටයි. තවත් විශේෂ කරුණක් තිබුණොත් ඒ බලය පැවරෙන්නෙ ගරු ඇමතිතුමා වෙතයි. මේ අනුව කවුරුවත් වගකීමක් භාර ගන්ට ලැහැස්ති වෙන්නෙ නැහැ. මේ දැන් සංශෝධනය කරන්ට යන්නෙ දැන් පික වේලාවකට කලින් සම්මත කර ගත්ත නියෝගවල 3 වෙනි ඡේදයයි. මේ තුන්වන ඡේදයෙන් තේරීමේ කාරක සභාවක් පත් කරන්නට යනවාය කියනවා. ඒ තේරීමේ කාරක සභාව පත් කරන්නේ විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලයයි. යම් හෙයකින් ඒ තේරීමේ කාරක සභාව ඒ හැටියට පත් කරන්නට අපොහොසත් වුණොත්—උප කුලපතින් වහන්සේ හෝ වෙනත් කෙනෙකු හෝ නොසිටීම නිසා—ඒ හැටියට තේරීමේ කාරක සභාව පත් කරන්නට නොහැකි වුණොත් ඒ තේරීමේ කාරක සභාව අමුතුවෙන් සකස් විය යුත්තේ කෙසේද කියා කියන්නේ කවුද ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ජාතික උසස් අධ්‍යාපන සභාව.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඇයි පාලන මණ්ඩලයට ඒක කරන්නට බැරිද ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ගුරුවරුන් තේරීම පිළිබඳව ක්‍රම සම්පාදනය කරන්නේ ජාතික උසස් අධ්‍යාපන සභාවයි. ඒ ක්‍රමය අනුව ගුරුවරුන් පත් කිරීමේදී මහාධිකාරී මණ්ඩලයට සම්පූර්ණ බලතල තිබෙනවා. නමුත් ඒ ක්‍රමය අනුව යමෙකු පත් කරන්නට බැරි වුණොත්—මා අවස්ථාවකුත් කියන්නම්—

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඒක නොවෙයි මෙතැන කියන්නෙ. පත් කිරීමට ගිහින් නැහැ තවම. ඉල්ලුම් පත්‍ර සලකා බැලීමට පත් කරන තේරීමේ කාරක සභාව මේ තුන්වන වගන්තියේ කියා තිබෙන පිළිවෙලට සකස් කර ගන්නට බැරි වුණොත් ඊළඟට තේරීමේ කාරක සභාව පත් කරන්නේ ජාතික උසස් අධ්‍යාපන සභාවයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

පත් කළ යුතු විධිය කියනවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඇයි පාලක මණ්ඩලයට බැරි ඒ වැඩේ කරන්නට ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ගරු මන්ත්‍රීතුමා කාටවත් නොතේරෙන විධියට කරුණු අවුල් කරනවා පමණයි. මේකෙ තේරීමේ ක්‍රමය සකස් කරන්නේ උසස් අධ්‍යාපන මණ්ඩලයයි. ඒක ක්‍රියාත්මක කරන්නේ මහාධිකාරී මණ්ඩලයයි. නමුත් ඒ තේරීමේ ක්‍රමය අනුව, කලින් කී අන්දමට පත්වීමක් කරන්නට බැරි අවස්ථාත් තිබෙනවා. දැන් අර විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ විද්‍යා අංශයට ඩීන් කෙනෙකු නැහැ. එවැනි අවස්ථාවක් ඇති වුණොත් අර ක්‍රමය අනුගමනය කරන්නට බැහැ. එවැනි අවස්ථාවකදී තේරීමේ මණ්ඩලය සකස් විය යුත්තේ මෙහෙමයි කියා කියන්නට උසස් අධ්‍යාපන සභාවට පුළුවනි. එහෙම නැතිව උසස් අධ්‍යාපන සභාව තෝරනවා නොවෙයි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

මා දන්නවා ඒක. තෝරන්නේ නෑ. තේරීමේ කාරක සභාව සකස් කිරීමේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උසස් අධ්‍යාපන පනත: නියෝගය

තත්ත්වය පමණයි මෙතැන තිබෙන්නෙ. එවැනි අවස්ථාවකදී ඒ බලය මේ පාලක මණ්ඩලයට නොදෙන්නේ ඇයි?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
මුලින් බලය දෙන පක්ෂයටම ඒක පැවරීම වඩා හොඳ නොවැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
මේ වැඩේ කරන්නෙ හොඳ සිතින් වෙන්නට පුළුවනි. නමුත් මේ පනත යටතේ කටයුතු කරගෙන ගියොත් තව අවුරුද්දකින් දෙකකින් සෑම ප්‍රශ්න යකටම පිළිතුරු සොයන්නට, නීත්‍යානුකූල තත්ත්වය කුමක්ද කියා සොයන්නට නීති පරීක්ෂක සභාවක් පත් කරන්නට සිදුවන තත්ත්වයක් පහළ වෙන්නට පුළුවනි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
මේ අවස්ථාවේදී උත්තර දුන්නොත් පසුව උත්තර නොදෙන්නයි මා අදහස් කරන්නෙ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
මා එදා කළ කථාවට දීර්ඝ පිළිතුරක් දෙනවාය කියා තමුන්නාන්සේ පොරොන්දු වුණා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
හිටියෙ නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
තමුන්නාන්සේට දැන් ඒ වගකීමෙන් ගැලවෙන්නට බැහැ.

රෙගුලාසි සාදන මණ්ඩලයත් රෙගුලාසි නොසාදන මණ්ඩලයත් යනුවෙන් දෙකක් තිබෙනවා. අද විද්‍යෝදය විශ්ව විද්‍යාලය පිළිබඳව කණගාටුදායක තත්ත්වයක් පැන නැඟී තිබෙනවා. මේ විධියේ රෙගුලාසි නිසා තමයි එවැනි තත්ත්වයන් ඇති වෙන්නෙ. මේ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම භාර දී තිබෙන්නේ සමහර විට අනුකම්පාවක් නොමැතිව පාලනය කරන නිලධාරීන්ටයි. මා කැමති නැහැ මෙතැනදී පුද්ගලයින් විවේචනය කරන්නට. නමුත් ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ උප කුලපතීන් වහන්සේගේ ක්‍රියා පටිපාටිය පිළිබඳව නම් වෙන යමක් නොකිව්වත් අපේ බලවත් කණගාටුවවත් ප්‍රකාශ කරන්නට ඕනෑ. ඇමතිතුමාම නොදන්නා කාරණයක් තිබෙනවා. ඇමතිතුමා මා සමග පැය භාගයක් වාඩි වුණොත් මා එය ඔප්පු කරන්නම්. එක් කාරණයක් පිළිබඳව එතුමාම කී කරුණු සත්‍යයෙන් තොර බව එතකොට පෙනෙයි. ඒ ඉල්ලීම් අතර දෙන්නට පුළුවන් ඉල්ලීම් තිබෙනවා. දෙන්නට බැරි ඒවාත් තිබෙනවා. ඒක වෙනම කාරණයක්. සමහර ඉල්ලීම් වැරදි වන්නට පුළුවනි. ඒවා රචනා කර තිබෙන පිළිවෙල වැරදි වන්නට පුළුවනි. ඒවා නැතැයි කියන්නේ නැහැ.

එහෙත් ඉල්ලීම පැන නගින්නේ විශේෂ දුක්ගැනවිලි උඩයි. ඒ දුක්ගැනවිලි පිළිබඳ ඉල්ලීම් සියල්ලම දෙනවා යැයි පොරොන්දු වූ බවයි, කියන්නේ. ඒ ඉල්ලීම් මාලාවට දුන් පිළිතුරු මා බලා තිබෙනවා. සමහර පිළිතුරු මෙහෙමයි: "මේ බලය උප කුලපති ස්වාමීන් වහන්සේ සතුය." ඒකයි, පිළිතුර. විනය සම්බන්ධව උපදේශක සභාවක් ඉල්ලා තිබෙනවා. ඒ උපදේශක සභාව පත් නොකළ යුතු නම් නොකළ යුත්තේ මන්දැයි කියන්නට ඕනෑ. එසේ නම් වෙනත් විධියකට පත් කරන්නට පුළුවන් යයි කියන්නට පුළුවනි. ඒ එකක්වත් සලකා නැහැ. "පනතේ අසුවල් වගන්තිය අනුව විනය පිළිබඳ බලතල සතුව ඇත්තේ උප කුලපති වහන්සේටයි". එපමණයි පිළිතුර. එයින් සෑහීමකට පත් වන්නේ කවුද?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
කවුද පිළිතුරු දුන්නේ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

උප කුලපති ස්වාමීන් වහන්සේයි. එවැනි පිළිතුරු රාශියක් තිබෙනවා. ශිෂ්‍ය ශිෂ්‍යාවන් කුපිත වුණේ, නොසන්සුන් භාවයකට පත් වුණේ ඒ නිසයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

පනත අනුව විනය පිළිබඳ ප්‍රශ්න අයිති උප කුලපති ස්වාමීන් වහන්සේටයි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඒ බලය පාවිච්චි කිරීමේදී ඕනෑම මණ්ඩලයක් උපදේශක සභාවක් හැටියට පත් කර ගන්නට බැරිද? බලය පාවිච්චි කරන්නේ උප කුලපති ස්වාමීන් වහන්සේ තමයි. එහෙත් "ඒ බලතල පාවිච්චි කිරීමේදී උප කුලපති ස්වාමීන් වහන්සේට සහාය වීම සඳහා අසුවල් විධියෙන් සකස් වුණු උපදේශක මණ්ඩලයක් පත් කරන්නැයි" ඉල්ලීම නීති විරෝධි දෙයක් නොවෙයි; නුසුදුසු දෙයකුත් නොවෙයි. මේ ගැන විස්තර සහිතව කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ.

මා මෙපමණයි, කියන්නේ: මේ විධියේ රෙගුලාසි නිසා යම් විධියක නොසන්සුන් භාවයකට පත් වුණු ශිෂ්‍යයන්ගේ එක ඉල්ලීමක් තමයි, "ඇස්තමේන්තු සැපයීමේදී මෙපමණ කොටසක් අපේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් වෙන් කරන්නැ" යි කීම. එය අසාධාරණයක්ද? ඒ මුදල් දෙන්නේ අධ්‍යාපනය සඳහා නේද? "අසුවල් ඇබෑර්තු පිරවීමේදී ගෙන තිබෙන පියවර වැරදියැයි" පෙන්නීම වරදක්ද? ඒ ඇබෑර්තු තවමත් පුරවා නැහැ. "මේ ඉල්ලීම් මහාධිකාරි මණ්ඩලය ඉදිරියේ තබන්නැ"යි ඉලලීම වැරදිද? විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ මහාධිකාරි මණ්ඩලය පසුගිය තුන් මාසය ඇතුළත කී වරක් රැස්වී තිබෙනවාදැයි මා අහන්නට කැමතියි. රැස් වන්නට කැමැත්තක්වත් නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

රැස් වී තිබෙනවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

මේ ප්‍රශ්න ඉදිරිපත් කර සාකච්ඡාවට භාජන කරලත් නැහැ; ඒ සම්බන්ධයෙන් තීරණයකට බැහැලත් නැහැ. මේකයි තත්ත්වය. එවැනි තත්ත්වයක් උඩ ශිෂ්‍යයන් කෝපයට පත් වීම හිතන්නට අමාරුද?

විද්‍යෝදය විශ්ව විද්‍යාල සීමාව තුළ **පොලිසියක් තිබෙනවා.** එහි ගංගොඩවිල පොලිසිය තිබෙනවා. ඒ පොලිසිය එතැනින් ඉවත් කරන්නැයි කොපමණ කාලයක සිට ඉල්ලා තිබෙනවාද? ඇයි එහි පොලිසියක් තබාගෙන ඉන්නේ? මා පොලිසියට අගෞරවයක් කිරීමට කථා කරනවා නොවෙයි. ගමට නම් පොලිසිය අවශ්‍ය ආයතනයක් වන්නට පුළුවනි. එහෙත් විශ්ව විද්‍යාල සීමාව ඇතුළේ පොලිසියක් තබාගෙන ඉන්නේ මොනවාටද? විශ්ව විද්‍යාලයට අයත් භූමි සීමාවන් තුළ ගංගොඩවිල පොලිසිය තිබෙන්නේ. පොලිසිය නොනිසි විධියට පාවිච්චි කළාය, පාවිච්චි කිරීමට උත්සාහ දැරුවාය යනුවෙන් නොයෙක් නොයෙක් චෝදනා ඉදිරිපත් කර තිබෙනවා. පේරාදෙණිය විශ්ව විද්‍යාල භූමි සීමාව තුළ පොලිසියක් තිබෙනවාද? කොළඹ විශ්ව විද්‍යාල භූමි සීමාව තුළ පොලිසියක් තිබෙනවාද? විද්‍යාලංකාර විශ්ව විද්‍යාල සීමාව තුළ පොලිසියක් තිබෙනවාද? ඒ විධියට පොලිසියක් තබා ගෙන ඉන්නවායැයි ඇහුවේ කවදාද? ඒ පොලිසිය වෙන දිහාවකට ගෙන යන්නට පුළුවනි.

ශිෂ්‍යයන් නේවාසික පහසුකම් ඉල්ලුවා. වෙනත් කටයුත්තක් සඳහා පාවිච්චි කරන රජයේ ගොඩනැගිල්ලක් එතැන තිබෙනවා. ශිෂ්‍යයන් එය ඉල්ලා තිබෙනවා. එය දෙනවා යැයි කිව්වා. මේවා සම්පූර්ණ කළා නම් කිසිම ප්‍රශ්නයක් මතු වන්නේ නැහැ නේද? එහෙත් අධ්‍යාපන ඇමතිතුමා පත් කළ උප කුලපතීන් වහන්සේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උසස් අධ්‍යාපන පනත : නියෝගය

කර තිබෙන්නේ මොනවාද ? "මෙපමණ සංඛ්‍යාවකගේ නම් අපේ ලේඛනවලින් ඉවත් කළා ; තවත් අය පන්තිවලට පැමිණීම තහනම් කළා; මේ විධියේ දඬුවම් වලින් තමයි මෙහි පාලනය ගෙන යන්නේ " කියා එතුමා කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමන්ගේ නිලයට සෑහෙන ප්‍රමාණයට පුළුල් වූ හිතක් පපුවක් නැත්නම් කෙනකුට ඒ නිලයට අයත් වගකීම නිසි විධියට දරාගෙන කටයුතු කරගෙන යන්නට බැහැ. මනුෂ්‍ය ජීවිත කොටසක් පාලනය කරන්නට යමකු භාර ගන්නවා නම් ඔහුට අනුකම්පාවකින් යුක්තව ප්‍රශ්න විසඳීමට හැකියාව තිබිය යුතු බව කවුරුනුත් පිළිගන්නට ඕනෑ. එවැනි තත්ත්වයකින් තොරව මෙම ආයතන පාලනය කරන්නට ඉදිරිපත් වීම ගැන අපේ බලවත් කනගාටුව මේ අවස්ථාවේදී ප්‍රකාශ කළ යුතු බව මා ගරු ඇමතිතුමාට මතක් කරනවා. විශ්ව විද්‍යාලවල ප්‍රශ්න විසඳන්නේ මේ විධියට නොවෙයි. ශිෂ්‍යයන්ට දඬුවම් කරන බවට පුවත්පත්වල ප්‍රකාශයක් පළ වුණොයින් පසුව "එහෙම තමයි කරන්නට ඕනෑ" කියමින් ඇමතිතුමාද ඊට එකගත්වය දැක්වූවා. ගරු ඇමතිතුමා මට වඩා හොඳින් දරුවන් සෑදීම ගැන දන්නවා ඇතයි පිළිගන්නට මා ලෑස්තියි. ඉතින් ගරු ඇමතිතුමාට ගෞරවයක් ගෙන දෙන දරුවන් සිටිනවා නම් ඒ දරුවන් සාදා ඇත්තේ ඔය පිළිවෙළට නොවෙයි. ඒ දරුවන් ගැන අනුකම්පාවක් ඇතිව, ඔවුන්ගේ දියුණුව ගැන විශේෂ සැලකිල්ලක් ඇතිව "මේ මාගේ දරුවන්" යන හැඟීම පමණක් නොව, " මේ මනුෂ්‍ය ජීවිතයි" යන හැඟීමද ඇතිව දරුවන් සාදන්නට ඇති· වරදක් කළ පමණින් මේ තරම් දරදඬු පිළිවෙළට කටයුතු කිරීමෙන් විශ්ව විද්‍යාල වල ප්‍රශ්න විසඳෙන්නේ නැහැ. මෙයින් සිදු වන්නේ තව දුරටත් සිත් පෑරීම පමණයි. ඒ සිත් පෑරීම අනුව තමන්ගෙන් මේ විධියට පලිගැනීමට ඉඩ දුන් සමාජය පිළිබඳව හිතේ විශේෂ අසන්තුෂ්ටියකින් ක්‍රෝධයකින් ඒ දරුවන් වැඩෙන්නට පටන් ගන්නවා.

මෙම ආයතන පිහිටුවන ලද්දේ මොන පරමාර්ථ ඇතිවදැයි සමහරුන්ට අමතකව ගොස් තිබෙනවා. මෙම ආයතන පිහිටුවා ඇත්තේ ඇමතිතුමාත් මාත් අයත් මේ පරම්පරාවට වඩා උසස් හොඳ පරම්පරාවක් අනාගතයේදී මේ රටේ ඇති කිරීමටයි. බාල පරම්පරාවට උසස් අධ්‍යාපනය දී අපට වඩා උසස් අය වශයෙන් ඒ අයට මේ රටේ ජීවත් වීමට ඉඩ සලසා දීමේ බලාපොරොත්තුව ඇතිවයි, මේ ආයතන ආරම්භ කෙළේ. එහෙත් ඒ පරමාර්ථයෙන් තොරව පටු චේතනාවෙන් යුක්තව අද වැඩ කරගෙන යනවා. තමන්ගේ නම්බුවට කැළලක් ඇති විණැයි කියන අදහස ඇතිවයි, අද කටයුතු කරගෙන යන්නේ. පරමාර්ථය ඔය විධියට පරිවර්තනය වුණ හොත් පාලකයන්ගේ නම්බුව රැකීම දරුවන්ගේ අනාගතය යහපත් කරනවාට වඩා ලොකු දෙයක් වෙනවා. ඇත්තෙන්ම අප දැන් ඒ තත්ත්වයට වැටී සිටිනවා. එම නිසා මෙම රෙගුලාසිය යටතේ මා ඉල්ලන්නේ මෙයයි. මෙම සම්පූර්ණ ප්‍රශ්නය ගැන මුල සිට නැවත වරක් සලකා බලන්නට ඉඩක් දෙන්න. උසස් අධ්‍යාපන පනතේ ඇති වී තිබෙන දෝෂය, රෙගුලාසි වල ඇති වී තිබෙන දෝෂය, පාලක මණ්ඩලවල ඇති වී තිබෙන දෝෂය කුමක්දැයි සොයා බලන්නට ඉඩක් දෙන්න· කවුරුන් හෝ නිවැරදිකරු යයි හිතන්නට වුවමනාවක් නැහැ. කා අතේත් වැරදි තිබෙන්නට පුළුවනි. ඒ බව පිළිගෙන නියම ශුද්ධියක් ඇති කර ගැනීමට සූදානම් නැත්නම් අපේ විශ්ව විද්‍යාල අවුලෙන් අවුලට පත් වන බව කියන්නට සිදු වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහි නිදර්ශනයක් වශයෙන් තමයි මා මේ රෙගුලාසිය ගැන කියන්නේ. අවුරුද්දකට පෙර ඉදිරිපත් කර ක්‍රියාත්මක කළ රෙගුලාසියක් සම්මත කර ගැනීම සඳහා මේ ගරු සභාවට ගෙනෙන විටම දැන් සම්මත කර ගත් එක සුද්ධ කිරීමට ඒ සමගම තවත් රෙගුලාසියක් ගෙනෙන්නට සිදු වී තිබෙනවා. අප පැමිණ සිටින්නේ එවැනි තත්ත්වයකටයි ; අප වැටී සිටින්නේ එවැනි තත්ත්වයකටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධව මීට වඩා කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ මෙයයි. මේ රෙගුලාසිය සම්මත කර ගැනීමට නම් වැඩි අමාරුවක් නැහැ. එහෙත් ගරු ඇමති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උසස් අධ්‍යාපන පනත: නියෝගය

[බර්නාඩ් සොයිසා මයා.]

තුමාගෙන් ඉල්ලා සිටින්නේ, මේ ඇති වී තිබෙන ගැටලු නැත්නම් අවුල් මනුෂ්‍යත්වය ප්‍රමුඛ කාරණය කර ගෙන විසඳීමක් ඉදිරිපත් කරන්නය කියලයි. එයින් තොරව මේ ප්‍රශ්නය විසඳන්නට බැහැ. එයින් හුහක් ඇත්ව යන විධියටයි අද කරුණු සැලසී තිබෙන්නේ. ඒ නිසා නැවත වරක් ඒ තත්ත්වය ඇති කරගෙන මේ දැන් ඇති වී තිබෙන අවුල් විසඳන අතරම, ගරු ඇමතිතුමාගේ උසස් අධ්‍යාපන පනත නැවත වරක් සම්පූර්ණයෙන්ම පරීක්ෂා කර බලා, පනතෙන් පටන්ගෙන රෙගුලාසි දක්වාත් පාලක මණ්ඩලවලින් පටන් ගෙන අනිකුත් නිලධාරීන්ගේ කටයුතු දක්වාත් නැවත වරක් පරීක්ෂා කර බලා, මහජනයාගෙනුත් කරුණු ඉල්ලා ගෙන, සාක්ෂි ලබාගෙන, ශිෂ්‍යයන්ගේ අදහසුත් විමසා, ගුරුවරුන්ගේ අදහසුත් විමසා, දේශපාලනඥයන්ගේ අදහසුත් විමසා, මෙයට කළ යුතු පිළියම කුමක්ද කියා නිසි අන්දමට තීරණයකට බැසීමෙන් පමණයි උසස් අධ්‍යාපනය නැවත වරක් දියුණුව කරා නැත්නම් උන්නතිය කරා ගෙන යන්නට පුළුවන් වන්නේ කියා මතක් කර දෙන්නට කැමතියි.

මීට වඩා දීර්ඝ වශයෙන් මේ ගැන කථා කරන්නට එපාය කියා ගරු අධ්‍යාපන ඇමතිතුමා විශේෂ ඉල්ලීමක් කළා· මීට කලින් ඉදිරිපත් කළ රෙගුලාසි පිළිබඳව මා ඉදිරිපත් කළ කරුණුවලට පිළිතුරු නොදී ගරු ඇමතිතුමා වාඩි වූ නිසා මේ අවස්ථාවවත් ඒ සඳහා පාවිච්චි කර ඒ ගැන යමක් කියන්නය කියා ඉල්ලනවා. අවසාන වශයෙන් මනුෂ්‍යත්වය ප්‍රථම කාරණාව කරගෙන ඒ උඩ මේ විශ්ව විද්‍යාල ප්‍රශ්නය විසඳන්නට ඉදිරිපත් වන්නය කියා ඉතා කාරුණික ඉල්ලීමක් ඉදිරිපත් කරමින් මගේ කථාව මෙයින් සමාප්ත කරනවා.

අ. භා. 5.11

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඉදිරිපත් කරන ලද නියෝග අවබෝධ කර ගැනීමට දකුණු කොළඹ මන්ත්‍රීතුමාට (බර්නාඩ් සොයිසා මයා.) අමාරුවක් නැත කියා මා හිතනවා. මක් නිසාද කියනවා නම්, ගුරුවරුන් පත් කිරීමේදී එය එක් තරා ප්‍රතිපත්තියක් උඩ කළ යුතු නිසයි. ඒ ප්‍රතිපත්තිය සකස් කරන්නේ උසස් අධ්‍යාපන මණ්ඩලයයි. ඒ උසස් අධ්‍යාපන මණ්ඩලය මගින් සකස් කළ ප්‍රතිපත්ති මාලාව උඩ ගුරුවරුන් පත් කරන්නේ මහාධිකාරී මණ්ඩලයයි. මහාධිකාරී මණ්ඩලය එසේ අනුගමනය කළ යුතු ප්‍රතිපත්තිවලට අනුකූලව ක්‍රියා කළ නොහැකි අවස්ථා ඇති වන බව අපට ඒත්තු ගියා. එකක් නම් ඕන් කෙනෙක්, එනම්, විද්‍යා පීඨයක ප්‍රධානයෙක්, මේ තේරීම් මණ්ඩලවලට ඇතුළත් විය යුතුයි කියා කලින් නියෝගවල සඳහන් වෙතත්, විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ විද්‍යා අංශයේ එවැනි තනතුරක් උසුලන කෙනෙක් නැහැ. ඒ අංශයට ගුරුවරුන් පත් කිරීමේදී ඒ විද්‍යා පීඨයේ නායකත්වය දරන පුද්ගලයකු නැති බැවින් ඒ අවස්ථාවලට ගැළපෙන පරිද්දෙන් තේරීමේ ප්‍රතිපත්තිය සකස් කොට ඒවා මහාධිකාරී මණ්ඩලයට දන්වා සිටීමටයි, මේ සංශෝධනය ගෙනෙන්නේ.

විශ්ව විද්‍යාල ප්‍රශ්නය පිළිබඳව මා විසින් දහ වරක් පමණ කරුණු පහදා දෙන්නට ඇති. නැවත පහදා දුන්නත් නැවතත් මී ළඟට විශ්ව විද්‍යාලය පිළිබඳ ප්‍රශ්නයේදී එයම ඉදිරිපත් කරන බැවින් අවසාන වශයෙන් ඒ අවස්ථාවේදී පිළිතුරු දීමට මා බලාපොරොත්තු වන නමුත්, කරුණු දෙකක් තුනක් ගැන පමණක් කියන්නට ඕනෑ. විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ අනාගත අභිවෘද්ධිය සලකන පුද්ගලයන් අතරෙන් විද්‍යෝදය උපකුලපතීන් වහන්සේත් එක් කෙනකු බව මා කියන්නට කැමතියි. උන්වහන්සේ ජාත්‍යන්තර වශයෙන් විශාල ප්‍රසිද්ධියක් ඇති, ඉතා පැරණි විශ්ව විද්‍යාල ඇති ප්‍රංශය, නවීන උසස් විශ්ව විද්‍යාල ඇති ඇමෙරිකාව ආදි රටවලින්ද පිළිගනු ලැබූ ජාත්‍යන්තර කීර්තියක් උසුලන ශාස්ත්‍රවන්තයෙක්. උන්වහන්සේට මේ ලංකාවට එන්නට වුවමනාවක් තිබුණේ නැහැ. උන්වහන්සේ ලංකාවට මෙන්ම ලෝකය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වද වුවමනා කරන පර්යේෂණ වැඩවල නියුක්තව සිටියදී, විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ උප කුලපති පදවියට අගමැතිතුමාත්, මාත් විසින් කරන ලද ආරාධනය පිළිගත්තේ ලෝකය පිළිබඳව කළ යුතු ප්‍රයෝජනවත් දේ තිබුනත් තමන් උපන් රටට සේවයක් කළ යුතුය යන අවංක චේතනාවෙනුයි. උන්වහන්සේ පැමිණි දා පටන් විද්‍යෝදය විශ්ව විද්‍යාලය දියුණුවෙන් දියුණුවට පත් වූ බවට විශ්ව විද්‍යාල ප්‍රතිඵලම දෙස් කියයි. ගිය අවුරුද්දේ පන්ති වර්ජනයක් නොතිබී, උන්වහන්සේගේ අවවාද අනුශාසනා ඇතිව, පිටස්තර දේශපාලනඥයන්ගේ කෛරාටික වචනවලට අසු නොවී වැඩ කළ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගෙන් සියයට අනූ එකක්, පෙනී සිටි විභාගයෙන් සාමාර්ථ්‍යය ලත් බව මා කියන්නට කැමතියි. මේක ලෝක වාර්තාවක් තරමට සඳහන් කරන්නට පුළුවන් ප්‍රතිඵලයක්. එහෙත් මේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් දහස් ගණනින්, කොළඹ වැනි ප්‍රදේශවල මැර වර පන්තියේ කීප දෙනකු පසුව උන්වහන්සේගේ අවවාද අනුශාසනා නොපිළිගෙන, යම් යම් දේශපාලකයන්ගේ ආණ්ඩු පෙරලීමේ ප්‍රතිපත්තියට එකඟ වී 8 වැනිදා—ඊයේ—වැටෙන්නට තිබූ ආණ්ඩුව වැට්ටවීමට ඔය පන්ති වර්ජනය කර, නගරවල පෙරහර ගොස් මහා උද්ඝෝෂණයක් කරන්නට බලාපොරොත්තු වුණා. එපමණක් නොවෙයි, ආණ්ඩුව පෙරළුණු පසු, පන්ති වර්ජන වැඩපිළිවෙළේ නායකයන්ට උසස් පදවි දෙන බවටද පොරොන්දු වී ඇති බව මට දැන ගන්නට ලැබුනා.

**ජයකොඩි මයා.**

*(திரு. ஜயக்கொடி)*

(Mr. Jayakody)

බොරු, බොරු.

**ගරු ඊරියගොල්ල**

*(கௌரவ ஈரியகொல்ல)*

(The Hon. Iriyagolle)

මට දැන ගන්නට ලැබුණු ආරංචියක් ගැනයි, මා කිවේ. එය බොරු වන්නට පුළුවන්. දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මයා.) ඒ ගැන හුඟක් දන්න බව පෙනෙනවා. ඒ ආරංචිය බොරු වන්නටත් පුළුවනි. ඇත්ත උන්නැහේ දන්නවා ඇති. ජාතියේ අනාගත ඉරණම අතින් දරා ගත යුතු මේ උසස් ශිෂ්‍යයන්ට යන කලදසාව ගැන මානුෂිකත්වයෙන් තෝරා විමසන්නටය කියන දකුණු කොළඹ සම මන්ත්‍රීතුමාගේ (බර්නාඩ් සොයිසා මයා.) පක්ෂයේ අය ඒ ශිෂ්‍යයන්ගේ නොහොබිනා ක්‍රියාවලට අනුබල දෙමින් ප්‍රසිද්ධ ස්ථානවල සභා රැස්වීම් පවත්වා ආණ්ඩුව කෙළසූ බව නොදැන්වීම ගැන මා කණගාටු වෙනවා.

මා හිතන පිළිවෙළට පසුගිය අවුරුදු 25 තුළම තිබුණු තත්ත්වයට වඩා නරක තත්ත්වයක් අනුක්‍රමයෙන් විශ්ව විද්‍යාලවල ඇති වූයේ දේශපාලන ඇඟිලි ගැසීම් නිසාමයි. ඒ තත්ත්වයෙන් විශ්ව විද්‍යාල බේරා ගැනීම විද්‍යෝදය උප කුලපතීන් වහන්සේගේත්, මේ ජාතික රජයේත්, මගේත් බලාපොරොත්තුවයි. විශ්ව විද්‍යාලවල කිසි කලක නොතිබුණු විනය නව ස්වල්ප කලකින් තහවුරු කොට අනාගත පරම්පරාවේ වගකීම භාර ගැනීම සඳහා මේ තරුණයන් යහ මාර්ගයේ ගමන් කරවීමට පොරොන්දු වන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසාන කරනවා.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය පනත් කෙටුම්පත

பௌத்த சிராவக்க தர்மபீட மசோதா

## BAUDDHA SRAVAKA DHARMAPITHAYA BILL

**දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.**

இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.

*Order for Second Reading read.*

අ. භා. 5.17

**ගරු ඊරියගොල්ල**

*(கௌரவ ஈரியகொல்ல)*

(The Hon. Iriyagolle)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බුද්ධ ධර්ම පීඨය පිළිබඳ පනත් කෙටුම්පත මීට ප්‍රථම වතාවේදී ඉදිරිපත් කළා. මේ ගරු සභාවේ ගරු මන්ත්‍රීවරුන් දැනට එය කියවා ඇතැයි මා කල්පනා කරනවා. ඒ අනුව කෙරෙන කථා මා බලාපොරොත්තු වෙනවා. මෙම "කෙටුම්පත් පනත දැන් දෙවන වර කියවිය යුතුය" යි මම යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බෞද්ධාගම පිළිබඳව යම් දියුණුවක් අපේක්ෂා කරන බොහෝ අයත්, නොයෙක් සමිති සමාගම්වලට අයිති බොහෝ දෙනාත්, නොයෙක් නිකායවලට අයිති ගරුතර බෞද්ධ භික්ෂූන් වහන්සේලාත්, මීට පෙර පැවැති ආණ්ඩුවේ සිටි මැති ඇමැතිවරුනුත් යනාදී සියලු දෙනාම කිසිම විවාදයක් නැතිව බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ උසස් අධ්‍යාපනය සඳහා උසස් අධ්‍යාපන ආයතනයක් සකස් විය යුතුයයි පිළිගනු ඇතැයි මා කල්පනා කරනවා. දැනට මේ රටේ පවත්නා අධ්‍යාපන ආයතන වන විශ්ව විද්‍යාලවලින් ඒ බලාපොරොත්තුව ඉෂ්ට නොවන බව පෙනී ගිය නිසා බෞද්ධ ශ්‍රාවක ධර්ම පීඨයක් වැනි උසස් තත්ත්වයේ ආගමික ආයතනයක් පිහිටුවීමට පසුගිය ආණ්ඩුවේ ගරු ඇමතිතුමන්ලා කල්පනා කළ බව මට ලිපි ලේඛනවලින් පෙනී ගියා. උන්නැහේලා විසින් පත් කරන ලද හෝ ඒ ආණ්ඩුවෙන් පත් කරන ලද බෞද්ධ කොමිෂන් සභාවක වාර්තාවක් අනුව බොහෝ දුරට සකස් වූ පනත් කෙටුම්පත කුත් අධ්‍යාපන අමාත්‍යාංශයේ තිබුණා. ඒ සියල්ලක්ම කියවා බලා මේ අවස්ථාවට ගැළපෙන පරිද්දෙන් සකස් වුණු පනත් කෙටුම්පතක් තමයි මේ ඉදිරිපත් කළේ.

භික්ෂු අධ්‍යාපනය, ආගමික අධ්‍යාපනය, දැන් හුඟක් දුරට පිරිහීගෙන යන බව ගරු උගත් සිල්වත් ස්වාමිපාදයණන් වහන්සේලාගේ අදහසයි. විශේෂයෙන් ම අප විසින් මෙය ඉදිරිපත් කරනු ලැබ තිබෙන්නේ එවැනි මහා තෙරපාණන් වහන්සේලාගේ අනුදැනුම ඇතිවයි. ආදියේ පැවැති තත්ත්වයට අධ්‍යාපනය දියුණු කරන්නට නම් නිරවශේෂයෙන්ම ආගම පිළිබඳ අධ්‍යාපනයක් ඇති කෙරෙන ආයතන වර්ගයක් පිහිටුවිය යුතුයයි උන්වහන්සේලා බලාපොරොත්තු වෙනවා.

පිරිවෙන් අධ්‍යාපනය කියා එකක් තිබෙනවා. දැන් සමහර පිරිවෙන්වල බෞද්ධාගමවත් අනිවාර්ය නැහැ. ඒ නිසා එවැනි පිරිවෙනකින් ආගම පිළිබඳ අධ්‍යාපනයක් ඇති නොවෙතැයි බොහෝ උගත්, පැරණි පිරිවෙන් ක්‍රමය තවම අනුමත කරන, මහා ස්ථවිරපාදයන් වහන්සේලා ප්‍රකාශ කර සිටිනවා. ඒ ගැන ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේ සමහර විට හොඳට දන්නවා ඇති—මටත් වඩා හොඳට දන්නවා ඇති—තමුන්නාන්සේ මුස්ලිම් ජන නායකයකු වුවත්, බෞද්ධ භික්ෂූන් වහන්සේලා මෙන්ම බෞද්ධ ජන නායකයන් සමඟ බොහෝ කලක් වාසය කරන,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එමෙන්ම ඉතාමත් කිට්ටුවෙන් ආශ්‍රය කරන කෙනෙකු නිසා. විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයත් විද්‍යෝදය විශ්ව විද්‍යාලයත් අද කොයි තත්ත්වයේ පවතිනවාද යන්නත් ඔබතුමා දන්නවා. පැරණි පිරිවෙන්වල තත්ත්වය අද ඒ විශ්ව විද්‍යාලවල සොයා ගන්නට අමාරුයි. ඇතැම් පිරිවෙන් පැරණි තත්ත්වයෙන් ඈතත් බොහොම යක් එහෙම නැහැ. අපේ පාඨශාලාවල ආගම අනිවාර්ය විෂයයක් වශයෙන් ඉගැන්වීම ගැන ඇතැම් අය විරුද්ධ වන බව අහන විට තමුන්නාන්සේ පුදුම වෙයි. සමහර පිරිවෙන් ආගම අනිවාර්ය කිරීම ගැන විරුද්ධයි. ආගම අනිවාර්ය විෂයයක් කිරීමට කැමති පිරිවෙන් මෙන්ම අකැමති පිරිවෙනුත් තිබෙනවා.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)
අකැමති එක පිරිවෙනක් කියන්න.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ඒ ප්‍රශ්නයට මම පසුව උත්තර දෙන්නම්. ඔප්පු කරන්නට බැරි කිසිවක් මා කියන්නේ නැහැ. පසුගිය දවස්වල තමුන්නාන්සේ ප්‍රවෘත්ති පත්‍ර කියෙව්වා නම් දැන් ඔවැනි කතාවක් කියන්නේ නැහැ. අධ්‍යක්ෂ විසින් ආගම අනිවාර්ය කිරීමට යෝජනා කිරීම ගැන පවා සමහර පිරිවෙන් අධිකාරීන් විරුඬතාවය ප්‍රකාශ කර තිබෙනවා. ඇමතිවරයකු වශයෙන් මා මෙය ප්‍රසිද්ධියේ කියන්නේ වග කීමක් ඇතිවයි. මේ තත්ත්වය නිසා මතු අනාගතයේදී බුද්ධාගම ඉගෙනීම, අනුගමනය කිරීම, පිළිපැදීම යනාදියට හානියක් වේදෝ යන හැඟීමක් මහා නායක ස්වාමිපාදයන් වහන්සේලා තුළ ඇති වී තිබෙනවා. උන් වහන්සේලාගේ බලවත් ඉල්ලීමත් බෞද්ධ ගිහි ජන නායකයන්ගේ බලවත් ඉල්ලීමත් උඩයි මා මෙම පණත ඉදිරිපත් කෙළේ. මෙවැන්නක් ඉදිරිපත් කෙරෙන පළමුවැනි අවස්ථාව මෙය නිසා මෙහි අඩුපාඩු තිබෙන්නට පුළුවනි. බෞද්ධ භික්ෂූන් වහන්සේලාට මේ රටේ හිමි විය යුතු ආගමික උසස් තත්ත්වය ලබා දීම ගැන මොන ආගමකට අයත් මන්ත්‍රීවරයකු වුවත් විරුද්ධ නොවන බවයි මාගේ විශ්වාසය. එහෙත් අදහස් අතින් යම් යම් වෙනස්කම් මන්ත්‍රීවරුන් තුළ තිබෙන්නට පුළුවනි. ඒ අදහස් සියල්ලක්ම විමසා බලා මෙහි සංශෝධනය විය යුතු තැන් තිබේ නම් ඒවා සංශෝධනය කොට මේ මුළු සභාවේම සම්මුතිය උඩ මේ පණත අනුමත කර ගන්නට ලැබුණොත් එය වාසනාවක් වශයෙන් මා සලකනවා. මෙය සථාවර කාරක සභාවකට පවරන්නට මා බලාපොරොත්තු වෙනවා. මෙය මට අයිති දෙයක්වත් විරුද්ධ පක්ෂයට අයිති දෙයක්වත් නොව කාටත් පොදු, කිසිම මත භේදයක් නැතිව සාධාරණ පරිද්දෙන් සකස් විය යුතු දෙයක්. එම නිසා මෙය පක්ෂව විවේචනය කිරීම හෝ විරුද්ධව විවේචනය කිරීම හෝ අනවශ්‍යයි. අප දෙපක්ෂයේම චුවමනාව පරිදි බෞද්ධාගමේ දියුණුවත් අනාගත ආරක්ෂාවත් පතා කාගේත් කැමැත්තෙන් අඩුපාඩු සකස් කොට සම්මත විය යුත්තක් වශයෙන් මා මෙම පණත ඉදිරිපත් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

අ. භා. 5.23

**පී. බී. ජී. කළුගල්ල මයා.** (කෑගල්ල)
*(திரு. பீ. பி. ஜீ. கலுகல்ல—கேகாலை)*
(Mr. P. B. G. Kalugalla—Kegalla)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින්, "බුද්ධ ශ්‍රාවක ධර්මපීඨය" යන නම දරන භික්ෂු විශ්ව විද්‍යාලයක් ඇති කිරීම සඳහා කෙටුම්පත් පණතක් ඉදිරිපත් කිරීම ගැනත් ඒ පිළිබඳව එතුමාගේ පරමාර්ථ ගැනත් අප සම්පූර්ණයෙන්ම එකඟ වෙනවා. එම පරමාර්ථ සම්බන්ධයෙන් අප දෙපක්ෂය අතර කිසිම මත භේදයක් නැහැ, ඒ වාගේම, එතුමා විසින් මෙතෙක් ඉදිරිපත් කර තිබෙන පණත් අතුරින් මේ පණත විශේෂයෙන්ම අපේ ප්‍රශංසාව එතුමාට හිමි වන එකක්. එසේ වුණත්, බෞද්ධ යන් අතරත්, විශේෂයෙන්ම බෞද්ධ භික්ෂූන් වහන්සේලා අතරත් යම් යම් මත භේද ඇති වන්නට පුළුවන් වගන්තිය ඇමතිතුමා හොඳ පරමාර්ථයක් ඇතිව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කළුගල්ල මයා.]

ඉදිරිපත් කළ මේ පණතෙහි තිබෙනවා. ඒවා ගැන ගරු ඇමතිතුමාට කරුණු දක්වන්නට අප බලාපොරොත්තු වෙනවා. මේ කෙටුම්පත් පණත සෑම බෞද්ධයකුගේම සහයෝගය ඇතිව ස්ථිර කර ගත යුතු බව ගරු ඇමතිතුමා එතුමාගේ මූලික කථාවේදී කිව්වා. මේ පිළිබඳව අදහස් දැක්වීමට හැම කෙනෙකුටම අවස්ථාවක් දීමටත් එතුමා පළමුවෙන්ම පොරොන්දු වුණා.

අප විරුද්ධ පාර්ශ්වයේ නායකතුමිය වන බණ්ඩාරනායක මැතිනිය අගමැති වශයෙන් සිටියදී 1964 ජූලි මාසයේදී තරම මට කියා සිටියා, බෞද්ධ භික්ෂූන් වහන්සේලා ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා පුහුණු කර ලංකාවේ පමණක් නොව පිටරටවල පවා බුද්ධ ධර්මය ප්‍රචාරය කර හැරිය යුතුයි කියා. මා ඒ අවධියේ අධ්‍යාපන ඇමතිවරයා වශයෙනුයි කටයුතු කළේ. ඒ අතරම එතුමිය මට උපදෙස් දුන්නා, අනුරාධපුරයේ බෞද්ධ විශ්ව විද්‍යාලයක් පිහිටුවීමේ වැඩ පිළිවෙලක් සකස් කරන්නය කියා. මම ගිහි බෞද්ධයෙකු වුණාට බුඩාගම පිළිබඳව එතරම් පරිපූර්ණ අවබෝධයක් ඇති කෙනෙක් නොවෙයි. ඒ නිසා මම පළමුවෙන්ම කළේ එදා මගේ ස්ථිර ලේකම් වශයෙන් සිටි දැනටත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන් සිටින එම්. ජේ. පෙරේරා මැතිතුමා මගින් මේ රටේ හැම නිකායකටම අයත් මහානායක ස්වාමීන් වහන්සේලා අමාත්‍යාංශයට කැඳවා ඒ පිළිබඳව සාකච්ඡාවක් පැවැත්වීමයි. ඒ සාකච්ඡාවට මල්වතු මහා විහාරයේත්, අස්ගිරි මහා විහාරයේත්, රාමඤ්ඤ, අමරපුර හා අනිකුත් නිකායවලත් මහානායක ස්වාමීන් වහන්සේලාත් වෙනත් සැලකිය යුතු පණ්ඩිත ස්වාමීන් වහන්සේලාත් සහභාගි වුණා. ඒ සාකච්ඡාවට සහභාගි වූ සෑම භික්ෂූන් වහන්සේ නමක්ම අනුරාධපුරයේ භික්ෂු විශ්ව විද්‍යාලයක් පිහිටුවීමේ යෝජනාව අනුමත කළා. එම භික්ෂු විශ්ව විද්‍යාලය හැම නිකායකම නායක භික්ෂූන් වහන්සේලාගේ ප්‍රධානත්වයෙන් ඇති විය යුතු යයි එදා අමාත්‍යාංශය තීරණය කළා. ඒ ලියුම් කියුම් අදත් අමාත්‍යාංශයේ ඇති. වුවමනා නම් ගරු ඇමතිතුමාට ඒවා බලන්න පුළුවනි. එහෙත් 1964 දෙසැම්බර් 3 වෙනිදා අපේ ආණ්ඩුව වැටුණු නිසා අපට ඒ වැඩ පිළිවෙල ඉෂ්ට කර ගන්න බැරි වුණා.

එදා අපේ පරමාර්ථ වුණේත් මේ පනතේ 3 වෙනි වගන්තියේ ඇමතිතුමා විස්තර කරන පරමාර්ථමයි. ඒවා මෙහෙමයි :

"(අ) බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම අනුව භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම ;

(ආ) විශ්ව විද්‍යාලයෙහි ශිෂ්‍යයන් අතර භාවනාව දියුණු කිරීම ;

(ඇ) බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් ලංකාවෙහි සහ විදේශවල ව්‍යාප්ත කිරීම සඳහා භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම ;

(ඈ) බුද්ධාගම හැදෑරීමට සහ බුද්ධාගම පිළිබඳ පර්යේෂණ වලට ධෛර්යය දීම ; සහ

(ඉ) බෞද්ධ සංස්කෘතිය දියුණු කිරීම."

මේ කරුණු 5 තමයි, එදා අපේ පරමාර්ථය වෙලා තිබුණේ. ඒ නිසයි මා මුලින්ම කිව්වෙ, පරමාර්ථය ගැන අප අතර කිසිම මතභේදයක් හෝ වෙනසක් නැහැ කියා. එහෙත් අපේ පරමාර්ථයන් හොඳ වුණාට, මෙවැනි බෞඩ විශ්ව විද්‍යාලයක් පිහිටුවන විට එහි පාලන බලතල වැඩි හරියක් භික්ෂූන් වහන්සේලාට දිය යුතුයි. මේ පනතේ නොයෙක් වගන්තිවලින් හුඟක් බලතල ඇමතිතුමා අතට අරගෙන තිබෙන බව මා පෙන්වා දෙන්ට කැමතියි. ඒ අන්දමට පාලන බලතල වැඩි හරියක් ඇමතිතුමා අතට ගැනීමෙන් මතභේද ඇතිවන්ට ඉඩ තිබෙනව. මේ පනත අනුව භික්ෂූන් වහන්සේලා වුණත් අස් කිරීමේ බලය ඇමතිතුමා අත පවතිනව. ඒ වගේම ගිහි ඇමතිවරයෙක් උගත් භික්ෂූන් වහන්සේ නමක් අස් කිරීම විශේෂයෙන් ගරුතර මහා සංඝරත්නයේ හිත් වේදනා ඇති වන්ට ඉඩ තිබෙන කාරණයක්. ඒ නිසා එවැනි බලතල අප හුඟක් දුරට සීමා කළ යුතුයි. බෞද්ධ භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් ඇති කරන විශ්ව විද්‍යාලයේ බලතල හැකිතාක් දුරට අප භික්ෂූන් වහන්සේලාටම පවරා දිය යුතුයි. පළමුවෙනි කාරණය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒකයි. ඇමතිතුමා එකඟ වුණොත් ඒ විධියේ වගන්ති හුඟක් සංශෝධනය කරන්ට පුළුවන්කම තිබෙනව.

මේ පනතේ 5 වෙනි වගන්තිය දෙස අපි ටිකක් බලමු. "ධර්ම පීඨාධිපතීන් වහන්සේ සහ විශ්ව විද්‍යාලයේ නිලධර යෝ" යනුවෙන් මෙහි සඳහන් කර තිබෙනවා. 5 වන වගන්තිය මෙහෙමයි:

"5. (1) විශ්ව විද්‍යාලයේ ධර්ම පීඨාධිපතීන් වහන්සේ උපසම්පදාව ලැබීමෙන් පසු අවුරුදු විස්සක් සම්පූර්ණ කළ උපසම්පදාව ලද භික්ෂූන් වහන්සේ නමක් විය යුතුය.

(2) අනුශාසක මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලැබූ අඩු ගණනේ තුන් දෙනකුගෙන් සැදුම් ලත් මූල මණ්ඩලයකින්, ඇමතිවරයා විසින්, ධර්ම පීඨාධිපතීන් වහන්සේ පත් කළ යුතුය.

(3) ධර්ම පීඨාධිපතීන් වහන්සේ සිය සේවය සඳහා මුළු කාලයම යොදන විශ්ව විද්‍යාලයේ නිලධරයකු විය යුතුය. උන්වහන්සේ අධ්‍යාපන හා පාලන සභාවේ සාමාජිකයකු සහ සභාපති විය යුතුය......."

ධර්ම පීඨාධිපතීන් වහන්සේ අස් කිරීමේ බලය සම්පූර්ණයෙන්ම ඇමතිතුමාට තිබෙනවා. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. උපසම්පදාව ලබා අවුරුදු විස්සක් සම්පූර්ණ කළ වයෝවෘද්ධ භික්ෂූන් වහන්සේ නමක් අස් කරන්නට විශේෂයෙන්ම ඇමතිවරයකුට බලතල තිබීම සුදුසු යයි මා කල්පනා කරන්නේ නැහැ. මට ප්‍රථමයෙන් සිටි අධ්‍යාපන ඇමතිවරයා මුස්ලිම් භක්තිකයෙක්. සමහර විට කතෝලිකයකු නැත්නම් ක්‍රිස්තියානි භක්තිකයකු අධ්‍යාපන අමාත්‍ය ධුරයට පත් වෙන්නට පුළුවනි. ඉතින් මේ විධියට ඒ බලතල ඇමතිවරයාට පැවරීම සම්පූර්ණයෙන්ම නුසුදුසු ක්‍රියාවක්. මේ 5 වන වගන්තියට බෞද්ධ භික්ෂූන් වහන්සේලා විශේෂයෙන්ම විරුද්ධත්වය දක්වන්නට ඉඩ තිබෙන බව මා ඇමතිතුමාට පෙන්වා දෙන්ට සතුටුයි.

5 වන වගන්තියේම 7 වන කොටස මෙහෙමයි:

"(7) ධර්ම පීඨාධිපති ධුරයෙහි යම් පුරප්පාඩුවක් ඇති වුවහොත් හෝ නිවාඩු ගැනීමේ, රෝගාතුර වීමේ හෝ අන් කරුණක හේතුවෙන් ස්වකීය ධුරයෙහි යුතුකම් ඉෂ්ට කිරීමට ධර්ම පීඨාධිපතීන් වහන්සේ තාවකාලිකව අපොහොසත් වුවහොත් ඒ ධුරයෙහි කටයුතු කරගෙන යාම සඳහා සුදුසු යයි තමා සලකන වැඩ පිළිවෙළක් ඒ පුරප්පාඩුව ඇති වීමෙන් හෝ එසේ අපොහොසත් වීමෙන් දින දහ හතරක් ඇතුළත ඇමතිවරයා විසින් ඇති කළ යුතුය......."

එතැනත් ඇමතිවරයා අතට බලතල අරගෙන තිබෙන බව පෙනෙනවා. නමුත් අප ඒ සමගම විශ්ව විද්‍යාලයේ බල මණ්ඩල ගැන අවධානය යොමු කළ යුතුයි. විශ්ව විද්‍යාලයේ බල මණ්ඩල 9 වන වගන්තියේ සඳහන් වෙනවා. අනුශාසක මණ්ඩලය, අධ්‍යාපනය හා පරිපාලන සභාව හා දායක මණ්ඩලය යනුවෙන් බල මණ්ඩල තුනක් තිබෙනවා. අනුශාසක මණ්ඩලය කිනම් අයගෙන් සමන්විත විය යුතුද යන්න 10 වන වගන්තියේ තිබෙනවා:

"10. (1) අනුශාසක මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය:—

(i) සියම් නිකායේ මල්වතු පාර්ශ්වයේ මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ;

(ii) සියම් නිකායේ අස්ගිරි පාර්ශ්වයේ මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ;

(iii) ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ සභාපතීන් වහ්සේ;

(iv) රාමඤ්ඤ නිකායේ මහා නායක සවාමීන් වහන්සේ; සහ

(v) අනුරාධපුර අටමස්ථානයේ නායක සවාමීන් වහන්සේ; සහ

(vi) ඇමතිවරයා විසින් නම් කරනු ලබන තුන් නමකට නොවැඩි වෙනත් ස්වාමීන් වහන්සේලා ගණනක්."

ඊළඟට, එම වගන්තියේම 2 වන කොටසින් සියම් නිකායේ මල්වතු පාර්ශ්වයේ මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ අනුශාසක මණ්ඩලයෙහි සභාපති විය යුතුය කියනවා. විශේෂයෙන්ම ඒ කොටස ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන විය යුතුය කියා මා කල්පනා කරනවා. නායක ස්වාමීන් වහන්සේලා සියලු දෙනාම අනුශාසක මණ්ඩලයේ සිටින නිසා ඒ ස්වාමීන් වහන්සේලාටම සභාපති ධුරයට කෙනෙකු තෝරා ගන්නට ඉඩ දීම ඉතාමත් කාලෝචිතය යනු මගේ අදහසයි. මල්වතු පාර්ශ්වයේ මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ අද තදින්ම රෝගාතුරව සිටිනවා. ඒ වාගේම සමහර විට අනික් සවාමීන් වහන්සේලා උගත්කම අතින් වැඩි වෙන්නට පුළුවනි; සෑම අතින්ම හොඳ වෙන්නට පුළුවනි. එම නිසා ඒ ස්වාමීන් වහන්සේලාටම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කළුගල්ල මයා.]
අනුශාසක මණ්ඩලයේ සභාපති ධුරයට කෙනෙකු තෝරා ගන්නට නියම කළොත් එය ඉතාමත් කාලෝචිතය කියා මා කල්පනා කරනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

කාරක සභා අවස්ථාවේදී ඒ ගැන සාකච්ඡා කරමු.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

තවත් කාරණයක් පෙන්වා දිය යුතුව තිබෙනවා. දායක මණ්ඩලය ගැන 15 වන වගන්තියේ සඳහන් වෙනවා. දායක මණ්ඩලය පත් කිරීම ඇමතිතුමා භාර නොගෙන එය අනුශාසක මණ්ඩලයටම පැවරුවහොත් හොඳයි. එසේ කළොත් ඇති විය හැකි මතභේද හුඟක් දුරට අඩු වෙයි. දායක මණ්ඩලයට හුඟක් බලතල තිබෙනවා. මේ විශ්ව විද්‍යාලයේ වැඩ කටයුතු කිසිම දේශපාලන බලපෑමකට යටත් නොවී ගෙන යා යුතුයි. එවිට තමයි, ඒ විශ්ව විද්‍යාලයේ නියම දියුණුවක් ඇති වන්නේ. ඇමතිවරුන්, ආණ්ඩු, ඇති වෙනවා; නැති වෙනවා; එම නිසා කොයිම ඇමතිවරයකුටවත් එම විශ්ව විද්‍යාලයේ පත්වීම් ගැන ඇඟිලි ගහන්නට ඉඩක් නැති වුණු තරමට විශ්ව විද්‍යාලයට හොඳයි. අද අපේ රටේ ඉන්නා ඉතාමත් සිල්වත්, ගුණවත්, නැණවත් භික්ෂූන් වහන්සේලාගෙනුයි මේ උපදේශක මණ්ඩලය සමන්විත වන්නේ. ඒ අනුශාසක මණ්ඩලයට වැඩියෙන් බලතල දෙන තරමට විශ්ව විද්‍යාලයේ කටයුතු දියුණු වෙනවා. ඒ දවස්වල මා අධ්‍යාපන ඇමති ධුරයේ කටයුතු කරද්දී ස්ථිර ලේකම්ට මා කීවේ, "බෞද්ධ විශ්ව විද්‍යාල සම්බන්ධ පනත් කෙටුම්පත පිළියෙළ කරන විට මට මොකුත් තබන්නට එපා, ඔක්කොම ලෙඩ ටික අනුශාසක මණ්ඩලයට දෙන්න" කියායි. අද මේ ආණ්ඩුව මහජනයාගේ කලකිරීමට ලක් වී තිබෙන එක හේතුවක් නොයෙකුත් ඇඟිලිගැසීම් අනුව පත්වීම් කිරීමයි. එම නිසා මේ බෞද්ධ විශ්ව විද්‍යාලයේ එවැනි තත්ත්වයක් උද්ගත නොවන විධියට කටයුතු කළොත් අධ්‍යාපන ඇමතිතුමා මේ රටේ හැම දෙනාගේම ප්‍රශංසාවට ලක් වෙනවාට සැකයක් නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

යම් යම් දනමාන කටයුතු—

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

දායක මණ්ඩලය පත් කරන්නේ ඇමතිතුමායි. 15 වැනි වගන්තියේ මෙසේ සඳහන් වෙනවා :

"(අ) බෞද්ධයන් වූ හා භික්ෂූන් වහන්සේලා නොවූ තැනැත්තන් අතුරෙන් ඇමතිවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙක් ; හා

(ආ) සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ."

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The nine people may not be bhikkus.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

The nine people are all laymen. They are all to be appointed by the Hon. Minister. The laymen will have all the power. So there can be political and ministerial interference regarding this. We want this to be devoid of any interference by the Minister or any politician.

"2 සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ බෞද්ධයකු නොවූ අවස්ථාවක,"—.

සංස්කෘතිය කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ බෞද්ධයෙකු නොවේ නම් වෙනත් කෙනකු පත් කරන්නට ඇමතිවරයාට පුළුවන් බව මෙහි සඳහන් වෙනවා. ඒකට කමක් නැහැ. එහෙත් යම් විධියකින් ඇමතිවරයා බෞද්ධයෙකු නොවේ නම්? සමහර විට හින්දු බැතිමතෙක්, කතෝලික මහත්මයෙක්, ක්‍රිස්තියානි භක්තිකයෙක්, මුස්ලිම් ආගමිකයෙක් අධ්‍යාපන ඇමතිවරයා වන්නට පුළුවනි. එවිට කරන්නේ මොකක්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The Hon. Minister will always nominate a Buddhist. The nine people will have to be Buddhists.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

මා කියන්නේ අධ්‍යාපන ඇමතිවරයා අබෞද්ධයකු නම් කරන්නේ මොකක් ද කියායි.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

He too will have to appoint a Buddhist.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

එම නිසා තමයි කියන්නේ, අධ්‍යාපන ඇමතිවරයා විසින් දායක මණ්ඩලය පත් කිරීම අහෝසි කර එයත් අපේ නායක ස්වාමීන් වහන්සේලාගෙන් සමන්විත අනුශාසක මණ්ඩලයට දිය යුතුය කියා. අනුශාසක මණ්ඩලයේ ඉන්නේ ලංකාවේ බෞද්ධ ජනතාවගේ ගෞරවයට පාත්‍රවුණු හැම නිකායකම මහා නායක ස්වාමීන් වහන්සේලා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

මෙහි තිබෙන්නේ මුදල් පරිහරණය—

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

මුදල් පරිහරණය සම්බන්ධ වැඩි බලතල නායක ස්වාමීන් වහන්සේලාට දිය යුතු බවයි, මගේ අදහස.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

මුදල් පරිහරණය නායක ස්වාමීන් වහන්සේලාට දෙන්නට අපේ බලාපොරොත්තුවක් නැහැ.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

මෙම පනතේ 16 වැනි වගන්තියෙන් ඇමතිතුමාට අනවශ්‍ය බලපතල පවරා ගෙන තිබෙන බව මගේ අදහසයි.

"16. මේ පනතේ හා ව්‍යවස්ථාවල හා නියෝග වල විධිවිධානවලට යටත් ව පහත සඳහන් බලතල, යුතුකම් හා කාර්යයන් දායක මණ්ඩලය සතු විය යුතු අතර එම මණ්ඩලය විසින් ඒවා ඉෂ්ට කළ යුතු ය:—

(අ) විශ්ව විද්‍යාලයේ දේපළ හා මුදල් පරිපාලනය කිරීම, සහ යමකට නොයෙදූ මුදල් කිසිවක් වෙතොත් ඒවා ද ඇතුළු ව විශ්ව විද්‍යාලයට අයත් යම් මුදල් භාර ආඥාපනතේ 20 වන වගන්තියේ හෝ වෙන යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ භාර මුදල් ආයෝජනය කිරීම නීත්‍යනුකූල යම් සුරක්ෂිත තැන්පත් කිරීමක ආයෝජනය කිරීම; හෝ එවැනි මුදල් කිසිවක් මුදල් ඇමතිවරයාගේ අනුමතිය ඇති ව ලංකාවේ නිශ්චල දේපළ මිළයට ගැනීම පිණිස ආයෝජනය කිරීම හෝ එවැනි ආයෝජන වෙනස් කිරීම; හෝ වහා කෙරෙන වියදම් සඳහා අවශ්‍ය නො වන එවැනි මුදල්වල යම් කොටසක් මුදල් ඇමතිවරයා විසින් අනුමත කරන ලද යම් බැංකුවක ස්ථිර තැන්පත් මුදලක් වශයෙන් තැන්පත් කිරීම;".

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒ මුදල් ගැන කටයුතු.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

ඒ කටයුතු අනුශාසක මණ්ඩලයට දුන්නොත් ? අනුශාසක මණ්ඩලය විසින් දායක මණ්ඩලය පත් කරගනු ලැබුව හොත් දේශපාලන ඇඟිලිගැසීමක් හෝ ඇමතිතුමාගේ ඇඟිලිගැසීමක් හෝ සිදු වන්නේ නැහැ. මුදල් පරිහරණය දායක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මණ්ඩලයට පවරන්නට පුළුවනි. දායක මණ්ඩලය පත් කිරීමේ කටයුත්ත ඇමතිවරයා වෙත තබා ගන්නේ නැතිව නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලාට භාර දුන්නොත් වඩා හොඳයි. දායකයන් කවුරුන් දැයි උන්වහන්සේලා දන්නවා. වඩා හොඳ දායකයන් කවුරුන්දැයි හොඳින් දන්නේ ස්වාමීන්වහන්සේලායි. අනුශාසක මණ්ඩලය විසින් දායක මණ්ඩලය පත් කරනු ලැබුවහොත් භේදයක් ඇති වන්නේ නැහැ.

**ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

මූදල් සම්බන්ධ කටයුතු භාර ගන්නට හාමුදුරුවන් කැමති නැහැ. පවිත්‍ර අන්දමින් බුද්ධාගමට ආලෝකය දෙන්නටයි, අප මේ උත්සාහ ගන්නේ. 1966 සිටම අප මේ ගැන ස්වාමීන් වහන්සේලා සමග සාකච්ඡා කළා.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

මා සමග සාකච්ඡා කරද්දී නම් හැම දේම භාර ගන්නට ලැස්ති බව මට කීවා.

34 වන වගන්තියෙහි ධර්ම පීඨාධිපතීන් වහන්සේ නිලයෙන් පහ කිරීම ගැනත් මණ්ඩලයක් පත් කිරීම ගැනත් සඳහන් වෙනවා:

"34. (1) ධර්ම පීඨාධිපතීන් වහන්සේ හෝ යම් මණ්ඩලයක් විශ්ව විද්‍යාලයේ යහපතට හානි කර ආකාරයකින් ක්‍රියා කර ඇති බව ඔප්පු කිරීමට සෑහෙන කරුණු ඇතැයි ඇමතිවරයා අදහස් කරන අවස්ථාවක ඇමතිවරයා විසින් ලියවිල්ලකින් වූ ආඥාවක් මගින් අවස්ථාවෝචිත පරිදි,—

(අ) ධර්ම පීඨාධිපතීන් වහන්සේ නිලයෙන් ඉවත් කළ හැකිය;

(ආ) ඒ බල මණ්ඩලය විසුරුවා හැරිය හැකි ය."

ඇමතිතුමා මෙම බලතල සම්පූර්ණයෙන්ම පවරා ගැනීම වැරදියි. මේ තනතුරුවලට පත් වන්නේ උපසම්පදාව ලැබූ භික්ෂූන් වහන්සේලා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

වැරදි සහිත කෙනකු බව ඔප්පු වුණොත් ?

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

වැරදි සහිත කෙනකු බව ඔප්පු වන්නේ ඇමතිතුමාගේ දැනුම අනුවද ? මෙහි සඳහන් වන්නේ "ඇමතිවරයා අදහස් කරන අවස්ථාවක" කියායි. භික්ෂූන් වහන්සේ නමකගේ වැඩ හොඳද කියා තීරණය කරන්නේ ඇමතිවරයායි. මා කියන්නේ ඒ කටයුත්ත භාරගන්න එපාය කියලයි. ඒ සඳහා ඇමතිවරයාට ඉහළින් සිටින අනුශාසක මණ්ඩලයේ භික්ෂූන්වහන්සේලා සිටිනවා.

මේ පනත පිළිබඳව ඒ තරම් කාලවේලාව ගත කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. එමෙන්ම මේ ගැන කථා කරන්නට අදහස් කරන්නේත් තවත් මන්ත්‍රීවරුන් කීප දෙනකු පමණයි. දකුණු කොළඹ මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) මේ ගැන දීර්ඝ වශයෙන් අදහස් ප්‍රකාශ කිරීමට බලාපොරොත්තු වෙනවා. මේ පනතට විරුද්ධ පාර්ශ්වයේ හැම කණ්ඩායමක්ම සම්පූර්ණ කැමැත්ත දෙන බව මා ප්‍රකාශ කරනවා. අපට වුවමනා කරන්නේ අප දෙපක්ෂයේ සම්පූර්ණ සහයෝගය ඇතිව අපේ බෞද්ධ ධර්මය මුළු ලෝකය පුරාම ප්‍රචාරය කර හරින අතරම හොඳ ධර්මදේශක සවාමීන් වහන්සේලා ඇති කිරීමයි. ගරු ඇමතිතුමාගේ පරමාර්ථයත් එයයි. එවැනි උසස් පරමාර්ථයක් ඇතිව වැඩ කරන නිසා අප විසින් පෙන්වනු ලබන යම් යම් දුර්වලකම් කාරක සභා අවස්ථාවේදී සකස් කර ගෙන හොඳ පනතක් ඉදිරිපත් කර ඒ මගින් මුළු ලෝකයටම බෞද්ධ ධර්මය බෙදා දෙන්නට හැකි වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 5.50

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමා මේ පනත ඉදිරිපත් කරන අවස්ථාවේදී එතුමාට කාගේත් සුභ පැතීම් හිමි විය යුතුයි කියා මා පිළිගන්නවා. විශේෂයෙන්ම මේ පිහිටුවන්නට යන ධර්ම පීඨය හරියාකාර පාලනය කරගෙන වැඩ කටයුතු සාර්ථක විධියට ගෙන යෑමට අද අපේ රටේ පහළ වී තිබෙන තත්ත්වය අනුව අවහිර රාශියක් තිබෙනවාය කියන කරුණත් ගරු ඇමතිතුමා පිළිගන්නවා ඇති.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒ කියන්නේ ශිෂ්‍යයන් සොයා ගන්නට අමාරුයි කියලද ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඒ සම්බන්ධව විස්තරයක් කරන්නට මගේ බලාපොරොත්තුවක් නැහැ. එහෙත් නොයෙකුත් අමාරුකම් රාශියක් මතු වන්නට ඉඩ තිබෙන බව ගරු ඇමතිතුමාත් පිළිගන්නවා ඇති. ඇමතිතුමා ඇසූ ප්‍රශ්න යෙන්ම පෙනෙනවා මේ සම්බන්ධව පොඩි සැකයක් එතුමාගේ හිතේ තිබෙන්නට පුළුවන්ය කියා.

බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය පිහිටුවීමේ පරමාර්ථයන් මොනවාද කියා පනතේම තිබෙනවා. කලකට පෙර මේ කරුණ සම්බන්ධව සංස්කෘතික අංශයට උපදෙස් දෙන උපදේශක සභාවේ සිටින සවාමීන් වහන්සේලා ඉදිරිපිට පනත් කෙටුම්පතක් තැබූ බව මා දන්නවා. ඒ පනත් කෙටුම් පත සංශෝධනය කළ යුත්තේ කෙසේද කියා ඒ ගරු සවාමීන් වහන්සේලාගේ අදහස් වගයකුත් ඉදිරිපත් කළ බව මා දන්නවා. ඒ ගරු සවාමීන් වහන්සේලා ඉදිරිපත් කළ අදහස් අනුව කොතරම් දුරට ඒ පනත් කෙටුම්පත සංශෝධනය වී තිබෙනවාද කියා මා දන්නේ නැහැ. එක කරුණක් පමණක් මම කියන්නම්, ගරු සවාමීන් වහන්සේලාගේ දැනීම හෝ කරුණු හරියාකාර වටහා ගැනීමට ඇති ශක්තිය හෝ කිසි විටෙකත් අඩු කොට සලකන කෙනෙක් නොවෙයි මම. එහෙත් පනතක් ඉදිරිපත් කිරීමේදී හරියාකාර විස්තරයක් නොදෙනවා නම්, නීතිය පිළි බඳ පරිහරණයක් හරියාකාර නැති අයට, මොකක්ද මෙහි අර්ථය, කියා එක වරටම තේරුම් ගැනීමේ අපහසුවක් ඇති වෙනවා. බොහොම උගත් දෙස්තර මහත් වරුන්ටත් ඒ අමාරුව තිබෙන බව මා දන්නවා. වෛද්‍ය කටයුතු පිළිබඳ අනපනත් ගැන විස්තරයක් කියන විට, නීතිය අනුව වගන්තියේ තේරුම මෙයය කියා පෙන්නුම් කළාට පසුවයි, වෛද්‍ය වරයාට කරුණු හරියට අවබෝධ වන්නේ. පනත කියවීමෙන් පමණක් එහි අර්ථය මෙයය කියා වටහා ගන්නට වෛද්‍යවරයාට අමාරුයි. ඉංජිනේරු මහත්වරුන්ටත් ඒ අමාරුව තිබෙ නවා. ගරු ස්වාමීන් වහන්සේලාට පණ්ඩිත අභිධානයක් තිබුණත්, නීතිය ගැන විශේෂ දැනීමක් ඇති කර ගැනීම උන්වහන්සේලාගෙන් බලාපො රොත්තු වන්නෙ නැහැ. ඒ නිසා කෙටුම් පත් පනතක් ඉදිරිපත් කළ විට එහි අර්ථය මෙයය කියා වටහා ගන්නට උන්වහන්සේලාට ටිකක් අමාරු වෙනවා. මේ පනත සථාවර කාරක සභාවකට තබා, පනත ගැන සාක්ෂි දෙන්නට කැමති අය ඒ සථාවර කාරක සභාව ඉදිරියට කැඳවන්නට ගරු ඇමති තුමා කැමැත්ත ප්‍රකාශ කර තිබෙනවා. ඒ නිසා මේ පනත ගැන තව දුරටත් ඒ නාහිමියන් වහන්සේලාගේ අදහසුත් විමසා නිසි විධියට සංශෝධන ඇති කරන්නට පුළුවනි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

Only the Committee of the House, not outsiders.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

But others can come and give evidence before the Standing Committee.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

මේ පනත සථාවර කාරක සභාවකට තබන්නට කැමති බව ගරු ඇමතිතුමා එතුමාගේ කථාවේදී ප්‍රකාශ කළා. පනත ගැන සාක්ෂි දීමට කැමති අය ඒ කාරක සභාව ඉදිරියට කැඳවීම සාමාන්‍ය අයිතියක්. ගරු සවාමීන් වහන්සේලා මේ පනත ගැන සාක්ෂි දීමට කැමති නම් එය තහනම් කිරීම යෝග්‍ය නැති බව මා මතක් කරන්නට කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් මා පළමුවෙන්ම අහන්නට කැමතියි, බුඩ ශ්‍රාවක ධර්ම පීඨය යන නම තෝරා ගත්තේ ඇයි කියා. පාලි භාෂාව ගැන දන්නා අයට නම් මේ නමේ විශේෂ වටිනාකමක් තිබෙන බව හිතා ගන්නට පුළුවනි. එහෙත් මුළු ලෝකයේම සිටින්නේ, ලංකාවේත් සිටින්නේ, පාලි භාෂාව ගැන විශේෂ දැනීමක් ඇති අය නොවෙයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

මා කලින් කීවේ මේ ගරු සභාවේ තිබෙන " ඒ " සථාවර කාරක සභාව " බී " සථාවර කාරක සභාව කියන සථාවර කාරක සභා දෙකෙන් එකකට මේ පනත ඉදිරිපත් කරන බවයි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය යන නම පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නටයි, මා උත්සාහ කරන්නේ. ඇයි ශ්‍රී ලංකා බෞද්ධ විශ්ව විද්‍යාලයය කියන්නෙ නැත්තෙ ? එහෙම කිව්වම කාටත් තේරෙනවා. බෞද්ධ සංස්කෘතියට අයිති දෙයක් තමයි, විශ්ව විද්‍යාලත්.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

විශ්ව විද්‍යාලය සංස්කෘතියට අයිති දෙයක් වුණත් බෞද්ධාගම පිළිබඳව සලකන විට අප ඊට වඩා ඉහළ දෙයක් බලාපොරොත්තු වෙනවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට මා යොමු කරවන්නට කැමතියි, නාලන්දවේ තිබුණු විශ්ව විද්‍යාලය.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒ විශ්ව විද්‍යාලවලින් තමයි, බුද්ධාගම නැති වුණේ. ඒ තත්ත්වයේ එකක් නොවෙයි, මේක. ශාස්ත්‍රය දියුණු වුණා. පසුව ආගම පිරිහුනා. ඒක ඓතිහාසික ඇත්තක්. නාලන්දා, තක්ෂිලා විශ්ව විද්‍යාලවලින් නොයෙක් ශාස්ත්‍ර, විද්‍යා බොහොම දියුණුවට ඉගැන්නුවා. අන්තිමට ආගම පිළිබඳ පැත්ත බැස්සා. එයින් ආගම ක්‍රමයෙන් විනාශ වී ගියා. ශාස්ත්‍රීය අංශයත්, සංස්කෘතික අංශයත් දියුණු වුණා. ඒක ඇත්තක්.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, භාරත දේශයේ ඉතිහාසය පිළිබඳව ගරු ඇමතිතුමා සමග විවාදයකට බහින්නට මා සූදානම් නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

මා ඉතිහාසඥයෙක් නොවෙයි. බෞද්ධාගම ගැනත්, සංස්කෘතිය මෙන්ම ශාස්ත්‍රීය අංශය ගැනත් පමණයි මා සඳහන් කළේ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

කවුරුනුත් පාහේ පොදුවේ පිළිගන්න දෙයක් ගැනයි මා සඳහන් කෙළේ. ඒ සම්බන්ධයෙන් ඉතිහාසය පිළිබඳ විශේෂඥයන් සාක්ෂ්‍ය දරණවා ඇති. පොදුවේ කවුරුනුත් පිළිගන්න කාලයට පළමුවැනි සංගායනාවටත් පෙර සිටම විශ්ව විද්‍යාලීය තත්ත්වයේ තිබුණේ භාරත දේශයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඔය කී ආයතනයයි. බෞද්ධාගම, බුද්ධ ධර්මය ඉගැන්වීමේ කාර්යය කොතෙක් දුරට ඒවායින් කෙරී ඇද්දැයි ඉතිහාසඥයින් සාක්ෂ්‍ය දරණවා. විශ්ව විද්‍යාලයකැයි කීවාම එය ලෝකයේ කා අතරත් ප්‍රකට වන දෙයක් බවට සැකයක් නැහැ. බෞද්ධ විශ්ව විද්‍යාලයක් ඇති කළොත් මුළු ලෝකයේම කවුරුනුත් පිළිගන්නවා, මෙන්න ලංකාවේ බෞද්ධ විශ්ව විද්‍යාලයක් තිබෙනවා කියා. ධර්ම පීඨයකැයි කීවාම—ධර්ම පීඨයක් තිබෙනවාය කීවාම—ඒ විධියේ පිළිගැනුමක් ඇති වෙයිද?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

විශ්ව විද්‍යාලයක් නොවෙයි ඇති කරන්නේ. ඔය කියන ජාතියේ එකක් නොවෙයි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්වාමීන් වහන්සේලාගෙන් ඇහුවොත්, නායක ස්වාමීන් වහන්සේලාගෙන් ඇහුවොත් උන්වහන්සේලා මේ පරමාර්ථය සපුරාලීම සඳහා ඇත්ත වශයෙන්ම වඩා යෝග්‍ය ක්‍රමයක් දැයි කියාවි. බෞද්ධ විශ්ව විද්‍යාලයක් ඇති කිරීම වඩා යෝග්‍යයැයි උන්වහන්සේලා කියනු ඇති. පිහිටුවන්නට බලාපොරොත්තු වන මේ ආයතනය—මේ ධර්ම පීඨය—විශ්ව විද්‍යාලයකැයි ගරු ඇමතිතුමාම කියා තිබෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

බුද්ධාගම පිළිබඳව.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු ඇමතිතුමාගේ පනත් කෙටුම්පතේම එය කියා තිබෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

නැහැ, බෞද්ධාගමට අදාළ වන හරිය පමණයි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

පනත් කෙටුම්පතේම ඒ සටහන තිබෙනවා. දෙවැනි වගන්තියෙන් කෙටුම්පතේ අරමුණ මෙහෙමයි කියැවෙන්නේ :

"භික්ෂූන් වහන්සේලා සඳහා විශ්ව විද්‍යාලයක් පිහිටුවීමට සහ එය පාලනය කිරීමට විධිවිධාන සලස්වනු පිණිස වූ පනත් කෙටුම්පතකි."

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

භික්ෂූන් වහන්සේලාගේත් බෞද්ධාගමට අදාළ අංශය සම්බන්ධ සියලු දේ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඒ කියන්නේත් විශ්ව විද්‍යාලයක්.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

බෞද්ධාගමට අදාළ වන කරුණු පමණයි. අදාළ වන කරුණු සම්බන්ධ සියලු දේ. ඔය නාලන්දා, තක්ෂිලා වැනි බාහිර දේවල් උගන්වන තැනක් නොවෙයි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

විශ්ව විද්‍යාලය කියන නම යොදන්නේ නැද්ද?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

නම සම්බන්ධයෙන් අපට සටන් කරන්නට වුවමනාවක් නැහැ. වෙනස් කරන්නට වුවමනා නම් අපි ඒක වෙනස් කරමු.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
අපේ ගරු අගමැතිතුමා අධ්‍යාපනය ලත් කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයේ පිළිවෙළට සකස් වන්නට වුවමනා කරන්නේ නැහැ. ඒ වාගේම පේරාදෙණියේ විශ්ව විද්‍යාල යේ පිළිවෙළට සකස් කරන්නට වුවමනා වකුත් නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(Hon. J. R. Jayawardene)
ස්ථාවර කොමිටියේදී ඔය ඔක්කොම කථා කරමු.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
නැහැ, නැහැ, දැනුත් කියන්නට ඕනෑ. මම කියන්නම්. ගරු අධ්‍යාපන ඇමති තුමාම නොවෙයිද විශ්ව විද්‍යාලයක් පිහිටුවන බව කිව්වෙ ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
විශ්ව විද්‍යාලයකැයි කීවාම ඇති වන මානසික හැඟීම වෙන එකක්.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
බෞද්ධ විශ්ව විද්‍යාලය කීවාම සීමා වෙනවා නොවෙයිද ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
බෞද්ධ විශ්ව විද්‍යාලය කිව්වාම "කල්චර්" එක ඔක්කොම එනවා. එහෙම එව්වා කොළඹ තියෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(Hon. J. R. Jayawardene)
රෝස්මිඩ් ප්ලේස් එකේ තියෙන්නේ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
ඒ "ද බුඩිස්ට් යුනිවර්සිටි කොලේජ්" කියන ආයතනයයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ඉඳුරුවේ පඤ්ඤාතිස්ස හාමුදුරුවන්ගේ විශ්ව විද්‍යාලයයි ඒ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
ඒ සම්බන්ධයෙන් විවාදයක් කරන්නට වුවමනාවක් නැහැ.

ඊළඟට තිබෙන ප්‍රශ්නය මතු වන්නේ මේ පනතේ තිබෙන පාලක මණ්ඩලය පිළිබඳවයි.

ගරු ඇමතිතුමා කර තිබෙන්නේ කුමක්දැයි අපි බලමු. දැනට තිබෙන සරසවිවල තත්ත්වය, තත්ත්වයක් වශයෙන් මේ ධර්ම පීඨයටත් දීමට ගරු ඇමතිතුමා බලාපොරොත්තු වෙනවා. එසේ දීමේදී, පේරාදෙනි විශ්ව විද්‍යාලයේත් විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලවලත් තිබෙන සෙනෙට් සභාවට හුරු මණ්ඩලයක් අධ්‍යාපන හා පාලන කටයුතු පිළිබඳ මණ්ඩලයක් වශයෙන් මෙම ධර්ම පීඨයේත් ඇති කරනවා. ඊට ඉහළින් මහාධිකාරි මණ්ඩලයක් තිබෙනවා, සරසවිවල. මෙහිදී ගරු ඇමතිතුමා ඒ මහාධිකාරි මණ්ඩලය දෙකට කඩා, දෙබෑ කර, එක් කොටසක් අනුශාසක මණ්ඩලයක් වශයෙන් නම් කරනවා. එය භික්ෂූන් වහන්සේලාගේ මණ්ඩලයක්. අනෙක් කොටස දායක මණ්ඩලයයි. විශේෂයෙන්ම මුදල් පරිහරණය පිළිබඳ වැඩ කටයුතු මේ දායක මණ්ඩලයට පැවරෙනවා. ගරු ඇමතිතුමාගේ පණිත යටතේ විශ්ව විද්‍යාලවල ඇති කොට තිබෙන මහාධිකාරී මණ්ඩලය මෙහිදී දෙකට කඩා, අනුශාසක මණ්ඩලය, දායක මණ්ඩලය, යනුවෙන් මණ්ඩල දෙකක් ඇති කර තිබෙනවා. දැන් අපි මේ මණ්ඩල ගැන සලකා බලමු.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පළමුවැනි එක අනුශාසක මණ්ඩලයයි. මෙහි සභිකයින්ගෙන් සමහරක් ඒ ඒ නිකාය මගින් තෝරා පත් කෙරෙනවා. ඒ බව පණතේ 10 වැනි වගන්තියෙහි සඳහන් වන්නේ මේ විධියටයි :

"(1) අනුශාසක මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය :—

(i) සියම් නිකායේ මල්වතු පාර්ශ්වයේ මහා නායක ස්වාමීන් ද්‍රයන් වහන්සේ ;

(ii) සියම් නිකායේ අස්ගිරි පාර්ශ්වයේ මහා නායක ස්වාමීන් ද්‍රයන් වහන්සේ ;

(iii) ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ සභා පතින් වහන්සේ ;

(iv) රාමඤ්ඤ නිකායේ මහා නායක ස්වාමීන් වහන්සේ ; සහ

(v) අනුරාධපුර අටමස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ ; සහ

(vi) ඇමතිවරයා විසින් නම් කරනු ලබන තුන් නමකට නොවැඩි වෙනත් සවාමීන් වහන්සේලා ගණනක්."

මේ විධියට ඇති කරනු ලබන අනුශාසක මණ්ඩලයේ සභාපති ධුරය නිල බලයෙන්ම පැවරෙන්නේ සියම් නිකායේ මල්වතු පාර්ශ්වයේ මහානායක ස්වාමීන් වහන්සේටයි. මට නම් මෙහි කිසිම විශේෂයක් නැහැ, කවුරු සභාපති වුණත් එකයි. එහෙත් ඇති තතු සලකා බලා මේ ගැන සිත් යොමු කරතොත්, මේ සභාපති නිලය පුරවා ගැනීමේ කටයුත්ත ඒ ගරු ස්වාමීන් වහන්සේලාට බාර දීම වඩා යෝග්‍ය බව ගරු ඇමතිතුමාටම පිළිගන්නට පුළුවන් වෙනවා ඇති. සභාපති නිලයට කෙනකු තෝරා ගැනීම මේ නායක ස්වාමීන් වහන්සේලාටම බාර දීම සුදුසුයි. සභාපති නිලය පිරවීමේ කාර්යය පිළිබඳ බලය මෙම පණතින් අප වෙත පවරා නොගෙන එය නායක ස්වාමීන් වහන්සේලාටම බාර දීම මැන වැයි මා කල්පනා කරනවා.

අනෙක් ප්‍රශ්නය, මේ තරම් ගරු ගාම්භීරාකාරයෙන් පත් කරන්නට යන මේ අනුශාසක මණ්ඩලයට පැවරෙන කටයුතු මොනවාද යන්නයි. ඒ කටයුතු ගරු ඇමතිතුමා විසින් බොහෝ දුරට සීමා කර තිබෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

හැම එකකටම ඇඟිලි ගහන්න හාමුදුරුවරුන්ට බැහැ. අප උන්වහන්සේලා ආරක්ෂා කර ගන්නට ඕනෑ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු ඇමතිතුමා ඒ කටයුතු නොනිසි විධියට සීමා කර තිබෙන බවයි මා කල්පනා කරන්නේ. අධ්‍යාපන සහ පාලන මණ්ඩලයට 6 දෙනකු පත් කර ගැනීම මේ අනුශාසක මණ්ඩලයට අයිතියි. එය අවසාන වුණායින් පසු මේ මණ්ඩලයට පැවරෙන කටයුතු මොනවාද ? ධර්ම පීඨාධිපති තේරීමට ගරු ඇමතිතුමාට නම් තුනක් ඉදිරිපත් කරන්නට ඕනෑ. ඒ දෙවෙනි කාරණයයි. මේ දෙක ඉවර වුණාට පසුව උන්වහන්සේලාට පැවරෙන කටයුත්ත මෙපමණයි. ඒ කටයුතු මෙන්න මේ අන්දමටයි, සීමා කරල තිබෙන්නෙ :

"මේ පනතෙහි ද ව්‍යවස්ථාවල හා නියෝගවල ද විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන බලතල යුතුකම් හා කාර්යයන් අනුශාසක මණ්ඩලය සතු විය යුතු අතර එම මණ්ඩලය විසින් ඒවා ඉෂ්ට කළ යුතු ය :—

(අ) විශ්ව විද්‍යාලයට අදාළ කරුණු සම්බන්ධයෙන් අධ්‍යාපන හා පාලන සභාවේ හෝ දායක මණ්ඩලයේ ඉල්ලීම පිට අවස්ථෝචිත පරිදි එම සභාවට හා මණ්ඩලයට උපදෙස් දීම ;".

උපදෙස් දෙන්නෙ ඉල්ලුවොත් විතරයි. මොනම කාරණයක් ගැනවත් ඉල්ලුවෙ නැත්නම් උපදෙස් දෙන්ට බැහැ. මණ්ඩලය නොමග යන අවස්ථාවක යම් දෙයක් කීම කාලෝචිත යයි කල්පනා කළත් මේ පනත අනුව ඒ සම්බන්ධයෙන් උපදෙස් දෙන්ට බැහැ. උපදෙස් දෙන්ට පුළුවන් කම තිබෙන්නෙ ඉල්ලුවොත් පමණයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

නොඉල්ලුවත් දෙන්ට පුළුවන් කියා අපට ඇතුළත් කරන්න බැරියැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னுட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඉල්ලීම පිට කියා එතැන සීමාවක් ඇති කරල තිබෙනව.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඉල්ලුවත්, නොඉල්ලුවත් කියමුකො.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னுட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

දැන්නෙ තමුන්නාන්සේ "කියමුකො" කියන්නෙ. ඒ වගන්තිය ඉංග්‍රීසියෙනුත් තිබෙන්නෙ එහෙමමයි.

Page 6, Section II—

"to advise the Board of Education and Administration and the Dayaka Mandalaya on matters relating to the University at the request of such Board or Mandalaya,..".

It says, "at the request of."

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

What do you suggest?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னுட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

We can discuss it. I will suggest an amendment.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුශාසක මණ්ඩලය රැස් වෙන්නෙ මෙහෙමයි:

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

"අනුශාසක මණ්ඩලයේ සභාපතිගේ හෝ ඇමතිවරයාගේ නියමයක් පිට විශ්ව විද්‍යාලයේ ලේකම් විසින් අනුශාසක මණ්ඩලයේ රැස්වීම් කැඳ විය යුතු ය."

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னுட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

10 වෙනි වගන්තියේ 3 වෙනි උප වගන්තියේ සඳහන් වෙන්නෙ මේ විධියටයි:

"අනුශාසක මණ්ඩලයේ සභාපතිගේ හෝ ඇමතිවරයාගේ නියමයක් පිට විශ්ව විද්‍යාලයේ ලේකම් විසින් අනුශාසක මණ්ඩලයේ රැස්වීම් කැඳවිය යුතු ය."

එයින්ම පෙනී යනව, මේ අනුශාසක මණ්ඩලයේ වැඩ කටයුතු බොහෙ‍ාම දුරට සීමා කර තිබෙන බව.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අපි වැඩිය උන්වහන්සේලාට කරදර කරන්නේ නැහැ. අනුශාසක මණ්ඩලයේ සිටින්නේ මහානායක ස්වාමීන් වහන්සේලා. උන්වහන්සේලාට නොයෙක් වැඩ කටයුතු තිබෙනව.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னுட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

මේ තරම් වගකීම් සහිත අනුශාසක මණ්ඩලයක් යටත් පිරිසෙයින් මාස 3 කට වරක්වත් රැස් විය යුතුයි. නියමිත රැස්වීමක් තිබිය යුතුයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අපි ඒව ඇතුළත් කරමුකො.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னுட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

මේ අනුව ගරු ඇමතිතුමා හෝ අනුශාසක මණ්ඩලයේ සභාපති කල්පනා කරල ඕනෑ, රැස්වීමක් කැඳවන්න. එසේ නැතිව රැස් වෙන්නට බැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

හා, හොඳයි, අපි කාරක සභා අවස්ථා වේදී ඒ ගැන සාකච්ඡා කරමු. මේක ඒ තරම් විරුද්ධ වෙන්න දෙයක් නොවෙයි. අපට වුවමනා බුද්ධාගමේ චිරස්ථිතියමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

I think the Hon. Minister is correct. The hon. Member can deal with the principle of the Bill and when the Bill is discussed at the Committee stage he can suggest amendments.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soyza)

In discussing the principle of the Bill, Mr. Deputy Speaker, I am at liberty to go into certain details that affect the question of principle.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

I do not think there is any controversy in regard to this matter.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soyza)

There is no controversy, but I am only stating certain matters for your consideration.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

We can discuss these things at the Committee stage.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

You are very sympathetic towards the Minister.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soyza)

I trust you will exercise some sympathy towards me.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

කාරක සභා අවස්ථාවේදී සාකච්ඡා කර අපි සුදුසු විධියට මේ පනත් කෙටුම්පත සංශෝධනය කරමු.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඊළඟට අධ්‍යාපනය හා පරිපාලන සභාව තිබෙනවා. පාඨමාලා යනාදිය සකස් කිරීමත් මේ මණ්ඩලයට පැවරෙනවා. ඒවා ව්‍යවස්ථානුකූලව තමයි කෙරෙන්නට ඕනෑ. ව්‍යවස්ථා තැනීම සම්බන්ධ කොටස දෙස බලන විට එය ව්‍යවස්ථානුකූලව කෙරෙන්නට තිබෙන වැඩක් හැටියටයි පෙන්නුම් කර තිබෙන්නෙ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ගරු මන්ත්‍රීතුමාට පෙනෙනවා නොවැ. මේකෙ වැදගත් කරුණු දෙකයි: එකක් අධ්‍යාපනය; අනික පරිපාලනය. නායක ස්වාමින් වහන්සේලායි ගුරුවරනුයි සියල්ලෝම භික්ෂූන් වහන්සේලායි. අධ්‍යාපනය පිළිබඳව ඒ පක්ෂයත්, මුදල් හදල් දාන මාන ආදිය සම්බන්ධව දායක මණ්ඩලයත් කටයුතු කරනවා. එපමණයි. මේක ඒ තරම් ගැඹුරු දෙයක් නොවෙයි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

අධ්‍යාපන හා පාලන සභාවේ කොහොමටත් ගිහියන් තුන් දෙනෙකු සිටිනවා. හතර දෙනෙකු වෙන්නටත් පුළුවනි. තුන් දෙනා නම්, සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ, අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්තුමා හා දායක මණ්ඩලයේ සභාපතිතුමායි. පුස්තකාලයාධිපති නිලයට පත් කරන්නේ ගිහියකු නම් හතර දෙනයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

තුමන පදවියක්වත් ගිහියකුට නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගුරු පදවියක් නැහැ ගිහියකුට. පුස්තකාලයාධිපති ගුරුවරයෙකු නොවෙයි.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ඒක හරි. අප බලාපොරොත්තු වෙන්නෙ නැහැ ඒ පදවියට ගිහියකු පත් කරන්න.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
තමුන්නාන්සේගේ අර උසස් අධ්‍යාපන පනතේ නම් පුස්තකාලයාධිපති මහාචාර්ය වරයකුට සමාන විය යුතුය, ඒ පිළිවෙළටම පත් කළ යුතුය, කියා සඳහන් කර තිබෙනවා. හැබැයි, ඒ වගන්ති අනුව නොවෙයි දැන් පත් කරන්නෙ. කෙසේ වෙතත්, එය තමුන්නාන්සෙගේ උසස් අධ්‍යාපන සභාවේ වරදක්. මෙතැන යටත් පිරිසෙයින් ගිහියන් තුන් දෙනෙකුවත් සිටිනවා. සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ, අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් හා දායක මණ්ඩලයේ සභාපතිතුමා ඒ තුන් දෙනායි. එතකොට ගිහියන් තුන් දෙනයි.

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)
ඒක හරිගස්සා ගන්නට පුළුවනි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
දායක මණ්ඩලයේ සභාපතිතුමා පාඨමාලා සකස් කිරීම ගැන—

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
එතැන තිබෙනවා නොවැ මුදල් ප්‍රශ්නයත්. මුදල් පරිහරණය දායක මණ්ඩලයටයි. සමහරකුට උගත්කම තිබුණාට මුදල් වියදම් වන සැටි, මුදල් එන හැටි ගැන එතරම් වැටහීමක් නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
නමුත් තමුන්නාන්සේ මෙතැන මොන වාද කියා තිබෙන්නෙ? ගරු ස්වාමීන් වහන්සේලා මුදල් පරිහරණයෙන් තොරව තබා ගන්නට ඇමතිතුමා බලාපොරොත්තු වෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ඔව්.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
විද්‍යාලංකාර, විද්‍යෝදය විශ්ව විද්‍යාල පිළිබඳව ගුණවර්ධන කොමිෂන් වාර්තාවේ සඳහන් කර තිබුණු ඇතැම් කරුණු සැල කිම උඩ, මේ තීරණ ගෙන තිබෙනවා යැයි අපට හිතන්නට පුළුවනි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ඒ ගැන හිතා නොවෙයි. බෞද්ධ විශ්ව විද්‍යාලයක් මෙසේ විය යුතු යැයි හිතුවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
කොයි ආකාරයට අදහස් කළත්, මුදල් පරිහරණය භික්ෂූන් වහන්සේලාගෙන් ඈත් කරන්නටයි, ඇමතිතුමා කල්පනා කළේ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ඔව්.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
මුදල් තැන්පත් කර තිබෙන තැනින් ගෙන වියදම් කිරීම භික්ෂූන් වහන්සේලාට අයිති නැති වුණත්, වියදම් කරන්නේ කොයි ආකාරයටද කියන කාරණය පිළිබඳව බලය පවරා ඇතතේ පැවිදි පාර්ශ්වයේ වැඩි පිරිසක් සිටින අධ්‍යාපන සභා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාලක මණ්ඩලයටයි. එතැන ඒ අදහසේ පරස්පර විරෝධී ස්වභාවයක් තිබෙන බව පෙන්නුම් කරන්නට ඕනෑ.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
නෑ, නෑ.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
IV වැනි කොටස බැලුවොත් පෙනේවි.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
IV වැනි කොටසේ මොකක්ද? මුදල් පරිහරණය අයිති දායක සභාවටයි.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
IV වැනි කොටසේ, 18 වැනි වගන්තියේ, (එ) කොටස :

"විශ්ව විද්‍යාලයේ මුදල් හා දේපළ පිළිබඳ පරිපාලනය ;"

ඒ පරිපාලනය පිළිබඳ ව්‍යවස්ථා හදන්නේ මුදල් පරිහරණයක් අයිති නැති අධ්‍යාපන සහ පාලක මණ්ඩලයයි.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
කොයි වගන්තියද කියවන්නේ ?

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soyza)
18 වැනි වගන්තියේ (එ) කොටස.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
"විශ්ව විද්‍යාලයේ මුදල් හා දේපළ පිළිබඳ පරිපාලනය ;"

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
ඒ පිළිබඳව ව්‍යවස්ථා හදන්නේ අධ්‍යාපන සහ පාලක මණ්ඩලයයි. ඒ මණ්ඩලයේ වැඩි පිරිස භික්ෂූන් වහන්සේලායි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
The Board of Education is part of the Statute.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
Then there may be statutes regarding administration and financial matters.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
They only make the statutes.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
With a view to taking financial matters entirely out of the consideration of those who have been ordained you want to leave all financial matters in the hands of laymen ? If that is your object even the making of statutes and procedure regarding the drawing of cheques and the meeting of expenditure and so on should not be their business. I am only pointing out an inconsistency. ඉන් එහා තිබෙන කරුණු ස්වල්පයක් මීට වඩා දුරට යනවා. මේ දායක මණ්ඩලය—

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
We can discuss all that at the Committee stage. We agreed to finish the Second Reading today. We came to this agreement at the party leaders' meeting.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

At the party leaders meeting it was agreed that this Bill will be referred to a Standing Committee if we get through the Second Reading stage today.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

But, Sir, that shoud not mean we should limit the number of speakers.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ස්ථාවර කාරක සභාවකට මෙය භාර කරනවා නම් දෙවැනි වර කියැවීමේ විවාදය අදම අවසන් කරන්නට පක්ෂ නායකයන් කැමති වුණා. ඔය ඕනෑ කථාවක් ඒ කාරක සභාවේදී කියන්නට පුළුවනි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

සීමා කරන්නට කැමති වුණා. නමුත් විවාදය අදම ඉවර කරන්නට අදහස් කෙළේ නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

තමුන්නාන්සේත් කෑගල්ලේ මන්ත්‍රීතුමාත් පමණයි, කථා කරන්නට බලාපොරොත්තුවෙන් සිටියේ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

15 වැනි වගන්තියෙන් දායක මණ්ඩලය ගැන ගරු ඇමතිතුමා විශේෂයෙන් කරුණු දක්වා තිබෙනවා. මම දැන් එය කියවන්නම්:

"15. (3) කාන්තාවක් ඇය කාන්තාවක නිසා ම දායක මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් නම් කරනු ලැබීමට නුසුදුසු නොවිය යුතුය."

මේ වගන්තිය නැතිවාට කාන්තාවකට දායක මණ්ඩලයේ සාමාජිකත්වයක් දෙන්නට බැරිද?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒ වගන්තිය අනවශ්‍ය නම් ඒක අතහැර දමමු.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

මේල පලදනාව පූජා කළ විශාඛා මහා උපාසිකාව වැනි මහා උපාසිකාවන් එදා සිටියා. ඒ වාගේ පූජාවන් කරන්නට සූදානම් උපාසිකාවන් සිටිය හැකි බවට ඇමතිතුමා තුළ හැඟීමක් තිබෙන බව මා දන්නවා. කෙසේ වෙතත් මෙවැනි වගන්තියක් ඇති කෙළේ මක්නිසාද?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒක වුවමනා නැත්නම් අතහැර දමමු.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

වුවමනා තරම් කාන්තාවන් පත් කර ගැනීම ගැන මගේ කිසිම විරුද්ධත්වයක් නැහැ. කෙසේ වෙතත් මේ වගන්තිය දැක මා පුදුමයට පත් වුණා. වෙනත් පනත් වල නම් මෙවැනි වගන්ති නැහැ. මෙම පනතේ පමණක් කාන්තාවන්ගේ අයිතිය ආරක්ෂා කර ගැනීමට ඉදිරිපත් වීම ගැන මේ රටේ කාන්තාවන්ගේ ගෞරවය හා කෘතඥතාව ගරු ඇමතිතුමාට ලැබේ යැයි බලාපොරොත්තු වෙනවා.

ඊළඟට ලේකම් නිලය දරන පුද්ගලයා ගැන බලමු. පාලක මණ්ඩලයේ ලේකම් වරයාත් දායක සභාවේ ලේකම්වරයාත් එකම පුද්ගලයායි. අනුශාසක මණ්ඩලය රැස් කරන්නේත් ඔහුමයි. එතකොට මේ ලේකම්වරයාට විශාල බලතල රාශියක් තිබෙනවා. ඇමතිවරයා හැරෙන්නට බලය රැඳී ඇත්තේ ලේකම්වරයා අතෙයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

කිසිම හෝ බලය තිබෙන්නට එපාය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soyza)

ලේකම්ට මේ විධියට බලතල තිබෙනවා නම් ඔහු කැමති අන්දමට මෙම ආයතනය නටවන්නට පුළුවනි.

සාමාන්‍යයෙන් අපරාධ නඩුවලට අදාළ වූ ප්‍රතිපත්තියක් 33 වැනි වගන්තියෙන් උල්ලංඝනය කර තිබෙනවා. එය රාජ්‍ය ඇමතිතුමාගේ විශේෂ සැලකිල්ලට යොමු කරවන්නට මා කැමතියි.

"33. (1) යම් තැනැත්තකු විශ්ව විද්‍යාල සීමාව තුළ සිටීම නුසුදුසු ය යි සැලකෙන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් කීමට ඇති කරුණු කියා පෑමට ඔහුට අවස්ථාවක් දීමෙන් පසු, අධ්‍යාපන හා පාලන සභාවෙහි කැමැත්ත ඇති ව, ඒ තැනැත්තා වෙත භාර කරනු ලබන තම අත්සන යටතේ වූ ලිය විල්ලක් මගින්, විශ්ව විද්‍යාල සීමාවට හෝ ලිය විල්ලෙහි නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි එහි යම් කොටසකට පිවිසීම හෝ ඒ සීමාව හෝ එහි ඒ කොටසක් තුළ රැඳී සිටීම ලේකම් විසින් ඒ තැනැත්තාට තහනම් කළ හැකිය. අධ්‍යාපන හා පාලන සභාවෙහි කැමැත්ත ඇතිව ලේකම් විසින් අවලංගු කරනු ලබන තුරු ඒ තහනම වලංගුව තිබිය යුතුය; එසේම වලංගුව පැවතිය යුතුය."

ඊළඟට මෙහෙම කියනවා :

"(2) තම සහතිකයෙහි නම සඳහන් යම් තැනැත්තකුට විශ්ව විද්‍යාල සීමාවට හෝ නිශ්චිත ව සඳහන් කරනු ලැබූ එහි යම් කොටසකට පිවිසීම හෝ ඒ සීමා තුළ හෝ එහි යම් කොටසක රැඳී සිටීම (1) වන උප වගන්තියෙහි විධිවිධාන අනුව තහනම් කරනු ලැබ ඇති බවට තම අත්සන යටතේ ලේකම් විසින් දෙනු ලබන සහතිකයක්, ඒ සහතිකයෙහි සඳහන් සිද්ධීන් එසේ නොවන බව ඔප්පු කරනු ලබන තුරු, ඒ සිද්ධීන් පිළිබඳ සාක්ෂි වශයෙන් අධිකරණයක් විසින් භාර ගෙන පිළිගත යුතු ය."

මේක අමුතු නීතියක්. අපේ අපරාධ නීතියේ පදනම අනුව නම් පැමිණිල්ලක් කළ විට වරද කළාය කියා ඒ පැමිණිල්ලෙන් ඔප්පු කරන්නට ඕනෑ. එහෙත් මෙතැන මේ ලේකම් මහතාගේ ලියවිල්ල අධිකරණයට ඉදිරිපත් කළ විට එය සාක්ෂි වශයෙන් සම්පූර්ණයෙන්ම පිළිගන්නවා, එය එසේ නොවේය කියා විත්තිකරු ඔප්පු කරන තුරු. මෙය අපේ අපරාධ නීතිය අනුව පරීක්ෂා කර දඬුවම් දීමේ ප්‍රතිපත්තියට හාත්පසින්ම විරුද්ධ දෙයක්.



**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

තමන්ගේ ගෙදරට හොරු ආවොත් විභාගයක් තිබෙනවාද ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

මෙතැන කියන්නේ විත්තිකරු උසාවියට ගෙන යැමෙන් පසුව සිදුවන දේ ගැනයි. මෙතන තිබෙන්නේ අධිකරණයට යැමක්. රුපියල් 100ක දඩයක් තිබෙනවා. ගරු ඇමතිතුමා මෙය කියවා නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayawardene)

Trespass.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

I shall come to the meaning of trespass. Clause 33 (2) says :

"(2) A certificate under the hand of the Secretary to the effect that any person named in the certificate has been prohibited, in accordance with the provisions of sub-section (1), from entering or remaining within the University precincts or any specified part thereof, shall be received and accepted by a court of law as evidence of the facts stated in such certificate until the contrary is proved."

He does not have to prove anything. His certificate will be accepted as sufficient evidence in a court of law. This is against normal principles of evidence in our courts of law.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

We can consider those things in the Committee stage.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

But this is a question of principle.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

මා අහන්නේ මෙයයි: පිළිගැනීමක් නොමැති කෙනෙක් විශ්ව විද්‍යාල සීමාව තුළ සිටීම ගැන මේ තරම් දරුණු විධියට ක්‍රියා කරන්නේ ඇයි? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවාට ඇතුළුවන ගුරුවරුන් හා ශිෂ්‍යයින් ගැන අපේ ගරු ඇමතිතුමාට විශ්වාසයක් නැතිවා වාගෙයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

විශ්වාසය තහවුරු වන තුරු.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

එහෙමනම් විශ්වාසයක් නැහැ. ඒ නිසා යම් විධියකින් එතැන සිටින ගුරුවරයකු හෝ ශිෂ්‍යයකු දේශපාලන අදහසක් දැරුවාය කියන කාරණය උඩ ඒ තැනැත්තා පිටුවහල් කරන්නටත් මෙය පාවිච්චි කරන්නට පුළුවන්. වරදක් කළ නිසාත් ඉවත් කරන්නට පුළුවන්.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

මෙය සාමාන්‍ය විශ්ව විද්‍යාලයක හෝ පාඨශාලාවක තත්ත්වයේ එකක් නොවෙයි. මෙය සම්පූර්ණයෙන්ම ආගමානුකූලව ආගමික කටයුතු කරගෙන යන තැනක්. එයට පටහැනිව එය අවබෝධ කර නොගෙන යමක් කලොත් අස් කිරීමට බලය තිබෙන්නට ඕනෑ. මෙතැන දේශපාලන ආදි දේවල් කරන්නට ඕනෑ තැනක් නොවෙයි. [බාධාකිරීමක්] බෞද්ධාගමේ දේශපාලනයක් තිබෙනවායෑ. ඇමතිතුමාට බලය තිබුණු නිසා යන්තම් විශ්ව විද්‍යාල බේරුණා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The Hon. Minister believes in *errare est humanum.*

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

The question is whether *humanus* applies to him.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

We have to consider all these matters during the Committee stage.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මනුෂ්‍යත්වය අනුව යම් ඉල්ලීමක් කළ මට දෝෂාරෝපනය කරන්නට මෙයට පැය බාගයකට පමණ උඩ දී ඉදිරිපත් වුණේත් මේ ගරු ඇමතිතුමාමයි. පසුගිය මහා මැතිවරණයේදී ගරු ඇමතිතුමාගේම පක්ෂය ත්‍රෛයිනිකායික මහා සංඝ සභාව නැමති සංවිධානයක් දේශ පාලන වේදිකාවලට කැඳෙව්වා. ඒ ස්වාමීන් වහන්සේලා දේශපාලනයට සහභාගි වීම වරදක්ය කියා එදා ගරු ඇමතිතුමාගේ කටින් කිසිම වචනයක් පිට වුනේ නැහැ. දේශපාලනයට සහභාගිවීම සම්බන්ධයෙන් නොවෙයි, යම් කිසි විධියක දේශපාලන මතයක් ප්‍රකාශ කළාය කියාත් මේ වගන්ති පාවිච්චි කර ඉවත් කරන්නට පුළුවනි. මේ විශ්ව විද්‍යාලය වෙනත් විශ්ව විද්‍යාල තත්ත්වයක් නොගන්න බව මට පිළිගන්නට පුළුවනි. මේ විශ්ව විද්‍යාලයට පිට කෙනකු ඇවිත් සිටිනවා නම් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නට රටේ බලපවත්වන සාමාන්‍ය නීතිය තියෙනවා. ඇයි, මෙතැන දී තවත් නීතියක් සකස් කරන්නේ? මේ නීතිය සකස් කරන්නේ ශිෂ්‍යයන්ට සහ ගුරුවරුන්ට විරුද්ධව පාවිච්චි කරන්නටයි. ඒ අය සම්බන්ධව විශාල අවිශ්වාසයක් ගරු ඇමතිතුමා තුළ තිබෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඇත් රටේ තියෙන තත්ත්වයේ හැටියට අවිශ්වාසයක් ඇති කර ගන්නෙ නැතිව පුළුවන්ද? උපාසකයන් වගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රිංගාගෙන එතැන කලබල කරන්නට පටන් ගත්තොත් එළියට දමන්නට බලය තියෙන්නට ඕනෑ නේද? ඔත්තු කාරයන් හැටියට ගියොත් බලය නැතිව එළියට දමන්නෙ කොහොමද?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்ணாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරුතර මහා සංඝ රත්නය කෙරෙහි ගරු ඇමතිතුමාගේ හිතේ තිබෙන විශ්වාසයට වඩා ලොකු විශ්වාසයක් මගේ හිතේ තිබෙන බවයි එයින් පෙනෙන්නේ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

What are you trying to protect?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்ணாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

I am trying to protect ordinary human rights. Nothing more than that.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෞකික තත්ත්වයෙන් ඉහළට යන්නට බලාපොරොත්තු වන ගරු ඇමතිතුමා ම්ලේච්ඡ භාවයටවත් ඔබින්නේ නැති බයක් ඇති කරගෙන—සැකයක් ඇති කරගෙන—ක්‍රියා කරන්නටයි යන්නේ. මනුෂ්‍යයාට අයිති සාමාන්‍ය අයිතිවාසිකම් වලින් තොරවයි, මේ විධියට බලහත්කාර යෙන් දොට්ට දමන්නට යන්නේ. දව සක් හිටියොත් රුපියල් සියක් දඩයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

බුද්ධාගම අනුව කිසිම අයිතියක් නැහැ. හැම දේම අනිත්‍යයි. මෙතැන වැඩ කරන්නට යන්නේ සාමාන්‍ය විධියට නොවෙයි, ඩිකක් ලෝකෝත්තර විධියටයි. සියල්ල දුකයි, සියල්ල අනිත්‍යයි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்ணாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු ඇමතිතුමාගේ පාලනය යටතේ සියල්ලකම දුක බව දැන් පෙනෙනවා. ගරු ඇමතිතුමාගේ ඇමති ධූරය පමණක් තවම අනිත්‍ය භාවයට පත් වුණේ නැහැ. ඉක්මනටම පත් වේවිය කියා මා බලා පොරොත්තු වෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

හෙට වෙනස් වෙන්නට පුළුවන්. කිසි දෙයක් නිත්‍ය නැහැ, අපේ ආගමේ හැටියට. හෙට වෙනස් වුනොත් මා එය පිළිගන්නවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்ணாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඒ නිසා මේ පනතත් ඉක්මනට වෙනස් කරන්න. මේ වගන්තියත් ඉක්මනට වෙනස් කරන්න.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

සාකච්ඡා කරලා වෙනස් කළ යුතු දේ වෙනස් කරමු. මේ බෞද්ධ විශ්ව විද්‍යාලය විකාරයක් කරන්න, කෝලම් මඩුවක් කරන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ. එක් එක්කෙනාට වුවමනා හැටියට ඇතුළෙ නටන්නට ඉඩ දෙන්නෙ නැහැ. කාමරවලට රිංගාගෙන මෙහෙ ස්ට්‍රයික් කරපල්ලා, අරෙහෙ ස්ට්‍රයික් කරපල්ලා කියන්නට ඉඩ දෙන්නෙ නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்ணாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු ඇමතිතුමාගේ හිතේ ලොකු බයක් තියෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඔව්, ලොකු බයක් තියෙනවා, අනිත් ඒවාට කරන්නට ගිය දේ මේකටත් කරයි කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்ஞட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

මේ ධර්ම පීඨයට ශිෂ්‍යයන් වශයෙන් ඇතුළත් වන්නේ කවුද කියා කල්පනා කරන්න. කාෂාය වස්ත්‍රය හොබවන, සාමාන්‍යයෙන් අවුරුදු ගණනක් තිස්සේ පැවිද්දන් හැටියට කල් ගත කළ, භික්ෂූන් වහන්සේලා ගැන නේද මේ සැකය පළ කරන්නේ ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

නැහැ, නැහැ, කාෂාය වස්ත්‍ර ඇඳගෙන අනෙක් අයටත් වඩා හයියෙන් හූ කියන, කුණුහරුප කියන අය. කාෂාය වස්ත්‍ර ඇන්දට විතරක් පුළුවන්ද ?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order please ! I understand there are some other hon. Members who wish to speak on this Bill, and it was agreed at the meeting of Party leaders in the Speaker's Room that we finish the Second Reading of the Bill and send it to Standing Committee " A ".

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

It was going to be non-controversial in the sense of the word. We accept the principles. But the hon. Members are entitled to place their views before the House. It does not mean that we must finish it today.—[*Interruption*].

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

As a matter of fact, I told the hon. Member for Colombo South that he can deal with the principles and leave the minor matters to the Committee.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

In deference to your wishes I must state that the details of what we discuss in the Committee never get published in the HANSARD or anywhere else. While we accept the principles I must state that there are grave defects in this Bill. Our duty is to present them here on the Floor of this House. So we must give the hon. Members a reasonable chance to present their views.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Then there must be no cross-talk.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

It is the Hon. Ministers who have started cross-talk.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்ஞட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විනය පිළිබඳව මෙහි තිබෙන්නෙ මොනවාදැයි බලමු. 14 වැනි වගන්තියේ තිබෙන්නේ මේ ආකාරයටයි :

" භික්ෂූන් වහන්සේ නමක් නොවන අධ්‍යාපන හා පාලන සභාවේ සාමාජිකයකුට—

(අ) (i) විශ්ව විද්‍යාලයේ ආචාර්යවරයකුගේ හැසිරීම හෝ සාමාර්ථ්‍යය සම්බන්ධ යෙන් වූ ; හෝ

(ii) විශ්ව විද්‍යාලය විසින් ප්‍රදානය කරන ලද හෝ පිරිනමන ලද අභිඥාන පත්‍රයක් හෝ වෙනත් විශිෂ්ටතාවක් දරන්නා වූත් භික්ෂූන් වහන්සේ නමක් වූත් යම් තැනැත්තකුගේ, හෝ,

(iii) භික්ෂූන් වහන්සේ නමක් වූ විශ්ව විද්‍යාලයේ යම් ශිෂ්‍යයකුගේ හැසිරීම සම්බන්ධයෙන් වූ

යම් කටයුත්තක් සාකච්ඡා කෙරෙන සභාවේ යම් රැස්වීමකට පැමිණ සාකච්ඡාවට හවුල් විය හැකි නමුදු ඒ කරුණෙහි ලා සභාව එළඹෙන තීරණයට, ඡන්දය දීමෙන්, ඔහු සහභාගි නොවිය යුතුය. "

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙයින් අදහස් කරන්නේ භික්ෂූන් වහන්සේ කෙනකුගේ—ගුරු තනතුරක් දරණ භික්ෂූන් වහන්සේ කෙනකුගේ හෝ ඉගෙනීමේ යෙදී සිටින ශිෂ්‍යයකුගේ —හැසිරීම ගැන යම් තීරණයක් ඇති වෙනවා නම්, එවැනි තීරණයට බහින අවස්ථාවකදී ගිහියන්ගේ ඡන්දය ඒ සඳහා ගන්නට බැහැ කියන එකයි. ඇයි එවැන්නක් තිබෙන්නේ ? සාමාන්‍ය යෙන් අපේ සංඝ සභාවේ චිරාගත ප්‍රතිපත්තීන් අනුව භික්ෂූන් වහන්සේලාට දඬුවම් දීම වැනි දෙයක් සම්බන්ධයෙන් ගිහියන් තීරණයකට බහින්නේ නැහැ. එයට ගරු කිරීමක් වශයෙනුයි එවැනි වගන්තියක් ඇතුළත් කර තිබෙන්නේ.

මේ තරම් ගැඹුරු ලෙසත්, සුපරීක්ෂා කාරී ලෙසත් මේ විධියේ වගන්ති ඇතුළත් කර තිබෙන මේ පනතේ ඊළඟට ඇතුළත් කර තිබෙන්නේ කුමක්දැයි අපි සොයා බලමු. භික්ෂූන් වහන්සේලාගේ වැඩ කටයුතුවලට ඇඟිලි ගසන්නට ගිහියන්ට ඉඩ නොදිය යුතුය යන වැදගත් ප්‍රතිපත්තියක් පිළිගැනීමට සකස් කර තිබෙන වගන්තියක් අඩංගු මේ පනතේ 34 වැනි වගන්තියේ තිබෙන්නේ මේ ආකාරයටයි :

"(1) ධර්ම පීඨාධිපතීන් වහන්සේ හෝ යම් බල මණ්ඩලයක් විශ්ව විද්‍යාලයේ යහපතට හානිකර ආකාරයකින් ක්‍රියා කර ඇති බව ඔප්පු කිරීමට සෑහෙන කරුණු ඇතැයි ඇමතිවරයා අදහස් කරන අවස්ථාවක............"

කිසිම විනිශ්චයක් නැහැ. කිසිම නඩු විභාගයක් නැහැ. කිසිම විධියක චෝදනා ඉදිරිපත් කිරීමකුත් නැහැ. පරීක්ෂණයක් හැටියට පවත්වන කිසිම දෙයක් නැතිව—

"ඔප්පු කිරීමට සෑහෙන කරුණු ඇතැයි ඇමතිවරයා අදහස් කරන අවස්ථාවක ඇමතිවරයා විසින් ලියවිල්ලකින් වූ ආඥාවක් මඟින් අවස්ථාවෝචිත පරිදි,—

(අ) ධර්ම පීඨාධිපතීන් වහන්සේ තිලයෙන් ඉවත් කළ හැකිය.

(ආ) ඒ බල මණ්ඩලය විසුරුවා හැරිය හැකිය."

ඇමතිවරයා විසින් ලියවිල්ලකින් වූ ආඥාවක් මඟින් අවස්ථාවෝචිත පරිදි ධර්මපීඨාධිපතීන් වහන්සේ තිලයෙන් ඉවත් කළ හැකියි, නොහොත්, ඒ බල මණ්ඩලය විසුරුවා හැරිය හැකියි. අධ්‍යාපන සහ පාලන මණ්ඩලයේ ගිහියන්, භික්ෂූන් වහන්සේ කෙනෙකුගේ හැසිරීම් ගැන සාකච්ඡා කරන අවස්ථාවක් දී එහි සිටින්නට පුළුවන් නමුත් තීරණයක් ගැනීමට සහභාගි වන්නට බැරියයි 14 වැනි වගන්තියෙන් ගරු ඇමතිතුමා තහනම් කරනවා. එහෙත්, ගිහියකු වන ගරු ඇමතිතුමාම නඩු විභාගයක් හෝ සාකච්ඡාවක් හෝ වෙන මොනම දෙයක් හෝ නැතිව පීඨාධිපතීන් වහන්සේ ඉවත් කිරීමට තීරණත් අරගෙන ක්‍රියාත්මක කරන්නට කටයුතු යොදනවා. තීරණ ගන්නේත් ඒවා ක්‍රියාත්මක කරන්නේත් ගරු ඇමතිතුමාමයි. මෙම පණත සකස් කර තිබෙන පිළිවෙළේ මූලික වරදක් තිබෙන බව මා කියන්නේ ඒ නිසායි. උසස් අධ්‍යාපන පණතෙහි ගැබ් වී තිබුණු මූලික වරද, අමාරුකම, පළුද්ද මෙතැනට ගෙනත් තිබෙනවා. පාලන මණ්ඩලවලට බලතල දෙන නමුත් වගකීම ඊට බාර නොදී අන්තිමේදී සම්පූර්ණ වගකීම ඇමතිතුමා පවරා ගැනීමයි මේ වරද. මේ නිසා, හැම අවස්ථාවකදීම මීට ඇඟිලි ගසන්නට ඇමතිතුමාට සිදු වෙනවා. අනුශාසක මණ්ඩලය පත් කරන්නේත් අනෙක් අය පත් කරන්නේත් ගරු ඇමතිතුමාමයි. මේ සියල්ලන්ම පත් කොට ඒ අය තමන්ගේ අතකොළු කර ගැනීමට ඉඩ තියා ගත්තායින් පසුව ඒ අය ගන්නා යම් තීරණයක් තමන්ගේ කැමැත්තට විරුද්ධ වුණොත් රුහුණේ වුණොත් ඒ සියලු දෙනාම අස් කරන්නේත් ගරු අධ්‍යාපන ඇමතිතුමාමයි. එසේ අස් කරනු ලබන අවස්ථාවකදී යටත් පිරිසෙයින් මේ ගරු සභාවට පැමිණ ඒ නියෝග ගැන සාකච්ඡා කරන්නටවත් අවස්ථාවක් මෙම පණතින් සලස්වා නැහැ. ප්‍රතිපත්තියට එවැන්නක් ඇතුළත් නොවන නිසා අපට සංශෝධනයක් මඟින් එය ඇතුළත් කරන්නටත් බැහැ. මේ විධියේ නියෝග නිකුත් කර තොත් මහජන ඡන්දයෙන් තේරී පත් වී සිටින අයට ඒවා සාකච්ඡා කරන්නට ඉඩ දිය යුතුයයි මා ගරු රාජ්‍ය ඇමතිතුමාටත් කියන්නේ ඒ නිසායි. මෙතැනදී එය දෙන්නට කැමැති නැත්නම් මේ ප්‍රශ්නය සංඝ සභාවකට පත් කරන්න. පීඨාධිපතීන් වහන්සේ වැනි ශ්‍රේෂ්ඨ තිලයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය පනත් කෙටුම්පත —දෙවන වර කියවීම

[බර්නාඩ් සොයිසා මයා.]

දරන කෙනකු නිළයෙන් පහ කිරීම හා එවැනි කෙනකුට දඬුවම් කිරීම සම්බන්ධ වත් නිකායවල මහා නායක ස්වාමීන් වහන්සේලාගෙන් සමන්විත විය යුතු මේ අනුශාසක මණ්ඩලය විසුරුවා හැරීම සම්බන්ධවත් ගරු ඇමතිතුමා තනි බලයෙන් තීරණයක් නොගෙන යටත් පිරිසෙයින් සංඝ සභාවක් ඉදිරියෙහි ඒ ප්‍රශ්නය සාකච්ඡා කොට, චෝදනා ඉදිරිපත් කොට, නඩු විභාගයක් පැවැත්වීමෙන් පසුව එසේ කරන ලෙස මා ඉල්ලා සිටිනවා. ගිහියකු වන ගරු ඇමතිතුමා මේ විධියට තනි කැමැත්තෙන් මෙවැනි මණ්ඩලයක් විසුරුවා හැරීම ගරුතර මහා සංඝ රත්නයට කරන අවමානයක් හැටියටයි සලකන්නට තිබෙන්නේ. අප මේ පණතට විරුද්ධ නොවන නමුත් මෙවැනි කරුණු පෙන්වා දිය යුතුයි. මෙය විශේෂ වරදක්, විශේෂ පළුද්දක් හැටියට පෙන්වා දිය යුතුයි. උසස් අධ්‍යාපන පණතේත් මෙවැනි වැරදි තිබෙනවා. විශ්ව විද්‍යාලයේ සෙනෙට් සභාවට ඉහළින් මහාධිකාරී මණ්ඩලය තිබෙනවා ; ඊට ඉහළින් ජාතික උසස් අධ්‍යාපන මණ්ඩලය තිබෙනවා ; ඊට ඉහළින් ගරු ඇමතිතුමා වාඩි වී සිටිනවා. මෙතැනත් ඒ විධියමයි. ඒ ඒ පීඨයන් සම්බන්ධ ආයතනවලට ඉහළින් අධ්‍යාපන සහ පාලන මණ්ඩලය තිබෙනවා; ඊට ඉහළින් අනුශාසක මණ්ඩලය තිබෙනවා ; ඊට ඉහළින්—මල්වත්තේ මාහා නායක ස්වාමීන් වහන්සේටත් ඉහළින්—කටයුතු කිරීමේ වගකීම මෙම පණතින් බාර ගන්නේ වෙන කවුරුන්වත් නොව ගරු අධ්‍යාපන ඇමතිතුමායි. මීට කිසිසේත් ඉඩ දෙන්නට බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ධර්ම පීඨයක් පිහිටුවන්නට ගරු ඇමතිතුමා බලාපොරොත්තු වන මේ අවස්ථාවේදී ඊට විරුද්ධත්වයක් දක්වන්නට අපගේ කිසිම බලාපොරොත්තුවක් නැහැ. එහෙත්, ගරු ඇමතිතුමාට ප්‍රකාශ කළ අදහස අනුව බුද්ධ ධර්මය ගැන දැනීම මේ රටේ නැවත වරක් දීප්තිමත් භාවයට පත් කරන්නට නම්, ලොව පුරා එය පතුරුවා හරින්නට නම්, මෙම ආයතනය පිහිටුවන්නේ ඇත්ත වශයෙන්ම ඒ අරමුණු ඇතිව නම්, ගරු ඇමතිතුමාට මේ තරම් බලතල අයිති කර ගැනීම [illegible] මෙම ගරු සභාවේ ඡන්දයකින් බලයදීමේ අමාරුකම් තිබෙන බව කියන්නට ඕනෑ. මේ කරුණු උඩම අප මේ පණතට විරුද්ධ වන්නේ නැහැ. මේවා ඉදිරිපත් කර තිබෙන්නේ තමුන්නාන්සේලාගේ වගකීම අනුවයි. ඒ වගකීම බාර වන්නේ තමුන්නාන්සේලාටයි. මීට කිසිම විධියකින් අකුල් හෙළන්නට අප අදහස් කරන්නේ නැහැ, මා ගරු රාජ්‍ය ඇමතිතුමාට විශේෂයෙන් කියන්නේ, භික්ෂූන් වහන්සේලාට විරුද්ධව ක්‍රියා කරන්ට සිදු වෙයි නම් සංඝාධිකරණයක් මගින් එසේ කරන ලෙසයි. සංඝාධිකරණයක් ඇති කිරීම පිළිබඳව බෞද්ධ කොමිෂන් සභාවේ නිර්දේශයක් තිබෙනවා. සංඝාධිකරණයක් මගින් හෝ එවැනි තත්ත්වයක් දරණ මණ්ඩලයක් මගින් හෝ පරීක්ෂණයක් නොපවත්වා ගරු ඇමතිතුමාට මේ අන්දමේ තනි බලයක් දීම සම්පූර්ණයෙන් බෞද්ධ ප්‍රතිපත්තිවලට හා විනය ප්‍රතිපත්තිවලට නොගැළපෙන දෙයක් බවයි මම මතක් කරන්නෙ.

මා මීට වඩා විස්තර සහිතව මේ ගැන කථා කරන්නට බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මේ පනතේ තිබෙන දෝෂයන් කීපයක් පෙන්වා දෙන්ටයි මා බලාපොරොත්තු වුණේ. ඒ කටයුත්ත සෑහෙන ප්‍රමාණයට ඉෂ්ට කර ගන්ට මේ අවස්ථාව නොවේය කියා මතක් කර දෙන ගරු රාජ්‍ය ඇමතිතුමාගේ කීමද පිළිගෙන මගේ කථාව මම සමාප්ත කරන්නේ මේ වචනවලින්. ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අදහස නම් ශ්‍රේෂ්ඨ අදහසක් හැටියට පිළිගන්නට පුළුවන්. ඒ නිසයි, මම මගේ කථාව සුභ පැතීමක් කරල ආරම්භ කළේ. එහෙත් මේ පනත සකස් කිරීමේදී ගරු නායක ස්වාමීන් වහන්සේලාගේ නියම උපදෙස් නොලැබී තිබෙන බවයි පෙනෙන්නෙ. උන්වහන්සේලාගෙන් උපදෙස් ලබාගෙන අපි කරන මේ විවේචනයන් අනුව මේක නැවත වරක් සලකා බලා අර උසස් අධ්‍යාපන පනතේ ගැබ්වී තිබෙන දුර්වලකම් මේ පනතෙන් ඉවත් කර දමා නිසි විධියට ක්‍රියාත්මක කරන්ට පුළුවන්වන ආකාරයට සකස් කර ගන්නවත් සමගම ස්වතන්ත්‍රය හෙවත් "ඔටොනොමි" කියන වචනය ගැන ගරු ඇමතිතුමා තුළ කොතරම් අකමැත්තක් තිබුණත් ගරුතර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මහා සංඝරත්නය පිළිබඳව කටයුතු කිරීමේදී මුදල් පරිහරණය වැනි කටයුතු ගිහියන් වෙත පවරණ අතර විනයෙන් පටන් ගත්තාම ගරු සංඝයා වහන්සේලා පිළිබඳව මතුවන අනිකුත් කරුණු පිළිබඳව ක්‍රියා කිරීමේ සම්පූර්ණ බලය හා වගකීම සංඝ සභාවම සතු විය යුතුය කියන අදහස ඉදිරිපත් කරමින් ඒ කාරණය පිළිබඳව නැවතත් සලකා බලා මේ පනත සංශෝධනය කරන ලෙස ඉල්ලනව.

අ. භා. 6.50

**ජයකොඩි මයා.**

*(திரு. ஜயக்கொடி)*

(Mr. Jayakody)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අධ්‍යාපන ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන්නෙ ඉතාම වැදගත් පනතක්. මේ රටේ භික්ෂු පරපුරේ අනාගත දියුණුව සඳහාත් භික්ෂූන් වහන්සෙලා විනයානුකූලව හා ධර්මානුකූලව හැඩ ගැස්වීමේ අභිලාෂයෙනුත් ගෙනැවිත් තිබෙන මෙම පනතට අපි අපේ පක්ෂපාතීත්වය දක්වන අතර මේ පනතේ වගන්තියක් පාසා බලාගෙන යන විට එක්තරා භයක් ඇමතිවරයා තුළ තිබෙන බව අපට පැහැදිලි වශයෙන් පෙනී යන බව මතක් කළයුතුව තිබෙනව.

මේ විශ්ව විද්‍යාලයේ පරමාර්ථයන් විශේෂ පරමාර්ථයන් බව අප පිළිගන්ට ඕනෑ. මේ වගේම පරමාර්ථයන් ඇතිව තමයි විද්‍යොදය හා විද්‍යාලංකාර පිරිවෙන් දෙක විශ්ව විද්‍යාල තත්ත්වයට පරිවර්තනය කරන්ට යෙදුණෙ. ඒ අවස්ථාවෙදි වෙන පනත්වලට නැති "විශ්ව විද්‍යාල පරමාර්ථ" කියන දේ ඒ පනත් දෙකෙහි ගැබ් කර තිබුණෙ. ඒ වගේම මේ පනතෙත් විශේෂ පරමාර්ථයන් පැහැදිලි කර යොදා තිබෙනව. බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම අනුව භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම, භාවනාව දියුණු කිරීම, ස්වදේශයේ හා විදේශීය රටවල බුද්ධ ධර්මය ව්‍යාප්ත කිරීම සහ බුද්ධාගම පිළිබඳ පර්යේෂණ කටයුතු කිරීම, බෞද්ධ සංස්කෘතිය දියුණු කිරීම, ආදි පරමාර්ථ මේ පනතට ගැබ්වෙලා තිබෙනව. එහෙත් මේ පළමුවෙනි වගන්තියේ සඳහන් වන "බෞද්ධ ධර්මීය" කියන වචනවලින් අදහස් කරන්නේ ලංකාවේ සහ වෙනත් හීනයාන රටවල හදාරණ බුද්ධාගම පමණක්ද, නැතහොත් මහායාන ධර්මයත් මීට ඇතුළත් වෙනවාද යන්න ගැන අපට පැහැදිලි අවබෝධයක් ලබා දෙන්ට ඕනෑ. මහායාන පසුබිම අනුව නොව ලංකාවේත්, බුරුමය, සියම, කාම්බෝජය යනාදී රටවලත් තිබෙන හීනයාන බුද්ධාගම හැදෑරීමේ පසුබිම අනුව ගරු ඇමතිතුමා මේ පනත් කෙටුම්පත සකස් කළාය කියා අපට විශ්වාස කරන්නට පුළුවනි.

ඇමතිතුමා මේ රටේ අධ්‍යාපන ක්‍රමය වෙනස් කරන්නට පනත් රාශියක් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම උසස් අධ්‍යාපන පනත් කෙටුම්පත ඉදිරිපත් කළ අවසථාවේදී අප පැහැදිලි වශයෙන්ම එතුමාට කියා සිටියා යම් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන විට මුල සිට අගට යනවා මිස අග සිට මුලට නොයන්නය කියා. අග සිට මුල දක්වා ගොස් ප්‍රශ්න නිරාකරණය කිරීම වැරදිය, සුදුසු නැත කියා අප ඒ අවස්ථාවේදී කියා සිටියා. සාමාන්‍ය හා කාර්මික පනත් කෙටුම්පතට පසුව උසස් අධ්‍යාපන පනත සාකච්ඡාවට ගනිමුය කියා අප කියා සිටියා. නමුත් එය පිළිගත්තේ නැහැ. දැන් මේ භික්ෂූන් වහන්සේලාට වෙනමම අධ්‍යාපන ක්‍රමයක් ඇති කරන්නට යන අවස්ථාවේදීත් එතුමා කටයුතු කරන්නේ එදා කටයුතු කළ ආකාරයටමයි.

එතුමා පළමුවෙන් විශ්ව විද්‍යාලය සකස් කරනවා. ඊටපසුව විශ්ව විද්‍යාලය සකස් කරනවා. ඊටපසුව පිරිවෙන් පනතේ යම් යම් වෙනස් කළ යුතු තැන් තිබෙනවා නම් ඒවා වෙනස් කරන්නට බලාපොරොත්තු වෙනවා. උසස් අධ්‍යාපන පනත් කෙටුම්පත පළමුවෙන් සම්මත කරගෙන එතුමා ඒ පනත යටතේ සාමාන්‍ය අධ්‍යාපනය ගැන නියෝග මගින් ක්‍රියා කරන්නට යෙදුණා. ඒවාගේම දැන් භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් විශ්ව විද්‍යාලයක් පිහිටුවන්නට යන මේ අවස්ථාවේදී දැනට තිබෙන පිරිවෙන් පනත උපයෝගී කරගෙන නොයෙකුත් චක්‍ර ලේඛන හා පාලන මාර්ගවලින් පිරිවෙන්වල තත්ත්වය වෙනස් කරගෙන යනවා. පිරිවෙන් පනත සම්බන්ධව දැන් මේ රටේ විශාල ආන්දෝලනයක් තිබෙනවා. මා සිතන හැටියට මේ අවුරුද්දේ අප්‍රේල් 29 වන දින සඳ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

හත් කර එතුමා දැන් පිරිවෙන් සම්බන්ධව අංක 4 දරණ චක්‍ර ලේඛය නිකුත් කර තිබෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

Is all this relevant to this Bill ?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Leaders of parties agreed before me in the Speaker's Chamber to finish the Debate on this Bill today and to take up the other Bill on Thursday. It would be unfair if hon. Members——

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

We are taking up the other Bill on Thursday. We did not agree to finish the Deabte on this Bill today. I think you have got a wrong impression.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

I am in your hands. I do not mind.

**පී. ජී. බී. කෙනමන් මයා. (මැද කොළඹ තුන්වන මන්ත්‍රී)**
*(திரு. பி. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர்)*
(Mr. P. G. B. Kenueman—Third Colombo Central)

I think this Debate can go on.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

මා කියන්නට යෙදුණේ බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයට පිරිවෙන් සම්බන්ධ වන හැටියි. පිරිවෙන්වල හෝ වෙනත් විශ්ව විද්‍යාලවල අධ්‍යාපනය හැදෑරුවාට පසුව තමයි මේ බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයට ඇතුළු වෙන්නට අවස්ථාව ලැබෙන්නේ. නමුත් ඇමතිතුමා මූලික වශයෙන් පිරිවෙන් පනත සංශෝධනය නොකර ඒ පිරිවෙන් පනත යටතේ එතුමාට තිබෙන බලතල පැවිච්චි කරමින් පිරිවෙන් කඩාකප්පල් වන තැනට කටයුතු කරනවා. පිරිවෙන් කඩාකප්පල් වුණොත් මේ බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයත් අනිවාර්යයෙන්ම කඩාකප්පල් වෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

මේ පනත් කෙටුම්පතට විරුද්ධද ?

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

අප මේකට සම්පූර්ණයෙන්ම පක්ෂයි. සියයට සියයක්ම පක්ෂයි. නමුත් මා කියන්නේ පිරිවෙන්වල තත්ත්වය වෙනස් කරන්නට ගරු ඇමතිතුමා නියෝග කර තිබෙන බවයි. අංක 4 දරණ චක්‍ර ලේඛයෙන් ඇමතිතුමා එහෙම නියෝග කර තිබෙනවා. පිරිවෙන්වල ඉගැන්වීම පිළිබඳ පාඨමාලා පමණක් නොවෙයි, ඒවායේ අධ්‍යාපන ක්‍රමය සම්පූර්ණයෙන්ම වෙනස් කරන්නට ගරු ඇමතිතුමා එමගින් නියෝග කර තිබෙනවා. මේ විධියට පිරිවෙන් ටික කඩාකප්පල් වුණාම බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයට කුමක් වෙනවාද යන්න ගැන අපට කල්පනා කරන්නට සිද්ධ වී තිබෙනවා. ඇමතිතුමාගේ කථාවේදී ශිෂ්‍යයන් නැති වෙයිද යන වචන පිටවුණා. ඇත්ත වශයෙන්ම ඒ වචන පිළිබඳව මා තුළ ලොකු සැකයක් බියක් පහළ වුණා. මේ විශ්ව විද්‍යාලය පිළිබඳව ඇමතිතුමා එවැනි දෙයක් බලාපොරොත්තු වෙනවාද කියා මා තුළ සැකයක් පහළ වුණා. ශිෂ්‍යයන් නැති කරන්නට එතුමා බලාපොරොත්තු වෙනවාද ? මේ ධර්ම පීඨයට ශිෂ්‍යයන් නැති කරන්නට එතුමා බලාපොරොත්තු වන්නේ කොහොමද ? පිරිවෙන්වලට ඇඟිලි ගසා පිරිවෙන් කඩාකප්පල් වුණාට පස්සේයි. ඒකයි, තිබෙන බය.

එතුමා නොයෙකුත් ප්‍රකාශ කළ බව මා පිළිගන්නවා. බෞද්ධාගම අනිවාර්ය විෂයයක් හැටියට උගන්වන්නට අකමැති පිරිවෙන් තිබෙනවා යැයි එතුමා කීවා. එය බොහොම භයානක ප්‍රකාශයක්. එවැනි පිරිවෙනුත් තිබෙනවාදැයි අප දැන ගන්නට ඕනෑ. අපේ බියක් තිබෙන නිසා ඒ පිළිබඳව පැහැදිලි කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගන්නට ඕනෑ. එවැනි පිරිවෙනුත් තිබෙනවා නම් ඒවා නියම පිරිවෙන් හැටියට පිළිගන්නට අපට පුළුවන්කමක් නැහැ. එහෙම නම් ඒවා වෙන මොනවා හෝ ආයතන වන්නට පුළුවනි. එහෙත් බෞද්ධාගම අනිවාර්ය විෂයයක් හැටියට උගන්වන්නට හැම පිරිවෙනක්ම සූදානම් වන්නට ඕනෑ.

ඒ වාගේම අධ්‍යාපන ඇමතිතුමා ප්‍රකාශ කර තිබෙනවා, "නාලන්දා", "තක්ෂිලා" කියන ඉන්දීය විශ්ව විද්‍යාල නිසා ඒ රටේ බෞද්ධ තත්ත්වය නැති නාස්ති වී ගියාය කියා. කොයි අවස්ථාවකදී එතුමා ඒ ප්‍රකාශය කළාදැයි මා දන්නේ නැහැ. එහෙත් බෞද්ධ සංස්කෘතිය හා ඉන්දීය ඉතිහාසය ගැනත් ඉගෙන ගන්නා මේ රටේ සෑම කෙනකුටම පැහැදිලි වශයෙන් කියා දෙන්නේ, "නාලන්දා" හා "තක්ෂිලා" වැනි අධ්‍යාපන ආයතන පැවැති යුග, කණිෂ්ක හා ධර්මාශෝක යුග ඉතාමත් දීප්තිමත් ස්වර්ණමය යුග හැටියටයි. එම නිසා, බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය පිළිබඳ අවංක යථාවබෝධයකින් යුතුව අධ්‍යාපන ඇමතිතුමා මේ ප්‍රකාශන කළායැයි මා විශ්වාස කරන්නේ නැහැ.

මේ රටේ පිරිවෙන් සම්බන්ධයෙන් භික්ෂූන් වහන්සේලා ලොකු බියකින් හිටියා. විශේෂයෙන්, උසස් අධ්‍යාපන පනත් කෙටුම්පතේ පිරිවෙන් සම්බන්ධව කිසිම දෙයක් සඳහන් නොවීම නිසා භික්ෂූන් වහන්සේලා ලොකු බියකින් පසු වුණා.

**එකල්හි වේලාව අ. භා. 7 වූයෙන් කටයුතු අත්සිටුවා විවාදය කල් තබන ලදී.**

**එතැන් සිට විවාදය 1968 ජනවාරි 10 වන බදාදා පවත්වනු ලැබේ.**

அப்போது பி. ப. 7 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பெற்றது.

விவாதம் 1968 ஜனவரி 10 புதன்கிழமை மீள ஆரம்பமாகும்.

*It being 7 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Wednesday, 10th January 1968.*

# කල් තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

**යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී:**

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය"—[ගරු ජේ. ආර්. ජයවර්ධන].

"சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக".—[கௌரவ ஜே. ஆர். ஜயவர்தன] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப்பெற்றது.

*Motion made, and Question proposed,*

"That the House do now adjourn".—[*The Hon. J. R. Jayewardene*].

**කෙනමන් මයා.**

(திரு. கெனமன்)

(Mr. Keuneman)

I wish to raise with the Hon. Prime Minister a matter about which I have already given him notice. The substance of the matter is a very limited aspect of the present strikes that are taking place in the private sector in Colombo and in some other towns.

I refer, Sir, to the conduct of certain police officers in relation to this matter. You will be aware that workers of nearly seventy firms in the private sector have been on strike since the 20th of December 1967, and that the strike is a dispute between the private sector employers, most of whom are members of the Ceylon Employers' Federation, and their workers.

Now, in such a situation one would normally expect that the duty of the police would be to see that law and order is maintained and that the police would impartially enforce law and order.

I am bringing this matter to the notice of the Hon. Prime Minister because there have been certain cases where it would appear that this impartiality is not being maintained. I want to make it clear that this is not a general accusation against the police, but there have been certain instances that I would like to bring to his notice, as well as one glaring case which I would ask him to look into.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

The General Secretary of the Ceylon Federation of Trade Unions, Mr. M. G. Mendis, some days ago addressed the Inspector-General of Police on this matter, and he made certain representations that some police officers—he was very categorical that this was not a general charge against all the police officers or against the majority, but against some police officers—had been acting in what would appear to be a partial manner, and were not confining themselves to the maintenance of law and order, but were taking the side of the private employers in certain factories.

I understand that today on the orders of the Inspector-General of Police, the Superintendent of Police, Colombo had called a conference with the Ceylon Federation of Trade Unions, the Ceylon Federation of Labour, and the Sri Lanka Independent Trade Union Federation where some of these matters were discussed and certain arrangements were made. Matters in dispute were the right of peaceful picketing, which has been accepted as a general trade union right, as well as the conduct of a partisan nature by certain police officers. It is this matter I want to bring to the notice of the Hon. Prime Minister and I am doing so not because I want to make this the part of the question of the merits or demerits of the strike, but because there is a certain phenomenon that has developed in the private sector of which notice has to be taken.

That phenomenon is that in recent years many private sector firms have employed former high-ranking police officers as executives or as security officers ; they have also employed former government officials who have connexions with police officers.

Therefore, when a strike arises in which private firms are involved it is necessary to see that those connexions that existed in the past are not misused, so that certain police officers may not be partisan in the discharge of their duties.

I do not wish to go into great detail, but I have before me a long list of such police officers and government officials who have recently joined as executives of these firms. Some of them are persons who were accused in the 1962 coup case ; others have had nothing to do with that case but were high-ranking police officers when they were in government service, still retain important connexions with the police, and are still regarded by some subordinate police officers as their superiors. I may mention a few. There is Mr. Douglas Liyanage, who was the first accused in the coup case——

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

He was not a police officer.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

No ; he was a civil servant. I shall refer to him again in respect of another matter. He is now an important executive in Elephant House. Then there is Mr. Sidney de Zoysa who is now an important person in the Galle Face Hotel. Then there is Mr. David Thambiah who is in Brodie & Company. Then there is Mr. Xavier, who is an ex-C.I.D. officer at Liptons. Then there is Mr. Kitto, ex-S. P., in Hayleys. There are also inspectors and others who have retired from the police force and are now holding important positions in various firms.

In this situation when certain police officers take what appears to be partisan action, one wonders whether former connexions are being utilized in any way when police officers intervene in a dispute between private employers and employees ; one wonders whether these police officers are taking the side of the employers, ex-police officers who are now important executives in firms.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Certain cases were brought to the notice of the I. G. P. where police officers have taken it upon themselves to tear down union banners which had been put up at the entrance to strike-bound firms. It is quite a common thing to have banners like that. In fact, in the majority of firms on strike even today union banners are being displayed and police officers take no action about them at all ; and I do not believe that there has been any general instruction to tear down union banners. Nevertheless, specific allegations were made about this matter in respect of Shaw Wallce & Company and Liptons.

Now, Sir, I understand that instructions have been issued to enforce the move-on-by-law within fifty yards of the gate of the firm in which there is a strike. I am not objecting to that. I am only trying to say that the by-law is being enforced in certain cases far beyond the fifty-yard limit. I am personally aware that in the case of Liptons the workers gathered on the other side near the Baptist Church, that is, well over fifty yards from the entrance to Liptons; but certain police officers turned up in a jeep and wanted the workers to move on. I had to intervene, and Mr. Mendis rang up the Superintendent of Police. Later, instructions were sent that it was fifty yards and no more ; beyond that distance the move-on by-law should not be enforced.

I am mentioning this because I want to refer to a circular which has come into my possession. It has been issued by Mr. Douglas Liyanage who is now, as I said, an important executive in Elephant House. He was the first accused in the coup case I mentioned. This indicates that the co-operation between the executive and certain police officers is something more than that which is concerned with the maintenance of law and order.

This is a circular signed by Mr. Liyanage dated 3rd January 1968, in which he sets out the duties of the night duty executive. First of all it is about how the executive is to be rostered. Then it goes on to say that the chief engineer's telephone, the number of which is given, should be continuously maintained. Then I shall read the relevant passages :

"It is also the responsibility of the night duty executive to ensure that adequate arrangements are made for the arrival of workers in the morning."

I might add that certain casual workers of Elephant House are being transported in the small hours of the morning there to do certain work.

"It is also the responsibility of the night duty executive to ensure that adequate arrangements are made for the arrival of workers in the morning. Police guard is expected to take up position at Glennie Street Level Crossing, the Bridge Street Level Crossing and the front gate at 5 A.M."—

This is, of course, far beyond the 50 yard area, Mr. Prime Minister, if you go into it.

—"If the guard is not in position by this time then the Slave Island Police should be contacted and every endeavour made to see that the guard is in position as soon as possible. It is also necessary that the front gate should be kept open from 4.30 P.M."

Now, this is all right because after all the Slave Island Police is the police which deals with the area.

It is the next paragraph that I want to draw your attention to, Mr. Prime Minister :

"Transport is provided to collect workers from Kollupitiya and Fort Police Stations. The executive should ensure that transport leaves in time for these places and that any calls from the places where the workers assemble are attended to."

Then he goes on about the transport arrangements for workers after 9 o'clock and so on.

After this came into my possession, I asked certain people associated with the strike to go to the Kollupitiya and Fort Police Stations and see whether in fact transport is sent to collect certain casual workers who

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

are acting as blacklegs and to transport them to Elephant House. They have come back and confirmed that that is so.

I would like you to find out whether that is happening and who authorized any police officer who is doing so in the Fort Police Station and in the Kollupitiya Police Station, which do not deal with Elephant House, to do so. There is the Slave Island Police to deal with that. It is becoming a collecting centre for blacklegs and a transporting centre for blacklegs.

I do not want to raise any other matter. I just want to ask the Prime Minister to look into this matter. It would appear that this is what is happening. All other matters regarding the strike we can settle in other forums ; we need not deal with those matters here.

Once again, I want to say that this is not a general accusation against the police. I am grateful to the Inspector-General of Police ; on a complaint, he did summon a conference and made an attempt to attend to certain outstanding questions. I only hope that these other matters will also be attended to.

One last question I want to ask : Have instructions been issued to the police to refuse loudspeaker permits for public meetings in open-air places ?

අ. භා. 7.12

**එස්. ඩී. බණ්ඩාරනායක මයා**

*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*

(Mr. S. D. Bandaranayake)

මේ ප්‍රශ්නය ගරු කම්කරු ඇමති තුමාට ඉදිරිපත් කරනවා.

Will the Hon. Minister of Labour and Housing make a statement to the House on the present strike situation and state why his Ministry or the Labour Department has not intervened to effect a settlement of the strike by compelling the employers to grant the just demands of the strikers ?

මගේ දෙවෙනි ප්‍රශ්නය ගරු සමාජ සේවා ඇමතිතුමාට ඉදිරිපත් කරනවා.

In view of the fact that the houses constituting about thirty or forty years of savings of families have been completely demolished or washed away by the recent floods and cyclones that prevailed in Polonnaruwa, Anuradhapura, Vavuniya, Chilaw, Ratnapura, Mannar, Trincomalee, Batticaloa, Attanagalle and Gampaha areas in October, November, and December 1967, and in view of the exorbitant cost of building materials prevailing today, will the Hon. Minister consider an increase in the assistance given to such victims from Rs. 400 to a minimum of Rs. 1,000 per house and make all those whose income is below Rs. 500 a month eligible for this amount, as it is the Government's responsibility to prevent the flooding of river basins in this country ?

අ. භා. 7.15

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනට පවතින වැඩ වර්ජනය සම්බන්ධයෙන් මාත් ගරු අගමැතිතුමාට වචනයක් දෙකක් කියන්නට කැමතියි. දැනට අරගලයක් පවතින්නේ පෞද්ගලික ආයතනවලයි. ස්වාමි හා සේවක පක්ෂ දෙක අතර පවතින ඒ අරගලයට දැනට දින කීපයක් ගත වී තිබෙනවා. අද කම්කරුවන්ට අමාරුවක් නැතැයි කවුරුන් හෝ පිළිගනිතැයි මා හිතන්නේ නැහැ. අද කම්කරුවන්ට සෑහෙන දුක්ගැනවිල්ලක් තිබෙනවා. ඒ නිසා ඔවුන් අරගලයක් පටන් ගෙන තිබෙනවා. හරි හෝ වේවා, වැරදි හෝ වේවා, කම්කරුවන් සටනකට බැස සිටිනවා.

මීට පසුව හෝ පොලීසිය අපක්ෂපාතව කටයුතු කිරීම යුතුකමකැයි මා කල්පනා කරනවා. පොලීසිය මැදහත් වී ගල් කිස්සේ හෝටලයේ වැඩ වර්ජනය කර සිටි කම්කරුවන් ඔවුන් සිටි ස්ථානවලින් ඉවත් කර තිබෙනවා. හොඳ වේලාවට කාරණා ඉදිරිපත් කර යම් යම් දේ හරි [illegible] ගන්නට පුළුවන් වුණා. කාරණා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා දුන්නාම වැරදි විධියට ක්‍රියා කිරීමේ වැඩ පිළිවෙළ වෙනස් කර ගන්නට පුළුවන් වීම ගැන සතුටු වෙනවා. නොයෙකුත් ස්ථානවල කම්කරුවන්ට අවහිර වන ආකාරයට පොලීසිය ක්‍රියා කිරීම සුදුසු නැහැ. මෙම ප්‍රශ්නය ගැන ආණ්ඩුව ඔය තරමට මැදිහත් වන එක සුදුසු යයි මා හිතන්නේ නැහැ. ආණ්ඩුව පක්ෂයක් ගෙන කටයුතු කිරීම සුදුසු නැහැ. පෞද්ගලික වශයෙන් මේ කම්කරුවන්ට දුක්ගැනවිලි තිබෙනවා. ඒවා ඉදිරිපත් කරලත් තිබෙනවා. සාකච්ඡා කරන්නටත් ලෑස්තියි. ඉතින් මේ අවස්ථාවේදී ආණ්ඩුව පක්ෂග්‍රාහීව කටයුතු කරන්නේ ඇයි? එය සුදුසු නැහැ.

තවත් කාරණයක් තිබෙනවා. මීට පෙර නම් නිදහසේ තම සටන් ගෙන යන්නට අවස්ථා තිබුණා. එහෙත් දැන් මොන කාරණයක් නිසා මේ විධියට පොලීසිය මැදහත් වී ක්‍රියා කරනවාදැයි අපට තේරෙන්නේ නැහැ. වැඩ වර්ජන අරගලයක් ගෙන යන විට යම් යම් කලබල ඇති වන්නට ඉඩ තිබෙන බව ඇත්තයි. එහෙත් ඒවා සංසිඳවා ගන්නට අමාරුවක් නැහැ. දෙගොල්ල කැඳවා සාකච්ඡා කර ඒවා බේරුම් කර ගන්න ආකාරයට වැඩ කළ හොත් ඒවා සංසිඳුවා ගන්නට පුළුවනි. ළඟදී ඇති වුණු ලිවර් බ්‍රදර්ස් සමාගමේ අරගලයට මාසයකටත් වැඩි කාලයක් ගත වුණා. එහිදී යම් යම් ගැටලු ප්‍රශ්න මතු වුණා. පොලීසිය ඒ අවස්ථාවේදී පක්ෂග්‍රාහීව වැඩ කළා යයි මා හිතන්නේ නැහැ. ඉතින් දැන් ඇති වී තිබෙන අරගලය ගැනත් වෙනත් කම්කරු අරගල මෙන් සලකන්නෙ නැතිව ක්‍රියා කිරීම සුදුසු යයි මා නොසිතන නිසයි, මෙම වචන ස්වල්පය කියන්නට අදහස් කෙළේ. දැන් ඇති කර තිබෙන අවහිර වුවමනා කරන ඒවා යයි මා හිතන්නේ නැහැ. කම්කරු අරගල ගෙන යෑමට අවහිර වන විධියට කටයුතු කිරීම කණගාටුවට කාරණයක්. ළඟදී රැස්වීම්වලට බාධා ඇති කර තිබෙනවා. මොන හේතුන් නිසාද මේ බාධා ඇති කර තිබෙන්නේ? ගරු අගමැතිතුමාට නොයෙකුත් වෛවාරණය, නොයෙකුත් මෝස්තරයේ පොලිස් වාර්තා ලැබෙනවා ඇතැයි මා විශ්වාස කරනවා. ඒ වාර්තා අනුව නම් මේ රටේ පුදුම තත්ත්වයක් ඇති වන්නට ඕනෑ. ඔය කියන වැරදි වාර්තා උඩ වැඩ කිරීම සුදුසු නැත කියා ප්‍රකාශ කරන එක මගේ යුතුකමක්. මෙය අද ඊයේ ඇති වූ එකක් නොවෙයි. කම්කරුවන්ගේ දුක්ගැනවිලි ගැන දැන් මාස ගණනාවක් තිස්සේ සිට දැවි දැවී එන ප්‍රශ්නයක් මේ. මේවා ගැන ක්‍රියා කිරීමට ඒ කම්කරු සමිති නොයෙක් අවස්ථාවල සූදානම් වුණා. තත්ත්වය උග්‍ර වුණේ රුපියලේ අගය අඩු කළාට පසුවයි. ඒ හේතුව නිසා සෑහෙන ප්‍රමාණයකින් බඩු මිළ ඉහළ නැංගා. අද කම්කරුවන් සටනට බැස සිටින්නේ ඒ නිසයි. ඒ නිසා මෙය පෞද්ගලික අංශයේ අපක්ෂපාත සටනක් හැටියට සලකා කොම්පැනිකාරයින්ගේ පැත්ත ගන්නේ නැතිව ඒ සාධාරණ සටන ගෙන යන්නට කම්කරුවන්ට තිබෙන නොයෙකුත් අවහිරකම් නැති කර අනිකුත් සටන් මෙන්ම ඒවා ඉදිරියට ගෙන යන්නට ඉඩ දෙන හැටියට ගරු අගමැතිතුමාගෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මේ කරුණට ගරු අගමැතිතුමා මැදිහත් වී පොලිසියෙන් ඇති වන අවහිරකම් තව දුරටත් ගෙන යන්නට ඉඩ නොලැබෙන හැටියට කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

අ. භා. 7.22

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා** (අගලවත්ත)

*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்த)*

(Dr. Colvin R. de Silva—Agalawatte)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඉඩම් සංවර්ධන ඇමතිතුමාගේ කල්පනාවට භාජන කළ යුතු ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු එම්. එච්. මොහමඩ් (කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති)**

*(கௌரவ எம். எச். முகம்மது—தொழில், தொழில் காண், வீடமைப்பு அமைச்சர்)*

(The Hon. M. H. Mohamed—Minister of Labour, Employment and Housing)

May I point out that the hon. Member has asked me to make a statement, and the Hon. Prime Minister has also got to reply?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

The longer my Friend interrupts me, the less time he will have.

**ගරු එම්. එච්. මොහමඩ්**
*(கௌரவ எம். எச். முகம்மது)*
(The Hon. M. H. Mohamed)

He must have the facts.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

The longer he interrupts me, the less time he will have.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Please carry on.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

I am under your discretion, not any Minister's discretion.

ඉතා කෙටියෙන් මිනිත්තු දෙකකින් ඒ කරුණ ගරු ඉඩම් සංවර්ධන ඇමතිතුමාට දැනුම් දීමටයි මා නැගිට්ටේ. එහෙත් ඒ මිනිත්තු දෙක නිස්කාරණේ නාස්ති වුණා.

වැවිලි සංස්ථාවේ වතු සේවක සමිතියේ පැලවත්ත රජයේ වතුයායේ සමිතියෙන් ගරු මුදල් ඇමතිතුමාට එවූ ලියමනක් මා මෙහිදී කියවූ විට කාරණයේ සාරාංශය පෙනී යනවා ඇති. ලියමන මේකයි :

> " වැවිලි සංස්ථාවේ වතු සේවක සමිතිය,
> පැලවත්ත රජයේ වතුයාය,
> මීගහතැන්න,
> 1967.12.12.

ගරු මුදල් ඇමති යූ. බී. වන්නිනායක මැතිතුමා,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ.

ගරු ඇමතිතුමනි,

හියවර ඔබතුමාගේ අයවැය ලේඛනයෙන් රජයේ හා සංස්ථා නිලධාරීන්ගේ මූලික වැටුප රු. 100 ට අඩු හා වැඩි අයට රු. 20 හා රු. 10 යේ අමතර දීමනාවක් දී සුළුවෙන් හෝ සම්සිය සහිත යක් සලසාදීමට කටයුතු කළ මුත්, ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලයේ වතුවල සේවය කරන සේවකයන්ට පමණක් එකී දීමනාව මෙතෙක් නොගෙවා ඇති බැව් ඔබතුමා වෙත කණගාටුවෙන් වුවද දන්වීමට සිදු වී ඇත. මෙම සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ සේවකයන්ට පමණක් එකී දීමනාව ලබා ගැනීමට වරප්‍රසාදයක් හිමි වී ඇතත්, එම සංස්ථා මගින් පාලනය වන වතුවල අපමණ දගසක් දුක් ගැහැට විඳ ගනිමින් සුළු වේතනයකින් සිය ජීවිත රැක ගන්නා මෙම නිලධාරීන්ට මෙම දීමනාව නොගෙවා සංස්ථාවේ වගකිවයුතු නිලධාරීන් නිහඬ වී සිටින්නේ කුමන හේතුවක් මතදැයි වටහා ගැනීමට නොහැක. තවද නොබෝදා රුපියලේ අගය අඩු කිරීමෙන් තවත් රුපියල් 15 ක අමතර දීමනාවක් ගෙවීමට ජාතික රජය කටයුතු කළ මුත් එකී දීමනාවද මෙම සංස්ථාවේ සුළු සේවකයන්ට ගෙවා නොමැති බවද කාරුණික ඔබතුමා වෙත දන්වමි. "

අන්තිම වගන්තිය කියවන්නේ නැහැ. එය දුක්ගැනවිල්ලක්.

මට මතු කරන්නට තිබෙන්නේ මේ ප්‍රශ්නයයි. මා ඊයේ මේ තේ වත්තට ගොස් මේ ගැන පිකක් සොයා බැලුවා. මට දැනගන්නට ලැබුණේ කම්කරු පිරිසට මේ දීමනා තුනෙන් එකක්වත් ලැබී නැති බවයි. ඒ ගැන සෝදිසි කර, එතැන ඇති ඒ දීමනාව දිය යුතු ප්‍රශ්නය විසඳීමටත්, එතැන ඇති වන්නට පුළුවන් වූත් ඇති වී තිබෙන්නා වූත් නොසන්සුන් භාවය පිළිබඳ ප්‍රශ්නය විසඳීමටත්, කටයුතු කරන්නය කියා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමටයි මා මේ කාලය ඉල්ලා සිටියේ.

අ. භා. 7.25

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

Mr. Deputy Speaker, unfortunately there is only five minutes left for me to reply to a number of matters raised by the hon. Members of the Opposition.

As regards the preliminary remark that the hon. Third Member for Colombo Central (Mr. Keuneman) made that private firms employ various people, he knows that we have no authority whatsoever over that matter.

With regard to the question raised about the tearing down of banners, according to the facts I have it appears that the hon. Member himself has not got the correct facts. It

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

is not correct to say that the police were responsible for the removal and destruction, if any, of banners and placards that had been placed outside the premises of Messrs. Shaw Wallace & Hedges, Ltd. It was in fact the security officer of that firm who is alleged to have collected all these articles and thrown them into the dust bin. On a complaint being made, the police had advised the security officer against a repetition of this act. So, the hon. Member has got his facts all wrong.

As far as the police are concerned, it is true they are enforcing the move on by-law. Peaceful picketing within a certain distance of the place of strike is certainly allowed.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

Please issue instructions to that effect.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

But those who want to go back to work must not be hindered in any way from going back to work.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

But you can peacefully persuade them.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

But those who want to go back to work must have every protection to get back to work. Surely a person who wants to go back to work should have the right to do so. It is the duty of the police to see that that right is also safeguarded. That right of the worker who wants to go and work as well as any other right a worker who is on strike may have has to be safeguarded by the police.

As regards transport of blacklegs by the police, this is the first time I am hearing about it. If the hon. Member had given me notice of the matter I would have looked into it.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

It is worth looking into.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

I shall certainly look into it.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

It is with the Permanent Secretary.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

The police have not got general instructions about loudspeakers. It is within the discretion of the police, considering the circumstances of each case, to issue a permit or not. I have not got any complaint to the effect that the discretion has been unfairly exercised.

Then the hon. Member for Gampaha (Mr. S. D. Bandaranayake) wants the Government to intervene. As a matter of fact, I must tell the hon. Member for Gampaha that this is the first occasion on which any government intervened, even before a strike, by using powers under the Public Security Act to enforce a wage increase on the employers.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

But they have not protested !

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

Hitherto the powers under the Public Security Act have been used to restrain strikers, but this is the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩඩ්ලි සේනානායක]

first time the Public Security Act was used even before a strike arose to compel the employers to increase wages of workers.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

I would far rather that the Public Security Act were withdrawn. We do not want a rude bludgeon used for the wrong purpose.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senayake)

The hon. Member for Agalawatta is entitled to his opinion, but that bludgeon is there, and it was used by other governments as well. That bludgeon is still in the Statute Book.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

I have protested every time.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senayake)

You protested every time, but it was possible, when your party was in the Coalition Government, to have removed that bludgeon.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

Oh, it was not ! You pulled it down corruptly before that.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senayake)

Corruptly ? I pulled it down corruptly ? If they were sincerely and honestly against that bludgeon, the first thing they should have done was to remove that from the Statue Book during the time of the Coalition Government. It is all very easy for you to talk about it now. The opportunity was amply afforded to the Coalition Government to do that.

In regard to the point that was raised by the hon. Member for Gampaha, this is a strike in the private sector. They have gone out on strike, and I saw a statement issued by the Hon. Minister of Labour that he was not informed at all, although it is not necessary to inform him. They just went out on strike. And what does the hon. Member for Gampaha expect the hon. Minister of Labour to do ?

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

The Industrial Disputes Act, Mr. Prime Minister, demands that the Labour Minister do inform himself of all possibilities of development in regard to strike. I am not backing the demand for any government intervention in the matter. I am not. We are quite content to continue the struggle. But that is the law.

එකල්හි වේලාව අ. භා. 7.30 වූයෙන් නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, 1968 ජනවාරි 10 වන බදාදා අ. භා. 2 වන තෙක් කල් ගියේය.

அப்போது பி.ப. 7.30 மணியாகிவிடவே உப சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே சபையை ஒத்திவைத்தார்கள்

அதன்படி, சபை, 1968, ஜனவரி 10, புதன்கிழமை பி.ப. 2 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.

*It being 7.30* P.M., MR. DEPUTY SPEAKER *adjourned the House without Question put.*

*Adjourned accordingly until* 2 P.M. *on Wednesday,* 10*th January* 1968.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනයෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩක්. පිටපතක් ශත 30යි. තැපැලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம் ; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org